80 වන කාණ්ඩය
2 වන කලාපය

සෙනසුරාද
1968 අගෝස්තු 10

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

නිල වාර්තාව

(අශෝධිත පිටපත)

අන්තර්ගත ප්‍රධාන කරුණු

අග්‍රාණ්ඩුකාරතුමාගෙන් ලත් සන්දේශය

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

විසර්ජන පනත් කෙටුම්පත (1968-69) : [පළමුවන වෙන් කළ දිනය]

දෙවනවර කියවීම—විවාදය ඉදිරියට ගෙන යන ලදී.

පළමුවන වර කියවන ලද පනත් කෙටුම්පත් :

Law Commission Bill [සෙනෙට්]
Criminal Procedure Code (Amendment) Bill [සෙනෙට්]
Crown (Liability in Delict) Bill [සෙනෙට්]
Defence Regulations (Resuscitation) Bill [සෙනෙට්]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 80
இல. 2

சனிக்கிழமை
10 ஒகஸ்ட் 1968

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

(பிழை திருத்தப்படாதது)

பிரதான உள்ளடக்கம்

மகாதேசாதிபதியிடமிருந்து வந்த செய்தி

வினுக்களுக்கு வாய்மூல விடைகள்

ஒதுக்கீட்டு மசோதா, 1968–69 [ஒதுக்கப்பட்ட முதல்நாள்]

இரண்டாம் மதிப்பு—விவாதம் தொடர்கிறது

முதன்முறை மதிப்பிடப்பட்ட மசோதாக்கள் :

Law Commission Bill [Senate]

Criminal Procedure Code (Amendment) Bill [Senate]

Crown (Liability in Delict) Bill [Senate]

Defence Regulations (Resuscitation) Bill [Senate]

Volume 80
No. 2

Saturday
10th August 1968

PARLIAMENTARY DEBATES

(HANSARD)

HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

(Uncorrected)

PRINCIPAL CONTENTS

MESSAGE FROM THE GOVERNOR-GENERAL

ORAL ANSWERS TO QUESTIONS

APPROPRIATION BILL, 1968-69 [First Allotted Day]
Second Reading—Debate (continued)

BILLS READ THE FIRST TIME :

Law Commission Bill [Senate]

Criminal Procedure Code (Amendment) Bill [Senate]

Crown (Liability in Delict) Bill [Senate]

Defence Regulations (Resuscitation) Bill [Senate]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

பிரதிநிதிகள் சபை

House of Representatives

1968 අගෝස්තු 10 වන සෙනසුරාදා

சனிக்கிழமை 10, ஓகஸ்ட் 1968

Saturday, 10th August 1968

පූ. භා. 10 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ගරු එස්. සී. ෂර්ලි කොරයා] මූලාසනාරූඪ විය.

சபை, மு. ப. 10 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ எஸ். சி. ஷேளி கொறயா] தலைமை தாங்கினார்கள்.

The House met at 10 A.M., MR. SPEAKER [THE HON. S. C. SHIRLEY COREA] *in the Chair.*

අග්‍රාණ්ඩුකාරතුමාගෙන් ලත් සන්දේශය

மகா தேசாதிபதியிடமிருந்து வந்த செய்தி

MESSAGE FROM THE GOVERNOR-GENERAL

කථානායකතුමා

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

I have received the following Message from His Excellency the Governor-General :

" අග්‍රාණ්ඩුකාර කාර්යාලය,

රජ වාසල, කොළඹ, ශ්‍රී ලංකාව.

1968 අගෝස්තු 5.

මගත් මයාණනි,

1946 යේ ලංකා (ආණ්ඩුක්‍රම) රාජාඥාවේ 36(2) වැනි වගන්තිය ප්‍රකාර, පහත සඳහන් ආකාරයට නම් කරන ලද ව්‍යවස්ථා කෙටුම්පතට මහා රාජිණීන් වහන්සේගේ ශ්‍රී නාමයෙන් මට අද දින අනුඥාව දුන් බව ගෞරව පූර්වකව ඔබට දන්වමි.

'An Act to amend the Bank of Ceylon Ordinance'.

මේ වගට,

ඔබගේ කීකරු සේවක,
ඩබ්ලිව්. ගොපල්ලව,
අග්‍රාණ්ඩුකාර.

නියෝජිත මන්ත්‍රණ සභාවේ

ගරු කථානායකතුමා."

සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයෙන් ලත් සන්දේශය

மூதவையிலிருந்து வந்த செய்தி

MESSAGE FROM THE SENATE

කථානායකතුමා

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

A Message has been received from the Senate. The Clerk of the House will read it.

පහත දැක්වෙන සන්දේශය මන්ත්‍රී මණ්ඩලයේ ලේකම් විසින් කියවන ලදි.

சபைச் செயலதிகாரி பின்வரும் செய்தியை வாசித்தார்.

The Clerk of the House read the following Message :

" මතු පලවන කෙටුම්පත් පනතට සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය සංශෝධන නොමැතිව එකඟවී ඇත :

Bank of Ceylon (Amendment) ".

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

PAPERS PRESENTED

Supplementary Estimate No. 18 of 1967-68.—[*The Hon. Hurulle on behalf of the Minister of Education and Cultural Affairs*].

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදි.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

Ordered to lie upon the Table.

1. Annual Reports of the Ceylon Oils and Fats Corporation for 1963-64 and 1964-65.
2. Annual Report and Statement of Accounts of the Ceylon State Flour Milling Corporation for 1964-65.
3. Annual Report and Statements of Accounts of the Ceylon Ceramics Corporation for 1963-64.
4. Notification made under Section 3 (3) of the Manufacture of Matches (Regulation) Act No. 6 of 1963.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

5. Set of Regulations made under Section 9 of the Manufacture of Matches (Regulation) Act No. 6 of 1963.—[*The Hon. D. P. R. Gunawardena*].

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

Ordered to lie upon the Table.

1. Food Control Order No. 271 made under Section 4 (1) (i) of the Food Control Act (Cap. 171).

2. Supplementary Estimate No. 17 of 1967-68.—[*The Hon. M. D. Banda*].

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

Ordered to lie upon the Table.

(1) පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනතෙහි (432 අධිකාරය) 9 වන වගන්තිය යටතේ පනවන ලද නියෝග මාලාවක්.

(2) 1968 මාර්තු 31 වනදායින් අවසන් වන අවුරුද්දේ ලංකා සංවර්ධන මුදල් සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්.—[ගරු වන්නිනායක.]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

Ordered to lie upon the Table.

1965-66 සඳහා වරාය නැව්බඩු සංයුක්ත මණ්ඩලයේ වාර්ෂික වාර්තාව.—[ජනසතු සේවා ඇමති වෙනුවට ගරු වන්නිනායක.]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

Ordered to lie upon the Table.

1. Set of by-laws made under Sections 267 and 272 of the Municipal Councils Ordinance (Cap. 252).

2. Set of by-laws made under Sections 153 and 157 of the Urban Councils Ordinance (Cap. 255).

3. Rule made under Section 3 of the Public Performances Ordinance (Cap. 176).—[*The Hon. Hurulle on behalf of the Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information and Broadcasting*].

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

Ordered to lie upon the Table.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

வினாக்களுக்கு வாய்மூல விடைகள்

ORAL ANSWERS TO QUESTIONS

කිලිනොච්චි කොට්ඨාශය : ගුරු මාරු හා පුරප්පාඩු

கிளிநொச்சித் தொகுதி : ஆசிரியர் இடமாற்றங்களும் வெற்றிடங்களும்

KILINOCHCHI ELECTORATE : TEACHER TRANSFERS AND VACANCIES

4. කා. පො. ඉරත්නිනම් මයා. (කිලිනොච්චි)
(திரு. கா. பொ. இரத்தினம்—கிளிநொச்சி)
(Mr. K. P. Ratnam—Kilinochchi)

අධ්‍යාපන, සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1.12.67 සිට 1.3.68 දක්වා කිලිනොච්චි කොට්ඨාශයෙන් යාපනේ අර්ධද්වීපයටත්, වෙනත් ප්‍රදේශවලටත් මාරු කරන ලද මුල් ගුරුවරුන්ගේ සහ උප ගුරුවරුන්ගේ නම් ද, ඔවුන් සේවය කල පාසැල් ද, මාරු කරන ලද පාසල් ද මාරුකිරීමට හේතු ද එතුමා සඳහන් කරනවාද? (ආ) මේ කාලය තුළ කිලිනොච්චි කොට්ඨාශයට මාරු කරන ලද මුල් ගුරුවරුන්ගේ සහ උප ගුරුවරුන්ගේ නම් ද, ඔවුන් පත්කරනු ලැබූ පාසල් ද, ඔවුන් පත්කළ දිනයන් ද එතුමා සඳහන් කරනවාද? (ඉ) 1.12.67 දී කිලිනොච්චි කොට්ඨාශයේ තිබෙන පාසල් අතර, කුමන පාසල්වල ඇබෑර්තු කොපමණ තිබුණේ ද? (ඊ) 1.2.68 දී කුමන පාසල්වල ඇබෑර්තු කොපමණ තිබුණේ ද?

கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) 1.12.67 தொடக்கம் 1.3.68 வரை கிளிநொச்சித் தொகுதியிலிருந்து யாழ்ப்பாணக் குடாநாட்டுக்கும், பிற இடங்களுக்கும் மாற்றப்பட்ட தலைமை ஆசிரியர்கள் உதவி ஆசிரியர்களின் பெயர்களையும், அவர்கள் கடமையாற்றிய பாடசாலைகளையும் மாற்றப்பட்ட பாடசாலைகளையும், மாற்றக்காரணத்தையும் அவர் கூறுவாரா? (ஆ) இக்காலப் பகுதியில் கிளிநொச்சித் தொகுதிக்கு மாற்றப்பட்ட தலைமை ஆசிரியர்களையும், உதவி ஆசிரியர்களையும் அவர்கள் நியமிக்கப்பட்ட பாடசாலைகளையும் அவர்களுடைய நியமனத் தேதிகளையும் அவர் கூறுவாரா? (இ) கிளிநொச்சித் தொகுதிப் பாடசாலைகளில் 1.12.67 இல் எவ்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

வெப் பாடசாலைகளில் எத்தனை வெற்றிடங்கள் இருந்தன? (ஈ) 1.2.68 இல் எவ்வெப்பாட சாலைகளில் எத்தனை வெற்றிடங்களிருந்தன?

asked the Minister of Education and Cultural Affairs: Will he state: (*a*) The names of the Head Teachers and Assistant Teachers who were transferred from the Killinochchi Electorate to the Jaffna Peninsula and other places between the period 1.12.67 to 1.3.68; and also the names of the schools to which they were transferred? (*b*) The named of the Head Teachers and Assistant Teachers who were transferred during this period into schools in the Killinochchi Electorate, and the names of the schools to which they were transferred together with date on which the transfer took effect? (*c*) How many vacancies there were on 1.12.67 and the name of the school where such vacancies existed in the Kilinochchi Electorate? (*d*) How many vacancies there were on 1.2.68 and in 2which schools?

ගරු ඊ. එල්. බී. හුරුල්ලේ (ප්‍රවාහන ඇමති—අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති වෙනුවට)

(கௌரவ ஈ. எல். பி. ஹுருல்ல—போக்குவரத்து அமைச்சர்—கல்வி, கலாசார விவகார அமைச்சர்—சார்பாக)

(The Hon. E. L. B. Hurulle—Minister of Communications—on behalf of Minister Education and Cultural Affairs)

Since the Answer to this Question is a long one I shall table it.

සභා මේසය මත තබන ලද පිළිතුර මෙසේ යි:

சபாபீடத்தில் வைக்கப்பட்ட விடை வருமாறு:

The Answer tabled is as follows:

(අ) 67.12.1 සිට 68.3.1 දක්වා කාලය තුළ කිලිනොච්චි ඡන්ද කොට්ඨාශයෙන් යාපනය අර්ධද්වීපයට සහ අනිකුත් ස්ථානවලට මාරු කරන ලද මුල් ගුරු සහ උප ගුරුවරුන්ගේ නම් සහ ඔවුන් සේවය කළ සහ මාරුකරන ලද පාසැල් නම්

ගුරුවරයාගේ නම	සේවය කළ පාසැල	ස්ථාන මාරු කළ පාසැලේ නම
1. කේ. වීරකත්තිපිල්ලෙ මයා.	යා/වෙල්ලියාතිවු ර/දෙ.මි.පා. ...	ව/පාවට්කුලම් පියවර 3 අංක 9 ර.දෙ.මි.පා.
2. ඒ. පරමනාදර් මයා. ...	චෙම්බන්කුණ්ඩු ර/දෙ.මි.පා. ...	යා/මරවන්පුලම් හින්දු දෙ.මි.පා.
3. කේ. එන්. නිකුලස් මයා	යා/මුහමාලෙයි රෝක. දෙ. මි. පා. ...	යා/වාවකච්චේරි රෝ.ක.දෙ.මි.පා.
4. එස්. ආරුමුගම් මයා.	යා/ඩට්ටරුත්තකුලම් ර.දෙ.මි.පා. ...	යා/තාවඩි හින්දු දෙ.මි.පා.
5. එස්. සේනාදිරාජා මයා.	යා/පලෙයි ස්ථානය සි.සි.දෙ.මි.පා. ...	කෙ/හේවකෙත්ත ම.ම.වි.
6. එච්. ඒ. ප්‍රනාන්දු මයා.	යා/පලෙයි රෝ.ක.දෙ.මි.පා. ...	ව/කොත්තන්ඩනොච්චිකුලම් ර.දෙ.මි.පා.
7. වී. තම්බයියා මයා. ...	යා/පුත්තුවෙට්ටුවාන් ර.දෙ.මි.පා. ...	බණ්ඩාරවෙල පසුර දෙ.මි.පා.
8. ඒ. මහදේව මයා. ...	යා/රාමනාදපුරම් උතුරු.දෙ.මි.පා. ...	රත්නපුර ර.දෙ.මි.පා.
9. එස්. අරියරත්නම් මයා.	යා/ස්කන්දපුරම් ර.දෙ.මි.පා. ...	කො/කොල්ලුපිටිය එම්.එම්.ටී.එම්.එස්.
10. වී. තෙයිවේන්දිරම් මයා.	යා/තට්ටුවාන්කොට්ටි ර.දෙ.මි.පා. ...	ව/මන්නකුලම් ර.දෙ.මි.පා.
11. එස්. සෙල්ලයියා මයා.	යා/තර්මකේනි ර.දෙ.මි.පා. ...	ව/මුල්ලියාවෙලයි හින්දු බෝඩ් දෙ.මි.පා.
12. වී. ඉලයතම්බි මයා. ...	යා/තුනුක්කායි ර.දෙ.මි.පා. ...	යා/මණියකාරම්තෝට්ටම් දෙ.මි.පා.
13. වී. එස්. ජේම්ස් මයා....	යා/වලෙයිපාඩු ර.දෙ.මි.පා. ...	යා/තට්ටාතෙරු හින්දු දෙ.මි.පා.
14. ආර්. රාජලිංගම් මයා.	යා/යක්කච්චි ර.දෙ.මි.පා. ...	යා/උඩුවිල් මැස්න් ඉංග්‍රීසි පාසැල.
15. ටී. මුරුගුපිල්ලෙ මයා.	යා/රාමනාදපුරම් නැගෙනහිර ර.දෙ. මි.පා.	යා/වැල්වෙට්ටිතුරෙ දෙ.මි.පා.
16. ආර්. කන්දයියා මිය.	යා/මුරසුමෝඩ්ඩෙ මුරුකානන්ද විද්‍යා.	යා/ඩෙල්ෆ්ට් බස්නාහිර පාරුවදි විද්‍යා.
17. එම්. සේනාදිරාජා මිය.	යා/පලෙයි සි.සි.දෙ.මි.පා. ...	මහ/රාජවෙල රා.දෙ.මි.පා.
18. පී.කන්දසාමි මිය. ...	යා/තර්මපුරම් අංක 2 ර.දෙ.මි.පා. ...	යා/වන්කානෙයි නැගෙනහිර සියිව ප්‍රකාශ වි.
19. ඒ. ස්කන්දරාජා මිය.	යා/පලෙයි ම.වි. ...	යා/පූලෝලි පිරිමි ඉංග්‍රීසි පාසැල
20. ඒ. ආසිපිල්ලෙයි මයා.	යා/පලෙයි ම.වි. ...	ත්‍රි/තිරයායි ර.දෙ.මි.පා.
21. එම්. සිවගුරු මිය.	යා/පූනගරි ම.වි. ...	යා/මානිප්පායි සෝතිවේම්බඩි දෙ.මි.පා.
22. බී. තෙයිවේන්දුම් මයා.	යා/උරිත්තිරපුරම් ම.වි. ...	යා/කෝප්පායි ක්‍රිස්තියානි විද්‍යා.
23. එස්. ජෝර්ජ් මිය. ...	යා/උරුත්තිරපුරම් ම.වි. ...	මන්/පේසාලයි රෝ.ක.දෙ.මි.පා.
24. ටී. කුලසිංහම් මයා.	යා/පලෙයි රෝ.ක.දෙ.මි.පා. ...	මා/කැප්පෙට්ටිය මුස්ලිම් පාසැල

සටහන : අංක 8,17,19 හා 24 හි මාරුවීම් 1968.12.31 දින දක්වා කල් දමා ඇත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(ආ) කිලිනොච්චි ඡන්දකොට්ඨාශ පාසල්වල ස්ථාන මාරුකළ ගුරුවරුන්ගේ නම්, එම පාසල්වලට නම් සහ ස්ථාන මාරුකළ දින

ගුරුවරයාගේ නම	තත්ත්වය	ස්ථාන මාරුකළ පාසලේ නම	මාරුකළ දින
1. වී. පොන්නයියා මයා. ...	උපගුරු ...	යා/එලිපන්පාස් ර.දෙ.මි.පා.	1. 1.68
2. ඒ. සබාරත්නසිංහම් මයා. ...	මුල්ගුරු ...	යා/පලෙයි සි.සි.දෙ.මි.පා. ...	1. 1. 68
3. ආර්. අප්පාදුරෙ මයා. ...	උපගුරු ...	යා/කිලිනොච්චි ම.වි. ...	1. 1. 68
4. ඒ. එම්. බසීර් මයා. ...	එම ...	යා/පූනගරි ම.වි. ...	1. 1.68
5. වී. සෙල්ලතුරෙ මයා. ...	ජ්‍යෙෂ්ඨ උපගුරු	ය/රාමනාදපුරම් නැගෙනහිර ර.දෙ.මි.පා. ...	1. 1.68
6. එස්. එම්. අන්තෝනිපිල්ලෙ	මුල්ගුරු ...	යා/කිලාලි රෝ. ක.දෙ.මි.පා. ...	1. 1.68
7. එස්. වේලුපිල්ලෙ මයා. ...	මුල්ගුරු ...	යා/සෝරන්පත්තු ගනේෂා ...	1. 1.68
8. පී. ආර්. අරුල්නායගම් මයා.	උපගුරු ...	යා/ශු. තෙරේසා පාසල ...	1. 1.68
9. වී. මනෝන්මනි මෙ. ...	උපගුරු ...	යා/කිලිනොච්චි හින්දු දෙ.මි.පා. ...	1. 2.68
10. එන්. අරුනාසලම් මෙ. ...	එම ...	යා/වෙම්බෝඩුකේර්නි සි.සි.දෙ.මි.පා. ...	1. 2.68
11. ජේ. ටී. සෙල්වතුරෙ මෙ. ...	එම ...	යා/පරන්තන් හින්දු දෙ.මි.පා. ...	3. 2.68
12. වී. වෙල්ලප්පා මයා. ...	මුල්ගුරු ...	යා/තුනුක්කායි ර.දෙ.මි.පා. ...	14. 2.68
13. කේ. නාගලිංගම් මයා. ...	එම ...	යා/පරන්දන් හින්දු දෙ.මි.පා. ...	1. 3.68
14. ඒ. සෙල්වරාජා මයා. ...	උපගුරු ...	යා/වවුනික්කුලම් පියවර4 ර. දෙ.මි.පා. ...	1. 3.68
15. ඒ. කුරෙඅප්පා මයා. ...	එම ...	යා/තර්ම පුරම් අංක 2 ර.දෙ.මි.පා. ...	1. 3.68

(ඉ) 67.12.1දින කිලිනොච්චි ඡන්දකොට්ඨාශ පාසල්වල ඇබෑර්තු

පාසල නම	දැනට තිබෙන ඇබෑර්තු ගණන
1. යා/ආලන්කුලම් ර.දෙ.මි.පා.	1
2. යා/එලිපන්පාස් ර.දෙ. සහ සි.මි.පා.	1
3. යා/ඥණිමඩම් ර.දෙ. සහ සි.මි.පා.	1
4. යා/කිලාලි රෝ.ක.දෙ.මි.පා.	1
5. යා/කිලිනොච්චි හින්දු දෙ.මි.පා.	2
6. යා/කෝවිල්වයල් සි.සි.දෙ.මි.පා.	1
7. යා/කුන්චුකුලම් ගනේෂා විද්‍යාලය	1
8. යා/මට්වුවිල්නාඩු ර.දෙ.මි.පා.	1
9. යා/මුරසුමෝට්ටයි මුරුකානන්ද...	1
10. යා/මුරසුමෝට්ටයි ශු. සන්තන්තෝනි දෙ.මි.පා. ...	1
11. යා/පරන්තන් ර.දෙ.මි.පා.	1
12. යා/පරන්තන් හින්දු දෙ.මි.පා.	1
13. යා/රාමනාතපුරම් උතුරු ර.දෙ.මි.පා.	2
14. යා/උයිලන්කුලම් ර.දෙ.මි.පා.	1
15. යා/වවුනික්කුලම් පියවර 4 ර.දෙ.මි.පා.	2
16. යා/වලෙයිපාඩුර දෙ.මි.පා.	1
17. යා/වන්නේරිකුලම් ර.දෙ.මි.පා.	2
	21

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(ඊ) 68.2.1 දින කිලිනොච්චි ඡන්ද කොට්ඨාශ පාසැල්වල ඇබෑර්තු

පාසැලේ නම	දැනට තිබෙන ඇබෑර්තු ගණන
1. යා/ආලන්කුලම් ර.දෙ.මි.පා. … … …	1
2. යා/පූනගරි අත්තෙයි ර.දෙ.මි.පා. … …	1
3. යා/වෙල්ලියාතීවු ර.දෙ.මි.පා. … … …	1
4. යා/වෙන්බන්කුන්ඩු ර.දෙ.මි.පා. … …	1
5. යා/වෙට්ටියකුරිච්චි ර.දෙ.මි.පා. … …	1
6. යා/එලිපන්ට්පාස් ර.දෙ.මි.පා. … … …	1
7. යා/ඥනිමඩම් ර.දෙ.මි.පා. … … …	1
8. යා/කෝවිල්වයල් ර.දෙ.මි.පා. … … …	1
9. යා/කුන්චිකුලම් ගනේසා දෙ.මි.පා. … …	1
10. යා/මට්ටුවිල්නාඩු ර.දෙ.මි.පා. … … …	1
11. යා/මුරසුමෝඩ්ටෙයි ශු. සන්තන්තෝනි රො.ක.පා. …	1
12. යා/උට්ටරුත්තාන්කුලම් ර.දෙ.මි.පා. … …	1
13. යා/පරන්තන් ර.දෙ.මි.පා. … … …	1
14. යා/පූනගරි නල්ලූර් ර.දෙ.මි.පා. … …	1
15. යා/පුත්තුවෙට්ටුවාන් හින්දු දෙ.මි.පා. … …	1
16. යා/රාමනාදපුරම් නැගෙනහිර ර.දෙ.මි.පා. … …	1
17. යා/ස්කන්ද පුරම් ර.දෙ.මි.පා. … … …	1
18. යා/සිවනගර් ර.දෙ.මි.පා. … … …	1
19. යා/තට්ටුවාන්කොට්ටි ර.දෙ.මි.පා. … …	1
20. යා/තම්බිරායි ර.දෙ.මි.පා. … … …	1
21. යා/තර්මකර්නි ර.දෙ.මි.පා. … … …	1
22. යා/තර්මපුරම් අංක 1 ර.දෙ.මි.පා. … …	1
23. යා/උයිලන්කුලම් ර.දෙ.මි.පා. … … …	1
24. යා/වවුනිකුලම් පියවර 4 ර.දෙ.මි.පා. … …	1
25. යා/වලෙයිපාඩු රෝ.ක.දෙ.මි.පා. … …	1
26. යා/වේරවිල්හින්දු … … …	1
27. යා/රාමනාදපුරම් උතුරු මධ්‍යමහා විද්‍යාලයට අළුතින් උසස් කරන ලද … … … …	3 3
28. යා/මුරසුමෝට්ටෙයි මුරුහානන්ද මධ්‍ය මහා විද්‍යාලයට අළුතින් උසස් කරන ලද … … …	4
29. යා/කිලිනොච්චි හින්දු මධ්‍ය මහා විද්‍යාලයට අළුතින් උසස් කරන ලද	1
30. යා/වවුනිකුලම් පියවර 3 මධ්‍ය මහා විද්‍යාලයට අළුතින් උසස් කරන ලද … … … …	3
31. යා/වන්නේරිකුලම් මධ්‍ය මහා විද්‍යාලයට අළුතින් උසස් කරන ලද …	3
	40

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(அ) கிளிநொச்சித் தொகுதியிலிருந்து யாழ்ப்பாணக் குடாநாட்டுக்கும் ஏனைய இடங்களுக்கும் 1.12.67 க்கும் 1.3.68 க்கும் இடைப்பட்ட காலத்தில் மாற்றப்பட்ட தலைமை ஆசிரியர்கள், உதவி ஆசிரியர்கள் அட்டவணையும் அவர்கள் சேவை புரிந்த பாடசாலைகளும் மாற்றப்பட்ட பாடசாலைகளும்.

	ஆசிரியர் பெயர்	சேவை புரிந்த பாடசாலைப் பெயர்	மாற்றப்பட்ட பாடசாலைப் பெயர்
1.	திரு. கே. வீரகத்திப்பிள்ளை	யா/செல்லியாதீவு அ. த. க. பா.	வ/பாவற்குளம் ஸ்ரேஜ் 3, இல. 9, அ. த. க. பா.
2.	திரு. ஏ. பரமானந்தர்	யா/செம்பன்குண்டு, அ. த. க. பா.	யா/சாவக்கச்சேரி, றோ. க. த. க. பாடசாலைக்கு மாற்றம் கொடுபட்டு பின் மரவன்பொல பாடசாலைக்கு
3.	திரு. கே. என். நிக்கொலாஸ்	யா/முகமாலை, றோ. க. த. க. பா.	யா/சாவகச்சேரி, றோ. க. த. க. பா.
4.	திரு. எஸ். ஆறுமுகம்	யா/ஒட்டறுத்தகுளம், அ. த. க. பா.	யா/தாவடி, இந்து த. க. பா.
5.	திரு. எஸ். சேனாதிராஜா	யா/பளை ஸ்ரேஷன், சி. கி. த. க. பா.	க/கேவகெற்ற, ம. ம. வி.
6.	திரு. எச். ஏ. பர்னாந்து	யா/பளை, றோ. க. த. க. பா.	வ/கோதண்டநொச்சிக்குளம், அ. த. க. பா.
7.	திரு. வி. தம்பையா	யா/புத்துவெட்டுவான், அ. த. க. பா.	ப/பசறை, த. க. பா.
8.	திரு. ஏ. மகாதேவன்	யா/இராமநாதபுரம், வடக்கு, அ. த. க. பா.	இ/இரத்தினபுரி, அ. த. க. பா.
9.	திரு. எஸ். அரியரத்தினம்	யா/ஸ்கந்தபுரம், அ. த. க. பா.	கொ கொள்ளுப்பிட்டிய, மெ. மி. த. க. பா.
10.	திரு. வி. தெய்வேந்திரம்பிள்ளை	யா/தட்டுவன்கொட்டி, அ. த. க. பா.	வ/மாங்குளம், அ. த. க. பா.
11.	திரு. எஸ். செல்லையா	யா/தர்மக்கேணி, அ. த. க. பா.	வ/முள்ளியவளை, இ. த. க. பா.
12.	திரு. வி. இளையதம்பி	யா/துணுக்காய், அ. த. க. பா.	யா/மரியகாண்தோட்டம், த. க. பா.
13.	திரு. வி. எஸ். ஜேம்ஸ்	யா/வலைப்பட்டு, அ. த. க. பா.	யா/தட்டாதெரு, இ. த. க. பா.
14.	திரு. ஆர். இராஜலிங்கம்	யா/இயக்கச்சி, அ. த. க. பா.	யா/உடுவில், மான்ஸ் ஆங்கில பாடசாலை
15.	திரு. இ. முருகுப்பிள்ளை	யா/இராமநாதபுரம் கிழக்கு, அ. த. க. பா.	யா/வல்வெட்டித்துறை, அ. மி. த. க. பா.
16.	திருமதி ஆர். கந்தையா	யா/முரசுமோட்டை முருகானந்த, வி.	யா/நெடுந்தீவு மேற்கு பார்வதி வி.
17.	திருமதி எம். சேனாதிராஜா	யா/பளை, சி. கி. த. க. பா.	க/இராஜவல, அ. த. க. பா.
18.	திருமதி பி. கந்தசாமி	யா/தர்மபுரம் இல. 2, அ. த. க. பா.	யா/சங்கானை கிழக்கு சைவப்பிரகா, வி.
19.	திரு. ஏ. சிறிஸ்கந்தராஜா	யா/பளை, ம. வி.	யா/புலோலி ஆண்கள் ஆ. பா.
20.	திரு. ஏ. ஆசைப்பிள்ளை	யா/பளை, மா. வி.	தி/திரியை, அ. த. க. பா.
21.	திருமதி எம். சிவகுரு	யா/பூனகரி, ம. வி.	யா/மானிப்பாய் சோதிவேம்படி, த. க. பா.
22.	திரு. வி. தெய்வேந்திரம்	யா/உருத்திரபுரம், ம. வி.	யா/கோப்பாய் கிறிஸ்தியன் கல்லூரி
23.	திருமதி எஸ். ஜோர்ஜ்	யா/உருத்திபுரம், ம. வி.	மன்/பேசாலை, றோ. க. த. க. பா.
24.	திரு. ரி. குலசிங்கம்	யா/பளை, றோ. க.	மாத்தளை/கெப்பிற்றிய, மு. வி.

குறிப்பு : இல. 8, 17, 19, 24—இம்மாற்றங்கள் 31.12.68 வரை பின்போடப்பட்டுள்ளன.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(ஆ) கிளிநொச்சித் தொகுதிக்கு மாற்றப்பட்ட ஆசிரியர்களின் பெயரும் மாற்றப்பட்ட பாடசாலைப் பெயரும், மாற்றம் செயற்படும் திகதியும்

	ஆசிரியர் பெயர்	பதவி	பாடசாலைப் பெயர்	செயற்படும் திகதி
1.	திரு. வி. பொன்னையா	உதவி	யா/ஆனையிறவு, அ.த.க.பா.	1.1.68
2.	திரு. எ. சபாரட்ணசிங்கம்	த.ஆ.	யா/பளை, சி. சி. த. க. பா.	1.1.68
3.	திரு. ஆர். அப்பாத்துரை	உதவி	யா/கிளிநொச்சி, ம. வி.	1.1.68
4.	திரு. எ. எம். பஷீர்	உதவி	யா/பூநகரி, ம. வி.	1.1.68
5.	திரு. வி. செல்லத்துரை	சி. உ.	யா/இராமநாதபுரம் கிழக்கு, அ. த. க. பா	1.1.68
6.	திரு. எஸ். எம். அந்தோனிப்பிள்ளை	த.ஆ.	யா/இளாலி றோ. க. பா.	1.1.68
7.	திரு. எஸ். வேலுப்பிள்ளை	த.ஆ.	யா/சோரன்பற்று கணேச வித்.	1.1.68
8.	திரு. பி. ஆர். அருள்நாயகம்	உதவி	யா/சென். திறேசா, த. க. பா.	1.1.68
9.	திருமதி வி. மனோன்மணி	உதவி	யா/கிளிநொச்சி, இ. த. க. பா.	1.2.68
10.	திருமதி எம். அருணாசலம்	உதவி	யா/வேம்பொடுகேணி, சி. சி. த. க. பா.	1.2.68
11.	திருமதி ஜே. ரி. செல்லத்துரை	உதவி	யா/பரந்தன், இ. த. க. பா.	3.2.68
12.	திரி. கே. நாகலிங்கம்	த.ஆ.	யா/பரந்தன் இ. த. க. பா.	1.3.68
13.	திரு. ரீ. செல்வராசா	உதவி	யா/வவணிக்குளம் யூனிற் 4, அ. த. க பா.	1.3.68
14.	திரு. எ. துரையப்பா	உதவி	யா/தர்மபுரம் இல. 2, அ.த.க.பா.	1.3.68
15.	திரு. வி. செல்லப்பா	த.ஆ.	யா/நுணுக்காய், அ. த. க. பா.	14.2.68

(இ) 1.12.67 இல் ஆசிரியர்கள் பற்றுக்குறைவாகவுள்ள கிளிநொச்சித் தொகுதிப் பாடசாலைகள்

	பாடசாலைப் பெயர்	பற்றுக் குறை
1.	யா/ஆலங்குளம், அ. த. க. பா.	1
2.	யா/ஆனையிறவு, அ. த. க. பா.	1
3.	யா/ஞானிமடம், அ. த. க. பா.	1
4.	யா/இளாலி, றோ. க. பா.	1
5.	யா/கிளிநொச்சி. இ. த. க. பா.	2
6.	யா/கோவில்வயல், சி. சி. த. க. பா.	1
7.	யா/குஞ்சுக்குளம், கணேச வித்.	1
8.	யா/மட்டுவில் நாடு, அ. த. க. பா.	1
9.	யா/முரசுமோட்டை முருகானந்த	1
10.	யா/முருசுமோட்டை புனித அந்தோனியார்	1
11.	யா/பரந்தன், அ. த. க. பா.	1
12.	யா/பரந்தன், இ. த. க. பா.	1
13.	யா/இராமநாதபுரம் வடக்கு, அ. த. க. பா.	2
14.	யா/உமிலங்குளம், அ. த. க. பா.	1
15.	யா/வவணிக்குளம் யூனிற் 4, அ. த. க. பா.	2
16.	யா/வலைப்பாடு, அ. த. க. பா.	1
17.	யா/வண்ணேரிக்குளம், அ. த. க. பா.	2

(ஈ) 1.2.68 இல் ஆசிரியர்கள் பற்றுக்குறைவாகவுள்ள கிளிநொச்சித் தொகுதிப் பாடசாலைகள்

	பாடசாலைப் பெயர்	பற்றுக் குறை
1.	யா/ஆலங்குளம், அ. த. க. பா.	1
2.	யா/பூநகரி அத்தாய், அ. த. க. பா.	1
3.	யா/செல்லியாதீவு, அ. த. க. பா.	1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

	பாடசாலைப் பெயர்	பற்றுக்குறை
4.	யா/செம்பண்குண்டு, அ. த. க. பா.	1
5.	யா/செட்டியகுறிச்சி, அ. த. க. பா.	1
6.	யா/ஆனையிறவு, அ. த. க. பா.	1
7.	யா/ஞானிமடம், அ. த. க. பா.	1
8.	யா/கோயில்வயல், அ. த. க. பா.	1
9.	யா/குஞ்சிக்குளம் கணேச வித்.	1
10.	யா/மட்டுவில்நாடு, அ. த. க. பா.	1
11.	யா/முரசுமோட்டை புனித அந்நோனியார் றோ. க. த. க.	1
12.	யா/ஒட்டறுத்தகுளம், அ. த. க. பா.	1
13.	யா/பரந்தன், அ. த. க. பா.	1
14.	யா/பூநகரி நல்லூர், அ. த. க. பா.	1
15.	யா/புத்துவெட்டுவான், இ. த. க. பா.	1
16.	யா/இராமநாதபுரம் கிழக்கு, அ. த. க. பா.	1
17.	யா/ஸ்கந்தபுரம், அ. த. க. பா.	1
18.	யா/சிவநகர், அ. த. க. பா.	1
19.	யா/தட்டுவன்கொட்டி, அ. த. க. பா.	1
20.	யா/தம்பிராய், அ. த. க. பா.	1
21.	யா/தர்மக்கேணி, அ. த. க. பா.	1
22.	யா/தர்மபரம் இல. 1, அ. த. க. பா.	1
23.	யா/உயிலங்குளம், அ. த. க. பா.	1
24.	யா/வவனிக்குளம் யூனிற் 4, அ. த. க. பா.	1
25.	யா/வலைப்பாடு, றோ. க. த. க. பா.	1
26.	யா/வேரவில், இ. த. க. பா.	1
27.	யா/இராமநாதபுரம் வடக்கு, அ. த. க. பா.	3
28.	யா/முரசுமோட்டை முருகானந்த	4
29.	யா/இளிநொச்சி, இ. த. க. பா.	1
30.	யா/வவனிக்குளம் யூனிற் 3, அ. த. க. பா.	3
31.	யா/வன்னேரிக்குளம், அ. த. க. பா.	3

(a) LIST OF HEAD TEACHERS AND ASSISTANT TEACHERS TRANSFERRED FROM KILINOCHCHI ELECTORATE TO JAFFNA PENINSULA AND OTHER PLACES BETWEEN 1.12.67 AND 1.3.68 AND THE SCHOOLS IN WHICH THEY SERVED AND THE SCHOOLS TO WHICH THEY HAVE BEEN TRANSFERRED

Name of Teacher	*Name of school served*	*Name of school to which transferred*
1. Mr. K. Veeragathipliiai	J/Chelliativu GTMS	V/Pavatkulam Stage 3 No. 9 GTMS
2. Mr. A. Paramanathar	J/Chempankundu GTMS	J/Chavakachcheri R.C.T.M.S. and varied to Maravanpulo Hindu T.M.S.
3. Mr. K. N. Nicholas	J/Muhamalai RCTMS	J/Chavakachcheri RCTMS
4. Mr. S. Arumugem	J/Oddaruthakulam GTMS	J/Thavaddy Hindu T.M.S.
5. Mr. S. Senathirajah	J/Palai Station C.C.T.M.S.	K/Hewaketta M.M.V.
6. Mr. A. Fernando	J/Palai R.C.T.M.S.	V/Kothandanochchikulam GTMS
7. Mr. V. Thambiyah	J/Puthuvedduvan GTMS	B/Passara T.M.S.
*8. Mr. A. Mahadevan	J/Ramanathapuram North GTMS	R/Ratnapura G.T.M.S.
9. Mr. S. Ariaratnam	J/Skandapuram GTMS	C/Kollupitiya MMTMS
10. Mr. V. Theivendrampillai	J/Thadduvankoddy GTMS	V/Mannakulam GTMS

* Transfer deferred till 31. 12. 68.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Name of Teacher	Name of school served	Name of school to which transferred
11. Mr. S. Chelliah	J/Tharmakerny G.T.M.S.	V/Mulliyawalai H.B.T.M.S.
12. Mr. V. Eliyathamby	J/Thunnukkai G.T.M.S.	J/Mariyakarnthoddam T.M.S.
13. Mr. V. S. James	J/Valaipadu. G.T.M.S.	J/Thattatheru Hindu T.M.S.
14. Mr. R. Rajalingam	J/Iyakachchi G.T.M.S.	J/Uduvil Mann's English School
15. Mr. E. Murugupillai	J/Ramanathapuram East G.T.M.S.	J/Valvettithurai A.M.T.M.S.
16. Mrs. R. Kandiah	J/Murasumoddai Murugananda Vid.	J/Delft West Bharathy Vid.
*17. Mrs. M. Senathirajah	J/Palai C.C.T.M.S.	K/Rajawela G.T.M.S.
18. Mrs. P. Kandasamy	J/Tharmapuram No. 2 G.T.M.S.	J/Chankanai East Saivapragasa Vid.
*19. Mr. A. Sriskandarajah	J/Palai M.V.	J/Puloly Boys Eng. School
20. Mr. A. Asaipillai	J/Palai M.V.	T/Thiriyai G.T.M.S.
21. Mrs. M. Sivaguru	J/Poonakary M.V.	J/Manipay Sothivembadi T.MS.
22. Mr. V. Theivandram	J/Uruthirapuram M.V.	J/Kopay Christian College
23. Mrs. S. George	J/Uruthirapuram M.V.	MN/Pessalai R.C.T.M.S.
*24. Mr. T. Kulasingam	J/Palai R.C.	MT/Keppitiya Muslim Vid.

*Transfer deferred till 31.12.68

(b) LIST OF HEAD TEACHERS AND ASSISTANT TEACHERS TRANSFERRED TO KILINOCHCHI ELECTORATE AND SCHOOLS TO WHICH THEY HAVE BEEN TRANSFERRED TO AND THE DATE OF THEIR TRANSFER

	Name of Teacher	Designation	Name of School to which the transfer is given	Effective Date
1.	Mr. V. Ponniah	Assistant	J/Elephantpass G.T.M.S.	1. 1.68
2.	Mr. A. Sabaratnasingham	Head Master	J/Palai C.C.T.M.S.	1. 1.68
3.	Mr. R. Appadurai	Assistant	J/Kilinochchi M.V.	1. 1.68
4.	Mr. A. M. Basheer	Assistant	J/Poonakary M. V.	1. 1.68
5.	Mr. V. Selladurai	Sr. Asst.	J/Ramanathapuram East G.T.M.S.	1. 1.68
6.	Mr. S. M. Anthonypillai	Head Master	J/Killaly R.C.T.M.S.	1. 1.68
7.	Mr. S. Velupillai	Head Master	J/Soranpattu Ganesha	1. 1.68
8.	Mr. P. R. Arulnayagam	Assistant	J/St. Theresa School	1. 1.68
9.	Mrs. V. Manonmani	Assistant	J/Kilinochchi Hindu T.M.S.	1. 2.68
10.	Mrs. N. Arunasalam	Assistant	J/Vembodukerni C.C.T.M.S	1. 2.68
11.	Mrs. J. T. Selvadurai	Assistant	J/Paranthan Hindu T.M.S.	3. 2.68
12.	Mr. K. Nagalingam	Head Master	J/Paranthan Hindu T.M.S.	1. 3.68
13.	Mr. T. Selvarajah	Assistant	J/Vavunikulam Unit 4 G.T.M.S.	1. 3.68
14.	Mr. A. Thuraiappah	Assistant	J/Tharmapuram No. 2 G.T.M.S.	1. 3.68
15.	Mr. V. Chellappah	Head Master	J/Thunukai G.T.M.S.	14. 8.68

(c) LIST OF VANCANCIES AT SCHOOLS OF KILINOCHCHI ELECTORATE AS ON 1.12.1967

	Name of School	Existing Vacancies
1.	J/Alankulam G.T.M.S.	1
2.	J/Elephant pass G.T.M.S.	1
3.	J/Gnanimadam G.T.M.S.	1
4.	J/Killali R.C.T.M.S.	1
5.	J/Kilinochchi Hindu T.M.S.	2
6.	J/Kovilvayal C.C.T.M.S.	1
7.	J/Kunchukulam Ganesha Vid.	1
8.	J/Madduvil Nadu G.T.M.S.	1
9.	J/Murusumoddai Muruganada	1
10.	J/Murusumoddai St. Anthony's T.M.S.	1
11.	J/Paranthan G.T.M.S.	1
12.	J/Paranthan Hindu T.M.S.	1
13.	J/Ramanathapuram North G.T.M.S.	2
14.	J/Uylankulam G.T.M.S.	1
15.	J/Vavunikulam Unit 4 G.T.M.S.	2
16.	J/Valaipadu G.T.M.S.	1
17.	J/Vannerikulam G.T.M.S.	2
	Total	21

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(*d*) LIST OF VACANCIES AT SCHOOL OF KILINOCHCHI ELETCORARTE AS ON 1.2.68

	Name of School		*Existing Vacancies*
1.	J/Alankulam G.T.M.S.	.. ..	1
2.	J/Poonakary Attai G.T.M.S.	.. ..	1
3.	J/Chelliativu G.T.M.S.	.. ..	1
4.	J/Chembankundu G.T.M.S.	.. ..	1
5.	J/Chettiyakurichi G. T. M. S.	.. ..	1
6.	J/Elephantpass G.T.M.S.	.. ..	1
7.	J/Gnanimadam G.T.M.S.	.. ..	1
8.	J/Kovilvayal G.T.M.S.	.. ..	1
9.	J/Kunchikulam Ganesha T.M.S.	.. ..	1
10.	J/Madduvil Nadu G.T.M.S.	.. ..	1
11.	J/Murusumoddai St. Anthony's R.C.T.M.S.	..	1
12.	J/Oddaruthakulam G.T.M.S.	.. ..	1
13.	J/Paranthan G.T.M.S. ..	.. ..	1
14.	J/Poonakary Nallur G.T.M.S.	.. ..	1
15.	J/Puthuvedduvan Hindu T.M.S.	.. ..	1
16.	J/Ramanathapuram East G.T.M.S.	.. ..	1
17.	J/Skandapuram G.T.M.S.	.. ..	1
18.	J/Sivanagar G.T.M.S. ..	.. ..	1
19.	J/Thattuvankotty G.T.M.S.	.. ..	1
20.	J/Thambirai G.T.M.S. ..	.. ..	1
21.	J/Tharmakerny G.T.M.S.	.. ..	1
22.	J/Tharmapuram No. 1, G.T.M.S.	.. ..	1
23.	J/Uylamkulam G.T.M.S.	.. ..	1
24.	J/Vavunikulam Unit 4, G.T.M.S.	.. ..	1
25.	J/Valaipadu R.C.T.M.S.	.. ..	1
26.	J/Veravil Hindu ..	.. ..	1
27.	J/Ramanathapuram North (Newly upgraded M.V.)	..	3
28.	J/Murasumodda Murugananda (Newly upgraded M.V.)	..	4
29.	J/Kilinochchi Hindu (Newly upgraded M.V.)	..	1
30.	J/Vavunikulam Unit 3 (Newly upgraded M.V.)	..	3
31.	J/Vannerikulam (Newly Upgraded M.V.)	..	3
		Total ..	40

උපකෘත පාසල් හා ගුරු විදුහල්වල සුළු සේවකයින්ට විශ්‍රාම වැටුප්

உதவி நன்கொடைபெறும் பாடசாலை, ஆசிரியர் பயிற்சிக் கல்லூரி சிற்றூழியர் : உபகாரச்சம்பளம்

MINOR EMPLOYEES IN ASSISTED SCHOOLS AND TRAINING COLLEGES : PENSIONABILITY

9. රත්නසිරි වික්‍රමනායක මයා. (හොරණ)

(திரு. ரத்னஸிரி விக்ரமநாயக்க—ஹொறனை)

(Mr. Ratnasiri Wickramanayaka—Horana)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) උපකෘත පාඨශාලා හා ගුරු විදුහල්වල සේවය කරන සුළු සේවකයින් විශ්‍රාම වැටුප් තත්වයට පැමිණවීමට කටයුතු කර තිබේද? (ආ) එසේ නැත්නම් මේ කාරණය ගැන නොපමාව ක්‍රියා කරනවාද? (ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) உதவி நன்கொடை பெறும் பாடசாலைகளிலும் ஆசிரியர் பயிற்சிக் கல்லூரிகளிலும் சேவை செய்யும் சிற்றூழியர் உபகாரச் சம்பளம் பெற வழிவகை செய்யப் பட்டுள்ளதா? (ஆ) இன்றேல், இவ்விஷயம் பற்றி நடவடிக்கை எடுப்பாரா? (இ) இன்றேல், ஏன்?

asked the Minister of Education and Cultural Affairs: (*a*) Has action been taken to grant pensionable status to minor employees employed in assisted schools and teachers' training colleges? (*b*) If such action has not been taken, will he take early action in this matter? (*c*) If not, why?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු හුරුල්ලේ—අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති වෙනුවට)

(கௌரவ ஹுருல்ல—கல்வி, கலாசார, விவகார அமைச்சர் சார்பாக)

(The Hon. Hurulle—on behalf of the Minister of Education and Cultural Affairs)

(අ) උපකෘත ගුරු විදුහල් දැනට නැති හෙයින් ද, උපකෘත පාඨශාලාවල සේවකයින්ගේ සේව්‍යයා රජය නොවන බැවින් ද එවැනි ආයතනවල සුළුසේවකයින්ට විශ්‍රාමික තත්ත්වය රජය විසින් ප්‍රදානය කිරීම පැන නොනඟී. (ආ) පැන නොනැඟේ. (ඉ) පැන නොනැඟේ.

කොළඹ මධ්‍යම රැකීරක්ෂා කාර්යාලයෙහි ලියාපදිංචි ඒ. ආර්. ෂෙරිප් මහතා

ஜனுப் ஏ. ஆர். ஷரிபு : கொழும்பு மத்திய தொழில் காண் நிலையத்தில் பதிவுசெய்யப்பட்டிருப்பவர்.

MR. A. R. SHERIFF, REGISTRANT, EMPLOYMENT EXCHANGE, COLOMBO

1. **පර්සි වික්‍රමසිංහ මයා.** (කඹුරුපිටිය—**පී. ජී. බී. කෙනමන් මයා.**—මැද කොළඹ තුන්වන මන්ත්‍රී—වෙනුවට)

(திரு. பேர்ஸி விக்கிரமசிங்ஹ—கம்புறுப்பிட்டிய—திரு. பீ. ஜீ. பி. கெனமன்—கொழும்பு மத்தி மூன்றும் அங்கத்தவர்—சார்பாக)

(Mr. Percy Wickremasinghe—Kamburupitiya—on behalf of Mr. P. G. B. Keuneman—Third Colombo Central)

කම්කරු හා රැකීරක්ෂා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කොළඹ 10, පළමුවන මරදානේ 175/113 දරන ස්ථානයේ පදිංචි ඒ. ආර්. ෂෙරිප් මහතා, (අනුක්‍රමික අංකය සියු/ආර් 17717), රක්ෂා විරහිත අයකු වශයෙන් කොළඹ, මධ්‍යම රැකීරක්ෂා කාර්යාලයෙහි ලියාපදිංචිව ඇති බව සහ මොහුගේ කාඩ්පතෙහි මුද්‍රා 59 ක් ඇති බව එතුමා දන්නේද? (ආ) මෙයට අඩු කාල සීමාවක් ලියාපදිංචිව සිටි වෙනත් අයට නියම වශයෙන් රක්ෂා ලබා දී තිබිය දී, ෂෙරිප් මහතාට නියම වශයෙන් රක්ෂාවක් ලබාදීමට රැකීරක්ෂා කාර්යාලයට නොහැකි වූයේ මන්ද? (ඉ) නියම වශයෙන් රක්ෂාවක් ලබා ගැනීමෙහිලා ෂෙරිප් මහතාට ආධාර දීමට කවර පියවර ගන්නේද? නැති නම් මන්ද?

தொழில், தொழில் வசதி அமைச்சரைக் கேட்ட வினா: (அ) கொழும்பு 10, மருதானை, 1 ம் பிரிவு 175/113 இலக்கத்தைச் சேர்ந்த ஜனுப் ஏ. ஆர். ஷரிபு, கொழும்பு, மத்திய தொழில் காண் நிலையத்தில், தொழிலற்று இருப்பதாகப் பதிவு செய்யப்பட்டிருக்கிறு ரென்பதையும் (தொடர் இல: CU/R 17717) அவருடைய அட்டையில் 59 பொறிகள் இடப்பட்டிருக்கின்றன என்பதையும் அவர் அறிவாரா? (ஆ) ஜனுப் ஷரிபிலும் பார்க்கக் குறைந்த காலத்திற்குப் பதிவு செய்யப்பட்டிருந்தவர்களுக்கு வேலைகள் தேடிக் கொடுத்துள்ளபோதிலும், தொழில் காண் நிலையமானது ஜனுப் ஷரிபுக்கு ஓர் ஒழுங்கான வேலையைத் தேடிக்கொடுக்க முடியாமலிருப்பதெப்படி? (இ) ஜனுப் ஷரிபுக்கு ஒழுங்கான தொழில் தேடிக் கொடுப்பதற்கு என்ன நடவடிக்கைகள் எடுக்கப்படும்? இல்லையெனில் ஏன்?

asked the Minister of Labour and Employment: (*a*) Is he aware that Mr. A. R. Sheriff of 175/113, 1st Division Maradana, Colombo 10, is registered as unemployed at the Central Employment Exchange, Colombo (Serial No. Cu/R 17717) and that he has 59 seals on his Card? (*b*) How is it that the employment exchange has not been able to find regular work for Mr. Sheriff when others, who have been registered for lesser periods, have been found such work? (*c*) What steps will be taken to help Mr. Sheriff to find regular employment, and if not, why?

ගරු එස්. ද එස්. ජයසිංහ (වැඩ බලන විද්‍යාත්මක පර්යේෂණ හා නිවාස ඇමති)

(கௌரவ எஸ். டி எஸ். ஜயசிங்ஹ—பதில் விஞ்ஞான ஆய்வு வீடமைப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(The Hon. S. de S. Jayasingha—Acting Minister of Scientific Research and Housing)

(අ) ඔව්. (ආ) නිතිපතා වැඩ ඔහු හට සොයා දෙන ලද නමුත් පිට පළාත්වලට යාමට ඔහු ප්‍රතික්ෂේප කළ හෙයිනි. (ඉ) නිතිපතා වැඩ සහිත රැකියා බලාපොරොත්තු වන්නන්ගේ ලේඛනයෙහි මුලටම ඇත්තේ මොහුගේ නමය. එහෙත් ඔහුගේ වයස අවුරුදු 43 කි. අවශ්‍ය සුදුසු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එස්. ද එස්. ජයසිංහ]

කම් වනුයේ නම්, ඉදිරියේ ඇතිවන ඇබෑර්තු සඳහා ඔහු ගැන ද සලකා බල නවා ඇත.

රාජා වෙලේගම මයා. (මොනරාගල)
(திரு. ராஜா வெலேகம—மொனருகலே)
(Mr. Raja Welegama—Monaragala)

ගරු කථානායකතුමනි, වැඩබලන ඇමති තුමාගෙන් අතුරු ප්‍රශ්නයක් අහන්න කැමතියි. රැකී රක්ෂා බලාපොරොත්තු වෙන් සිටින අයගේ කාඩ්පත්වල රැකී රක්ෂා කාර්යාලය මගින් සීල් තබනවා. මේ අන්දමට වරින්වර සීල් තබා අවසන් වුණාම අලුත් කාඩ්පතක් ලබාගැනීමේ බලාපොරොත්තුවෙන් එය රැකී රක්ෂා කාර්යාලයට යැව්වාම මාස ගණනක් ගත වනතුරුවත් අලුත් කාඩ්පතක් එවන්නේ නැහැ. මේ ගැන කරුණාකර සොයා බලනවාද?

ගරු ජයසිංහ මයා.
(கௌரவ ஜயசிங்ஹ)
(The Hon. Jayasingha)

අසුවල් අසුවල් අයගේ කාඩ්පත් ලැබුණේ නැතැයි දැනුම් දුන්නොත් ඒ ගැන වහාම පරීක්ෂා කර බලනවා.

වල්පිට රජයේ ගොවිපලේ මුරකරුව සිටි ජී. ඒ. එම්. තෝමස් මහතා

திரு. ஜீ. ஏ. எம். தோமஸ், இளைப்பாறிய காவலாளர், வல்பிற்ற அரசாங்கப் பண்ணை

MR. G. A. M. THOMAS, RETIRED WATCHER, WALPITA STATE FARM

2. එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා. (මිනුවන්ගොඩ—ලක්ෂ්මන් ජයකොඩි මයා.—දිවුලපිටිය—වෙනුවට)
(திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன—மினுவாங்கொட—திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலுபிட்டிய—சார்பாக)
(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda—On behalf of Mr. Lakshman Jayakody—Divulapitiya)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) වල්පිට රජයේ ගොවිපලේ මුරකරු ජී. ඒ. ඇම්. තෝමස් මහතා 1967 අප්‍රේල් මාස යේදී සේවයෙන් විශ්‍රාමගත් බවත්, 1967 අප්‍රේල් මාසය වෙනුවෙන් ඔහුට වැටුප්, විශේෂ ජීවනාධාර, ජීවනාධාර යනාදිය ලැබිය යුතු බවත් එතුමා දන්නවාද? (ආ) මොහු විශ්‍රාම ගත්තායින් පසුව මෙතෙක් මොහු කිසිම ගෙවීමක් ලබා නැති බව එතුමා දන්නවාද? (වැන්දඹු සහ අනත් දරු වැටුප් අංකය 183662) (ඉ) එම ගෙවීම් කිරීමට එතුමා වහාම පියවර ගන්නවාද? නොඑසේනම් ඒ මන්ද?

நிதியமைச்சரைக் கேட்ட வினு: (அ) வல்பிற்ற அரசாங்கப் பண்ணைக் காவலாளர் திரு. ஜீ. ஏ. எம். தோமஸ், 1967 ஆம் ஆண்டு ஏப்ரில் மாதத்தில் இளைப்பாறினுர் என்பதையும், 1967 ஆம் ஆண்டு ஏப்ரில் மாதத்திற்கான சம்பளம், வா. சி. ப., வா. செ. ப. முதலியனவற்றை அவர் இன்னமும் பெற்றுக் கொள்ள இருக்கிருர் என்பதையும் அவர் அறிவாரா? (ஆ) இளைப்பாறிய நாளிலிருந்து அவர் எவ்வித ஊதியமும் பெறவில்லையென்பதை அவர் அறிவாரா (வி. அ. இ. இலக்கம்: 183662)? (இ) இந்தக் கொடுப்பனவை அவருக்களிக்க அமைச்சர் உடனடி நடவடிக்கையெடுப்பாரா? இல்லையெனில் ஏன்?

asked the Minister of Finance: (*a*) Is he aware that Mr. G. A. M. Thomas, Watcher of Walpita State Farm, retired in April 1967, and that he has to get his Salary, S. L. A., C. L. A., etc. for the month of April 1967? (*b*) Is he aware that he has not received any remuneration since his retirement? (W & O P No. 183662)? (*c*) Will he take immediate steps to make such payment and if not, why?

එන්. විමලසේන මයා. (මුදල් ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)
(திரு. என். விமலசேன—நிதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)
(Mr. N. Wimalasena—Parliamentary Secretary to the Minister of Finance)

(අ) වල්පිට රජයේ ගොවිපලේ මුරකරු වූ ජී. ඒ. එම්. තෝමස් සිංඤෝ මහතා විශ්‍රාම ලබා ඇත්තේ 1967 අප්‍රේල් මස නොව 1968.2.1 වැනි දින දීය. 1967 අප්‍රේල් මාසය වෙනුවෙන් ඔහුගේ වැටුප්, විශෙෂ ජීවනාධාර හා ජීවනාධාර තෝමස් සිංඤෝ මහතාට ගෙවා ඇති අතර, ඉන් පසුවද විශ්‍රාම ගන්නා දින දක්වා වැටුප් ගෙවා ඇත. (ආ) ඔව්. (ඉ) ස්ථිර සේවක සංඛ්‍යා වෙහි තනතුරකට තෝමස් සිංඤෝ මහතා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පත්කරනු ලැබ නොසිටි හෙයින් ඔහුට විශ්‍රාම වැටුපක් ප්‍රදානය කිරීමට නොහැකිවී තිබිණි. මෙම වර්‍ගයට අයත් තවත් කීප දෙනෙකුගේ කාරණයන් සමග ඔහුගේ කාරණයද පරීක්‍ෂාකර ගෙන යනු ලබන අතර, සේවක සංඛ්‍යාව සම්බන්ධයෙන් අවසාන නිගමනයකට එළඹි විට විශ්‍රාම වැටුපක් දීමේ ප්‍රශ්නය සම්බන්ධයෙන් තීරණයක් ගනු ලබනවා ඇත.

වී: වගා කළ අක්කර ගණන හා අස්වැන්න

நெல் : பயிரிடப்பட்ட ஏக்கர்களும் விளைச்சலும்

PADDY: ACERAGE CULTIVATED AND YIELD

3. ද සොයිසා සිරිවර්ධන මයා.—(කේ. බී. රත්නායක මයා.—අනුරාධපුර—වෙනුවට)

(திரு. டி. சொய்சா சிறிவர்தன—திரு. கே. பி. ரத்ணயக்க—அனுராதபுரம்—சார்பாக)

(Mr. de Zoysa Siriwardena—On behalf of Mr. K. B. Ratnayake—Anuradhapura)

කෘෂිකර්ම හා ආහාර ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: 1956 සිට 1967 දක්වා වර්ෂයක් පාසා එක් එක් ආදායම් දිස්ත්‍රික්කය වෙනුවෙන් පහත සඳහන් තොරතුරු එතුමා සපයනවද? (i) වී වගාකරන ලද මුළු අක්කර ගණන—(අ) ප්‍රධාන ජනපද ව්‍යාපාර යටතේ, (ආ) ගම්බද වැව් යටතේ, (ii) ලැබුණ අස්වැන්න ප්‍රමාණය (බුසල් ගණන)— (අ) ප්‍රධාන ජනපද ව්‍යාපාර යටතේ, (ආ) ගම්බද වැව් යටතේ, (iii) සහතික වී මිළ ක්‍රමය යටතේ මිළදී ගත් බුසල් ගණන.

விவசாய, உணவு அமைச்சரைக் கேட்ட வினா: 1956 இலிருந்து 1967 வரை ஒவ்வோராண்டும், ஒவ்வோர் இறைவரி மாவட்டத்திலும், (i) (அ) பெரிய குடியேற்றத் திட்டங்களின் மூலமும், (ஆ) கிராமக் குளங்களின் மூலமும், நெல் பயிரிடப்பட்ட ஏக்கர்களின் எண்ணிக்கை; (ii) (அ) பெரிய குடியேற்றத் திட்டங்களின் மூலமும், (ஆ) கிராமக் குளங்களின் மூலமும், பெறப்பட்ட விளைச்சல் (புசல்களின் எண்ணிக்கை); (iii) உத்தரவாத விலைத் திட்டப்படி கொள்வனவு செய்யப்பட்ட புசல்களின் எண்ணிக்கை ஆகிய தகவல்களை அவர் தருவாரா?

asked the Minister of Agriculture and Food: Will he supply the following information in respect of each Revenue District annually from 1956 to 1967: (i) the number of acres cultivated with Paddy: (*a*) under Major Colonisation Schemes; (b) under Village tanks; (ii) the yield realised (number of bushels)—(*a*) under Major Colonisation Schemes; (b) under Village tanks; (iii) the number of bushels purchased under the G. P. S.?

පී. සී. ඉඹුලාන මයා. (කෘෂිකර්ම හා ආහාර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. பீ. சீ. இம்புலான்—விவசாய, உணவு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. P. C. Imbulana—Parliamentary Secretary to the Minister of Agriculture and Food)

Since the Answer to this Question is a long one I shall table it. *

ඉඩම් කට්ටි පරිපාලකවරුන්ට උසස්වීම්

காணி பிரித்தொதுக்கும் உத்தியோகத்தர்கள் : பதவி உயர்வுச் சந்தர்ப்பங்கள்

LAND ALLOTMENT OVERSEERS: PROMOTION PROSPECTS

5. ද සොයිසා සිරිවර්ධන මයා. (ජයකොඩි මයා.—වෙනුවට)

(திரு. டி. சொய்ஸா சிறிவர்தன—திரு. ஜயக்கொடி—சார்பாக)

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. Jayakody)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ජනපද නිලධාරීන් සහ ඉඩම් කට්ටි පරිපාලකවරුන් යනුවෙන් සේවාවන් දෙකක් තිබේද? (ආ) මේ සේවාවන් දෙකේ නිලධාරීන් එකම අධ්‍යාපනික සුදුසුකම් ඇතිව එකම වැටුප් තලයක් මත එක හා සමාන රාජකාරි

---

* සභා මේසය මත තබන ලද පිළිතුර අද දින වැඩ කටයුතු අවසානයෙහි පරිශිෂ්ඨයක් වශයෙන් පළ කොට ඇත.

*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை இன்றைய நிகழ்ச்சிகளின் இறுதியில் அநுபந்தமாகத் தரப்பட்டிருக்கிறது.

* *The Answer tabled is reproduced as an Appendix at the end of this Day's Proceedings.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද සොයිසා සිරිවර්ධන මයා.]

වැඩ කොටසක් කිරීම සඳහා යොදවා තිබෙන බව එතුමා දන්නවාද? (ඉ) ජනපද නිලධාරීන් වශයෙන් බැඳී ඇති අයගේ උසස්වීම් සම්බන්ධයෙන් අනික් සේවාව දෙස බලන විට ඉඩම් කට්ටි පරිපාලකවරුන්ට අසාධාරණයක් සිදුවී ඇති බව එතුමා දන්නවාද? (ඊ) ජනපද නිලධාරීන් 6 ක් අතුරින් එක් අයෙකුට 1 වෙනි ශ්‍රේණියට උසස් වී පඩිනඩි හා දීමනා අතින් වාසියක් ලබා ගැනීමට හැකිවන අතර, ඉඩම් කට්ටි පරිපාලකවරුන්ට කිසිම උසස්වීමක් නොමැති බවත්, සමහරුන් දැන් විශ්‍රාම ගන්නා අවස්ථාවට එළඹ සිටින බවත් එතුමා දන්නවාද? (උ) මේ සේවා දෙක ඒකාබද්ධ කිරීමට හෝ ශ්‍රේණිගත කිරීමට හෝ යෝජනා කර තිබුණ මුත් එය මේ වන තෙක් ක්‍රියාත්මක නොවීමට විශේෂ හේතුවක් තිබෙනවාද? (ඌ) එක්තරා කොටසකට අයුත්තක් සිදුවී ඇති බව පෙනෙන හෙයින් මේ ගැන කුමන පියවරක් ගැනීමට එතුමාට බලාපොරොත්තු වනවාද?

காணி, நீர்ப்பாசன, மின்சக்தி அமைச்சரைக் கேட்ட வினா: (அ) காணிக் கமிஷனரின் திணைக்களத்தில் குடியேற்ற அதிகாரிகள் எனவும் காணி பிரித்தொதுக்கும் உத்தியோகத்தர்கள் எனவும் இரு சேவைப் பிரிவுகள் உண்டா? (ஆ) இவ்விருசேவைப் பிரிவுகளைச் சேர்ந்த உத்தியோகத்தர்கள் ஒரே கல்வித் தகைமைகளோடு ஒரே சம்பளமுறையின் கீழ் ஒரே விதமான கடமைகளை செய்வதற்கு உபயோகப்படுத்தப்பட்டுள்ளார்கள் என்பதையும் அவர் அறிவாரா? (இ) குடியேற்ற அதிகாரிகளாகச் சேர்ந்துள்ளவர்களின் பதவி உயர்வு விஷயத்தை மற்ற சேவையைச் சேர்ந்தவர்களோடு ஒப்பிடும்பொழுது காணி பிரித்தொதுக்கும் உத்தியோகத்தர்களுக்கு அநீதி நடைபெற்றிருப்பதை அவர் அறிவாரா? (ஈ) குடியேற்ற அதிகாரிகள் 6 பேரில் ஒருவருக்கு முதலாம் தர பதவி உயர்வு கிடைத்து சம்பளங்களும் படிகளும் இலாபமும் பெறக்கூடியதாயிருக்க காணி பிரித்தொதுக்கும் உத்தியோகத்தர்களுக்கு ஒரு விதமான பதவி உயர்வும் இல்லாமலிருப்பதோடு சிலர் இளைப்பாறும் நிலையில் இருப்பதையும் அவர் அறிவாரா? (உ) இந்த இரு சேவைகளையும் இணைக்குமாறு அல்லது தரம் பிரிக்குமாறு சிபார்சு செய்யப்பட்டிருந்ததெனினும் இதுவரையில் அதை அமுல் செய்யாமல் இருப்பதற்கு விசேட காரணங்கள் உண்டா? (ஊ) ஒரு பிரிவினருக்கு அநீதி நடைபெற்றிருப்பதாக தெரிகிறபடியால் இது சம்பந்தமாக நீங்கள் எடுக்க உத்தேசித்துள்ள நடவடிக்கை என்ன?

asked the Minister of Land, Irrigation and Power: (*a*) Are there two services, namely, Colonisation Officers and land Allotment Overseers, in the Land Commissioner's Department? (*b*) Is he aware that the officers of these two services possess the same educational qualifications, are placed on the same salary scale and are engaged in performing similar duties? (*c*) When considering the promotion prospects of those who have joined as Colonisation Officers in relation to the other service, is he aware that an injustice has been caused to Land Allotment Overseers? (*d*) Is he aware that while one out of every six Colonisation Officer is able to secure promotion to Grade I and enjoy benefits with regard to salary and allowances, Land Allotment Overseers do not get any promotions whatever and that some of them have already reached the age of retirement? (*e*) Although it had been proposed to amalgamate these two services or to introduce a grading system, is there any special reason for not implementing this so far? (*f*) As it is evident that an injustice has been caused to a certain category, what steps does he propose to take in this regard?

ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)

(கௌரவ சி. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

(*a*) Yes. (*b*) They possess similar qualifications. However, the salary scale for S. L. D. O's is as follows: Rs. 1,380—120—3,780. The salary scale for Colonisation Officers is as follows: Grade II Rs. 1,380—120—3,780; Grade I Rs. 3,180—6 × 120—

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

8 × 180—2 × 240—5,820. Their duties are not identical. Colonization officers work in colonization schemes while the S. L. D.O's generally work in village expansion schemes. The work devolving on the two categories of officers in the two types of schemes referred to is not the same. (c) There is no injustice caused since both categories were aware of their promotion prospects and salary scales when they joined the respective services. A proposal made by the The Treasury to amalgamate the two services so as to ensure equality of salary scales and promotion prospects was opposed by the Union of S. L. D. O's (d) Yes. Please see the observations at (c). I have, however, to mention that S. L. D. O's are eligible to sit for the limited competitive examination for Grade V of the C. A. S. and they have also been appointed to act as district land officers with P. S. C. approval. (e) The Union of S. L. D. O's was against the proposal to amalgamate the two services. The proposal to introduce a grading system for S.L.D.O's service has been referred to the Anomalies Committee. (f) I am awaiting the decision of the Anomalies Committee and the Treasury in this matter.

දිගෝව-ඉඹුල්පිටිය පාර

திகோவ—இம்புல்பிட்டிய ரோட்டு

DIGODA-IMBULPITIYA ROAD

6. **ආචාර්ය එන්. එම්. පෙරේරා** (යටියන්තොට—ඩී. පී. ආර්. වීරසේකර මයා.—දෙහිඕවිට—වෙනුවට)

(கலாநிதி என். எம். பெரேரா—யட்டியாந்தோட்டை—திரு. டி. பி. ஆர். வீரசேக்கர—தெஹியோவிற்ற—சார்பாக)

(Dr. N. M. Perera—Yatiyantota—on behalf of Mr. D. P. R. Weerasekera—Dehiowita)

රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) දෙහිඕවිට කොට්ඨාශයේ දිගෝව-ඉඹුල්පිටිය නමැති රජයේ වැඩ දෙපාර්තමේන්තුවට අයත් පාර ඉතා අබලන් තත්වයේ පවතින බව එතුමා දන්නවාද? (ආ) රත්නපුර විධායක ඉංජිනේරු තුමාට යථෝක්ත පාර යථා තත්වයට පැමිණ වීමට මුදල් නොමැති කමින්, පාර තවදුරටත් සේදී යන බව එතුමා දන්නේද? (ඉ) 1965 වර්ෂයේ මුලදී ලැබූ විශේෂ ආධාර මුදලින් පාර සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය කළ පසු අද තෙක් ප්‍රතිසංස්කරණය නොකළ බව එතුමා දන්නවාද? (ඊ) එහෙයින් මෙම පාර ප්‍රතිසංස්කරණය කරවීමට එතුමා කට යුතු කරනවාද? (උ) එසේ නම් ඒ කවදාද? නොඑසේ නම්, ඒ මන්ද?

அரசாங்க கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) தெஹியோவிற்ற தேர்தல் தொகுதியைச் சேர்ந்ததும் கட்டுவேலை திணைக்களத்திற்குச் சொந்தமானதுமான திகோவ-இம்புல்பிட்டிய ரோட்டு மிகவும் மோசமான நிலையில் இருப்பதை அவர் அறிவாரா? (ஆ) இரத்தினபுரி நிறைவேற்று பொறியியலாளருக்கு மேற்கூறிய ரோட்டை திருத்தியமைக்க பணம் இல்லாமையினால் ரோட்டு தொடர்ந்து அரித்துக்கொண்டு போகப்படுவதையும் அவர் அறிவாரா? (இ) 1965 ம் வருட ஆரம்பத்தில் கிடைத்த விஷேட உதவி நிதியினால் ரோட்டுப் பூரணமாகத் திருத்தி அமைக்கப்பட்டபின் இன்று வரையிலும் திருத்தப்படவில்லையென்பதை அவர் அறிவாரா? (ஈ) எனவே இந்த ரோட்டைத் திருத்தியமைக்க அவர் நடவடிக்கை எடுப்பாரா? (உ) ஆம் எனில் எப்பொழுது, அன்றேல் ஏன்?

asked the Minister of Public Works, Posts and Telecommunications: (a) Is he aware that the Digowa-Imbulpitiya P. W. D., road in the Dehiowita electorate is in a bad state of disrepair? (b) Is he aware that this road is getting washed away further because the Executive Engineer, Ratnapura does not have funds to repair the road? (c) Is he aware that up to date, this road has not been repaired after it was fully repaired with a special grant received at the beginning of 1965? (d) Will he therefore take action to have this road repaired? (e) If so, when? If not why?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විජයපාල මෙන්දිස් මයා. (රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. விஜயபால மெண்டிஸ்—அரசாங்கக் கட்டுவேலை, தபால் தந்திப் போக்குவரத்து அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. Wijeyapala Mendis—Parliamentary Secretary to the Minister of Public Works, Posts and Telecommunications)

(අ) මෙය රජයේ වැඩ දෙපාර්තමේන්තුව මගින් නඩත්තු කරන පාරක් නොවේ. (ආ) ඉහත පිළිතුර අනුව මෙය පැන නොනඟී. (ඉ) මෙය ගම්සභා මාර්ගයක් බැවින්, කරන ලද වැඩ ගැන මම නොදනිමි. (ඊ) පවරාගෙන තිබෙන පාරවල් වැඩිදියුණු කරනතෙක් තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා මාර්ග පවරා ගැනීමට නුපුළුවන. (උ) මෙය පැන නොනඟී.

දෙහිඕවිට පාසල් : දහවල් ආහාරය

தெஹியோவிற்றப் பாடசாலைகள் : பகல் உணவு

DEHIOWITA SCHOOLS : MIDDAY MEAL

ආචාර්ය එන්. එම්. පෙරේරා (වීරසේකර මයා. වෙනුවට)

(கலாநிதி என். எம். பெரேரா—திரு. வீரசேக்கர—சார்பாக)

(Dr. N. M. Perera—on behalf of Mr. Weerasekera)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) දෙහිඕවිට මැතිවරණ කොට්ඨාශය තුළ රජයේ පාසල් කීයක් තිබේද ? (ආ) 1968 මැයි මාසය තුළදී නොකඩවා දහවල් ආහාරය වශයෙන් බනිස් හෝ විස්කෝතු පාසල් කීයක බෙදා දී තිබේද ? (ඉ) පංති කිහිපයකට පමණක් ආහාර දුන් පාසල් කීයක් තිබේද ? (ඊ) පාසල් සිසුන්ට දහවල් ආහාරය නොමිලේ දීමේ ප්‍රතිපත්තිය රජය විසින් මොන ක්‍රමයකින්හෝ වෙනස් කර තිබේද ?

கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா : (அ) தெஹியோவிற்றத் தேர்தல் தொகுதிக்குள் எத்தனை அரசினர் பாடசாலைகள் இருக்கின்றன ? (ஆ) 1968 மே மாதத்திலிருந்து தொடர்ந்து பகல் உணவாக பணிஸ் அல்லது விசுக்கோத்து எத்தனை பாடசாலைகளில் வினியோகிக்கப்பட்டது ? (இ) சில வகுப்புகளுக்கு மட்டும் உணவு வழங்கிய பாடசாலைகள் எத்தனை உள்ளன ? (ஈ) பாடசாலை மாணவர்களுக்கு பகல் உணவை இலவசமாக வழங்கும் கொள்கையை அரசாங்கம் எந்த விதத்திலாவது மாற்றியுள்ளதா ?

asked the Minister of Education and Cultural Affairs: (*a*) How many Government schools are there in the Dehiowita Electorate ? (*b*) In how many of these schools were buns or biscuits provided regularly throughout the month of May, 1968, as the mid-day meal ? (*c*) In how many schools were mid-day meals provided only for certain classes ? (*d*) Has the government effected any change whatsoever in the policy relating to the supply of mid-day meals to school-children ?

ගරු හුරුල්ලේ (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති වෙනුවට)

(கௌரவ ஹுருல்ல—கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல—கல்வி, கலாசார விவகார அமைச்சர்—சார்பாக)

(The Hon. Hurulle—on behalf of Minister of Education and Cultural Affairs)

(*a*) Seventy-two. (*b*) Seventy-two. (*c*) and (*d*) No.

රාජා වෙලේගම මයා.

(திரு. ராஜா வெலேகம)

(Mr. Raja Welegama)

මට අතුරු ප්‍රශ්නයක් අසන්නට තිබෙනවා. මගේ කොට්ඨාශයේ සමහර පාසල්වල ළමයින්ට දිවා භෝජනය ලැබෙන්නේ නැහැ. එවැනි පාසල්වල ගුරුදෙගුරු සමිති කල්පනා කර තිබෙනවා, එම ළමයින්ට දිවා භෝජනය වෙනුවට යම් කිසි මුදලක් දෙනවා නම් එම මුදලින් දිවා භෝජනය සපයා ගන්නට පුළුවනැයි කියා. අමාත්‍යාංශය මගින් ඒ ගැන සලකා බලා බලනවා දැයි මා අහනවා.

ගරු හුරුල්ලේ

(கௌரவ ஹுருல்ல)

(The Hon. Hurulle)

මම ඒ අදහස ඇමතිතුමා වෙත ඉදිරිපත් කරන්නම්.

කථානායකතුමා

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

Question No. 8

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉඹුලාන මයා.
(திரு. இம்புலான)
(Mr. Imbulana)

A month's time is required to answer this Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

Question ordered to stand down.

අම්පලාන්තුරෙයි-වීරමුනෙයි ආදී පාරවලට කොන්ක්‍රීට් පාලම්

அம்பலாந்துறை—வீரமுனை வீதி முதலானவற்றுக்கு கொங்கிரீட் பாலங்கள்

CONCRETE BRIDGES FOR AMPLANTHURAI-VEERAMUNAI ROAD, ETC.

10. ඉරත්තිනම් මයා. (එස්. එම්. රසමානික්කම් මයා—පද්දිරිප්පු—වෙනුවට)
(திரு. இரத்தினம்—திரு. எஸ். எம். இராசமாணிக்கம்—பட்டிருப்பு—சார்பாக)
(Mr. Ratnam—on behalf of Mr. S. M. Rasamanickam—Paddiruppu)

රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) පහත සඳහන් දුර්වල ලී පාලම් වෙනුවට ස්ථිර කොන්ක්‍රීට් පාලම් තැනවීමට ගනු ලබන පියවර කවරේද? (i) අම්පලාන්තුරෙයි-වීරමුනෙයි පාර; (ii) නවකිරි (වෙල්ලවෙලි) 5/5; (iii) කිරිදන් ආරු 5/6; (iv) අන්දල් ඔය 4/7. (ආ) මෙම පාලම් තැනීමේ වැඩ කවදා ඇරඹේද?

அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) (i) அம்பலாந்துறை-வீரமுனை வீதியிலுள்ள (ii) நவகிரி (வெள்ளாவெளி) 5/5 (iii) கிரதன் ஆறு 5/6, (iv) அந்தல் ஓயா 4/7 கட்டையிலுள்ள பலங்குன்றிய மரப் பாலங்களுக்குப் பதிலாக நிரந்தர கொங்கிரீட் பாலங்களை நிறுவ எடுக்கப்படும் நடவடிக்கை என்ன? (ஆ) இப்பாலங்களுக்கான வேலை எப்பொழுது ஆரம்பிக்கப்படும்?

asked the Minister of Public Works, Posts and Telecommunications: (*a*) What action is being taken to replace the following week wooden bridges with permanent concrete bridges: (i) Ampalanthurai-Veeramunai Road; (ii) Navakiri (Vellaveli) 5/5, (ii) Kiradan Aru 5/6, (iv) Andal Oya 4/7? (*b*) When will work start on these bridges?

විජයපාල මෙන්ඩිස් මයා.
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

(*a*) (i) This is the name of the Road. (ii), (iii) & (iv) The Chief Engineer, Bridges, has carried out investigations and finds that these sections of the road go under water during normal floods. Also the drainage pattern of this area is now greatly altered and the Chief Engineer, Designs, is studying this in consultation with the Irrigation Department. The designed of bridge 5/5 has been completed. (*b*) The construction of bridge 5/5 cannot be taken up under the block vote in view of its high cost. A specific sub-head has to be created in the estimates for 1969-70. In the meantime action has already been taken to strengthen these bridges. The bridge referred to as 4/7 should really read as 7/4.

පද්දිරිප්පු-වෙල්ලවේලි ආදි පාරවල ගල් අතුරා තාර දැමීම

பட்டிருப்பு—வெள்ளாவெலி ஆகிய வீதிகள்: கல லுப்போட்டுத் தாரிடல்

PADDIRUPPU VELLAVELI AND OTHER ROADS: METALLING AND TARING

11. ඉරත්තිනම් මයා. (රාසමානික්කම් මයා.—වෙනුවට)
(திரு. இரத்தினம்—திரு. இராசமாணிக்கம்—சார்பாக)
(Mr. Ratnam—on behalf of Mr. Rasamanickam)

රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) පහත සඳහන් පාරවල් දියුණුකොට ගල් අතුරා තාර දමා සකස් කිරීමට ගනු ලබන පියවර කවරේද? (i) පද්දිරිප්පු-වෙල්ලවේලි පාර 3.75 සැ.; (ii) වේල්ලවේලි-දිවුලානෙයි පාර; (iii) වෙල්ලවේලි-මන්ඩූර් පාර (අම්පලාන්තුරෙයි-වීරමුනෙයි 5, 7 හා 8 වැනි සැතපුම්); (iv) පෙරිය පොරතිවු-

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉරත්තිනම් මයා.]

පලුකාමම්-තුම්පන්කර්නි පාර. (ආ) දෙපාර්තමේන්තුවේ වැඩ පිළිවෙල අනුව වැඩ නිම කෙරෙනු ඇත්තේ කවදාද ?

அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (1) (அ) பட்டிருப்பு-வெள்ளாவெளி வீதி 3.75 ஆம் கட்டை. (ஆ) வெள்ளாவெளி-திவுலானை வீதி. (இ) வெள்ளாவெளி-மந்தூர் வீதி (அம்பலாந்துறை-வீரமுனை 3 ம், 7 ம், 8 ஆம் கட்டை). (ஈ) பெரியபோறதீவு-பாலுகாமம்-தும்பன்கேணி ஆகிய வீதிகளைத் திருத்தவும், கல்லுப்போடவும், தாரிடுவதற்குமாக எடுக்கப்படும் நடவடிக்கை என்ன? (2) திணைக்களத்தின் வேலைத் திட்டத்திற் கிணங்க இவ்வேலை எப்பொழுது முடிவடையும்?

asked the Minister of Public Works, Posts and Telecommunications: (*a*) What action is being taken to improve, metal and tar the following roads: (i) Paddiruppu-Vellaveli road 3.75 miles; (ii) Villaveli-Divulanai road; (iii) Vellaveli-Mandur road, i.e. (Amplanthurai-Veeramunai 5th 7th and 8th Miles); (iv) Peria Porativu - Palugaman-Thumpankerney road; (*b*) When will work be completed according to the programme of the Department?

විජයපාල මෙන්ඩිස් මයා.

(திரு. விஜயபால மெண்டிஸ்)

(Mr. Wijayapala Mendis)

(*a*) (i) An estimate has already been sanctioned to improve, metal and tar two miles of this road and this work is expected to be completed before the end of this year. The balance section will be considered along with other items when the priority list for the next financial year is drawn up. (ii) This will be considered along with other items when the priority list for the next financial year is drawn up. (iii) An estimate has already been sanctioned to improve metal and tar half mile on the 5th mile and this work will be completed by October this year. The balance section will be considered along with other items when the priority list for next financial year is drawn up. (iv) Metal consolidation work is in progress at the moment on half mile of the first mile of this road. The balance section will be considered along with other items when the priority list for the next financial year is drawn up. (*b*) This will depend on the priorities assigned to these items which in turn will depend on the availability of funds.

කුරුමෙන්වෙලි-මන්ඩූර් තොටුපොල

குருமென்வேலி—மாந்துள் பாதை

KURUMENVELI-MANDUR FERRY

12. ඉරත්තිනම් මයා.—(රාසමානික්කම් මයා.—වෙනුවට)

(திரு. இரத்தினம்—திரு. இராசமாணிக்கம்—சார்பாக)

(Mr. Ratnam—on behalf of—Mr. Rasamanickam)

රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) කුරුමෙන්වෙලි-මන්ඩූර් තොටුපොළට යාන්ත්‍රික පාරුව ක්‍රියා කරවීමට ඉහත සඳහන් වල්ලම් ඔරුවක් සැපයීමටත්, (ii) යාන්ත්‍රික පාරුව ක්‍රියා කරවීමට ඉහත සඳහන් තොටුපොළෙහි ගොඩ බහින වේදිකා තැනීමටත්, ගනු ලබන පියවර කවරේද ? (ආ) 1968 සැප්තැම්බර් මාසය අවසන් වීමට කලින්, බෙහෙවින් ප්‍රමාද වී ඇති මෙම සේවය ආරම්භ කිරීම පිණිස කර්මාන්තශාලා ඉංජිනේරු තැන මාර්ගයෙන් මෙම පාරුව තැනවීමේ කටයුතු ඉක්මන් කිරීමට එතුමා ක්‍රියා කරනවාද ?

அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) (i) குருமென்வேலி-மாந்துள் பாதைக்கு இயந்திரப் படகொன்றையும், வெளியிலிருந்து இயங்கும் மோட்டர் அமைக்கப்பெற்ற வள்ளமொன்றையும் வழங்குவதற்கும்; (ii) இயந்திர வள்ளப்பாவனைக்கு உதவியாக பிரயாணிகள் ஏற இறங்குதுறைகளை அமைப்பதற்குமாக; என்ன நடவடிக்கை எடுக்கப்படுகின்றது? (ஆ) நீடித்த காலமாகத் தாமதிக்கப்பட்ட இச்சேவையை 1968 செப்டெம்பர் மாத முடிவிற்குமுன் ஆரம்பிக்கு முகமாக தொழிற்சாலை பொறியியலாளரை இவ்வள்ளத்தைக் கட்டிமுடிக்கும்படி செய்வாரா?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

asked the Minister of Public Works, Posts and Telecommunications: (*a*) What action is being taken to: (i) Supply a Mechanised Padda Boat and a Vallam fitted with outboard motor for the Kurumenveli-Mandur Ferry? (ii) Construct landing jetties at the above ferries to ply the mechanised padda boat? (*b*) Will he get the Factory Engineer to expedite the construction of the Padda Boat to commence this long delayed service before the end of September 1968?

විජයපාල මෙන්ඩිස් මයා.

(திரு. விஜயபால மெண்டிஸ்)

(Mr. Wijayapala Mendis)

(*a*) (i) The outboard motor for the padda-boat has already been obtained and the padda-boat is under construction by the Factory Engineer. The Vallum has been purchased by the E. E. and the Factory Engineer has called for tenders for the purchase of an outboard motor for this. A decision on the tenders received will be made in about 10 days. (ii) The ferry service is presently run under the control of the Government Agent. It is contemplated handing over this service to the P. W. D. and the construction of the landing jetties will be taken up no sooner this is taken over. Estimate for this is under preparation. (*b*) Yes.

කොළඹ-රත්නපුර පාරේ, ඇහැළියගොඩ මංසන්ධියට අතිරේක මාර්ගයක්

கொழும்பு இரத்தினபுரி வீதி எஹலியக்கொடச் சந்தியில் பக்கப்பாதைவு

BYPASS AT EHELIYAGODA JUNCTION, COLOMBO-RATNAPURA ROAD

13. **ආචාර්ය එන්. එම්. පෙරේරා** (පී. බී. විජයසුන්දර මයා.—කිරිඇල්ල—වෙනුවට)

(கலாநிதி என். எம். பெரேரா—திரு. பீ. பி. விஜயசுந்தர—கிரியல்ல—சார்பாக)

(Dr. N. M. Perera—on behalf of—Mr. P. B. Wijesundara—Kiriella)

රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය; (අ) කොළඹ-රත්නපුර පාරේ, ඇහැළියගොඩ මංසන්ධිය ජනාකීර්ණ ස්ථානයක් බව එතුමා දන්නවාද? (ආ) දිනකට හය දහසක් පමණ ජනයා මේ ස්ථානයෙන් එහා මෙහා ගමන් කරන බවත්, පාසැල් වේලාවන් පටන් ගැනීමට පෙර හා පසු මෙම ස්ථානයේ ශිෂ්‍යයින් දෙදහසක් පමණ ගැවසෙන බවත් එතුමා දන්නවාද? (ඉ) රථවාහන හාරදහසක් පමණ දිනපතා මෙම හන්දිය පසුකර යන බවත්, මෙම ස්ථානයේ පාරද ඉතා පටු බවත් එතුමා දන්නවාද? (ඊ) එබැවින් ඉතා ඉක්මණින් කොළඹ-රත්නපුර පාරේ ගමන් කරන වාහනවලට ඇහැළියගොඩ නගරය පසු කරන විට ප්‍රයෝජනයට ගැනීමට අතිරේක මාර්ගයක් සකස් කර දීමට එතුමා ක්‍රියා කරනවාද?

அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) கொழும்பு-இரத்தினபுரி வீதியிலுள்ள எஹலியகொடச் சந்தி வாகன, சன நெருக்கடியான ஒரு இடமென்பதை அவர் அறிவாரா? (ஆ) தினமும் சுமார் ஆறுயிரம் மக்கள் வரையில் இவ்விடத்தைக்கடந்து செல்லுகிறார்கள் என்பதையும், சுமார் ஈராயிரம் பாடசாலை மாணவர்கள் பாடசாலை நேரங்களுக்கு முன்னும், பின்னும் அங்கு கூடுகிறார்கள் என்பதையும் அவர் அறிவாரா? (இ) தினமும் சுமார் நாலாயிரம் வாகனங்களும் இவ்விடத்தைக் கடந்து செல்லுகின்றன என்பதையும், இந்த இடத்தில் வீதி மிகவும் ஒடுக்கமாக இருக்கிறது என்பதையும் அவர் அறிவாரா? (ஈ) ஆகவே அவர், கொழும்பு-இரத்தினபுரி வீதியிற் செல்லும் வாகனங்கள் இவ்விடத்தைக் கடந்து செல்லும்போது உபயோகிக்கக் கூடியதாக பக்கப் பாதையொன்றை அமைக்க வெகுவிரையில் நடவடிக்கையெடுப்பாரா?

asked the Minister of Public Works, Posts and Telecommunications: (*a*) Is he aware that the Eheliyagoda junction on the Colombo-Ratnapura road is a busy place? (*b*) Is he aware that about six thousand people pass this place daily and that about two thousand school children gather at this place, before and after school hours? (*c*) Is he aware that about four thousand vehicles too pass this place daily and that the road at this point is very narrow? (*d*) Will he therefore take very early action to have a by-pass road constructed to be used by vehicles plying on the Colombo-Ratnapura road, when they pass this place?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විජයපාල මෙන්ඩිස් මයා.
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

(අ) ඔව්. (ආ) මෙයට පෙර ගණන් ගැනීමක් කර නැතිමුත් පහත සඳහන් (ඊ) පරිදි කටයුතු කිරීමට අවශ්‍යයෙන්ම එය කළ යුතුව ඇත. (ඉ) 1961 වර්‍ෂයේදී කොළඹ-රත්නපුර පාරේ ඇහැළියගොඩ-දෙහිඕවිට පාරේ හා ඇහැළියගොඩ මංසන්ධියේ කරන ලද වාහන ගණන් ගැනීමේදී සීඝ්‍ර ධාවන වාහන 1,360 ක් පමණ දිනකට මෙම මංසන්ධියෙන් ගමන් කරන බවට ගණන් බලා තිබේ. මේ අනුව මෙම ගණන් ගැනීම උපයෝගි කරගෙන දැනට මෙම මංසන්ධියෙන් දිනකට වාහන 1,500 ක් පමණ ගමන් කරනු ඇතැයි බලාපොරොත්තු විය හැක. (ඊ) මේ සඳහා විමර්ශන පැවැත්වීමට ඉක්මණින් කටයුතු කරනු ලැබේ.

කරඳන උප තැපැල් කාර්යාලයට විදුලි පණිවුඩ හා දුරකථන සේවාවක්

கரந்தன உபதபால் நிலையம் : தந்தி, தொலைபேசிச் சேவை.

KARANDANA SUB-POST OFFICE : TELEGRAPH AND TELEPHONE SERVICE

14. **ආචාර්ය එන්. එම්. පෙරේරා**—(විජයසුන්දර මයා.—වෙනුවට)

(கலாநிதி என். எம். பெரேரா—திரு. விஜயசுந்தர—சார்பாக)

(Dr. N. M. Perera—on behalf of Mr. Wijesundara)

රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කරඳන උප තැපැල් කාර්යාලයට විදුලි පණිවුඩ සහ දුරකථන සේවාවක් අත්‍යාවශ්‍ය බව රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධිකරණ කාරක සභාවත්, රත්නපුර දිසාපතිතුමාත්, විදුලි පණිවුඩ දෙපාර්තමේන්තුවත්, කිරිඇල්ල මන්ත්‍රීවරයාත්, රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ අමාත්‍යාංශයට නිර්දේශකර ඇති බව එතුමා දන්නවාද? (ආ) දුර බැහැර ප්‍රදේශයක් වන කරඳන ප්‍රදේශයේ ජනතාව ගංවතුර ආදී අවස්ථාවන්හිදී දුරකථන සේවයක් නොමැතිකම නිසා තදබල පීඩා විඳින බව එතුම දන්නවාද? (ඉ) එබැවින් එකී සේවය අප්‍රමාදව ලබා දීමට එතුමා ක්‍රිය කරනවාද?

அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) இரத்தினபுரி மாவட்ட இயைபுபடுத்தும் செயற்குழுவினர், இரத்தினபுரி அரசாங்க அதிபர், தந்திப் போக்குவரத்துப் பகுதியினர், கிரியல்லத் தொகுதிப் பாராளுமன்ற அங்கத்தவர் ஆகியோர் கரந்தன உப-தபால் நிலையத்திற்கு ஒரு தந்தி, தொலைபேசிச் சேவை அவசியம் என்று, அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சிற்குச் சிபாரிசு செய்தார்கள் என்பதை அவர் அறிவாரா? (ஆ) வெகு தொலைவிலுள்ள ஒரு பகுதியாகிய கரந்தன என்ற இடத்திலுள்ள மக்கள் தொலைபேசிச் சேவையில்லாததால் வெள்ளம் முதலியன ஏற்படும் போது பெருங்கஷ்டத்திற்குள்ளாகிறார்கள் என்பதை அவர் அறிவாரா? (இ) ஆகவே, இச்சேவையை மேலுந் தாமதமில்லாமல் அளிக்க அவர் நடவடிக்கை எடுப்பாரா?

asked the Minister of Public Works, Posts and Telecommunications: (*a*) Is he aware that the Ratnapura District Co-ordinating Committee, the Government Agent, Ratnapura, the Department of Telecommunications and the Member of Parliament for Kiriella have recommended to the Ministry of Public Works, Posts and Telecommunications, that a telegraph and telephone service is essential to the Karandana Sub-Post Office? (*b*) Is he aware that the people of Karandana a remote area, have to undergo immense difficulties during floods, etc. because there is no telephone service? (*c*) Will he therefore take action to provide this service without delay?

විජයපාල මෙන්ඩිස් මයා.
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

(අ) ඔව්. (ආ) ගංවතුර ඇති වූ විටදී ටෙලිෆෝන් සේවයට සාමාන්‍යයෙන් බාධා වන් පැමිණේ. කරඳන වැසියන්ට ඇල්ලගාව උප තැපැල් කාර්යාලයෙන් ටෙලිෆෝන් පහසුකම් ලබාගත හැකිව තිබේ. කරඳන ලිපි හිමියන්ට විදුලි පණිවුඩ බෙදනු ලබන්නේ ඇල්ලගාව උප තැපැල් කාර්යාලයෙනි. (ඉ) ටෙලිෆෝන් පහසුකම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සැපයීම පිණිස අවශ්‍ය වෙනත් කාර්යාල සමග මෙම කාර්යාලයද උචිත වේලාවට සලකා බලනු ඇත.

විසර්ජන කෙටුම්පත් පනත, 1968-69

ஒதுக்கீட்டு மசோதா, 1968-69

APPROPRIATION BILL, 1968-69

කල් තබන ලද විවාදය තව දුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය [අගෝස්තු 2]

“කෙටුම්පත් පනත දැන් දෙවන වර කියවිය යුතුය.”—[ගරු වන්නිනායක]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

ஆகஸ்ட் 2 ஆம் தேதிய வினா மீதான ஒத்திவைக்கப் பெற்ற விவாதம் மீள ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

“மசோதா இப்பொழுது இரண்டாம் முறை மதிப் பிக்கப்படுமாக” [கௌரவ வன்னிநாயக்க].

வினா, மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

Order read for resuming Adjourned Debate on Question—[2nd *August*]

“That the Bill be now read a Second time”.—[*The Hon. Wanninayake*]

Question again proposed.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

I would request hon. Members to keep strictly to the time allotted to them by their respective Party Whips.

පූ. භා. 10.18

මෛත්‍රීපාල සේනානායක මයා. (මැදවච්චිය)
(திரு. மைத்திரிபால சேனநாயக்க—மதவாச்சி)
(Mr. Maithripala Senanayake—Medawachchiya)

ගරු කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂයේ නැත්නම් හත් හවුල් ආණ්ඩුවේ 4 වෙනි අයවැය ලේඛනය දෙවැනි වර කියවීමේ විවාදය ආරම්භ කිරීමේ පළමුවැනි කථාව කිරීමට විරුද්ධ පක්ෂය වෙනුවෙන් මට අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා.

මේ රටේ මහජනතාව, ඒ කියන්නේ පොදු මහ ජනතාව, මේ හතරවැනි අයවැය ලේඛනය ගැන ලොකු බලාපොරොත්තුවක් ඇති කර ගෙන සිටියා. මේ අයවැය ලේඛනයෙන්වත් ඒ අයට යම්කිසි සහනයක් ලැබෙනවා ඇතැයි ඒ අය ලොකු බලාපොරොත්තුවකිනුයි සිටියේ. ගරු මුදල් ඇමතිතුමා විසින් පළමුවැනි අයවැය ලේඛනය ඉදිරිපත් කරන අවස්ථාවේදීත් මහජනතාව ඒ විධියේ බලාපොරොත්තු ඇතිව සිටියත් ඔවුන් කල්පනා කළා, ආණ්ඩුවක් වෙනස් වී අලුත් ආණ්ඩුවක් පිහිටෙවූ වහාම මැතිවරණ කාලයේදී දුන්න පොරොන්දු, මහජනතාව බලාපොරොත්තු වූ සහන, ලබා දීම මුදල් ඇමතිවරයාට ඒ තරම් පහසු දෙයක් නොවන බව. පළමුවැනි අයවැය ලේඛනයෙන්ම මුදල් ඇමතිතුමාට එවැනි දෙයක් කිරීම ඒ තරම් පහසු දෙයක් නොවෙයි. නමුත් මේ රජයේ දෙවැනි අයවැය ලේඛනය ගැනත් මහ ජනතාව ලොකු බලාපොරොත්තුවක් ඇති කර ගෙන සිටියා. ඒ අවස්ථාවේදී පොදු මහජනතාවට යම්කිසි සහනයක් සැලසේ විය කියා කොයි තරම් ලොකු බලාපොරොත්තුවක් ඒ අය ඇති කර ගෙන සිටින්න ඇත්ද කියා විස්තර කරන්න වුවමනාවක් නැහැ. නමුත් ඔවුන්ට එවැනි සහනයක් එයින් ලැබුණේත් නැහැ. ඊළඟට තුන්වැනි අයවැය ලේඛනයෙන් ලැබුණේත් එවැනිම තත්ත්වයකුයි. දැන් මේ ආණ්ඩුව විසින් හතරවැනි අයවැය ලේඛනයක් ඉදිරිපත් කර තිබෙනවා. නීත්‍යානුකූලව නම් මේ ආණ්ඩුවට මේ රට පාලනය කිරීමට අයිතිය තිබෙන්නේ තව ස්වල්ප කාලයක් පමණයි. අවුරුදු තුනහමාරක් තිස්සේ මේ ආණ්ඩුව විසින් මේ රටේ පාලන තන්ත්‍රය අතට අරගෙන කටයුතු කර ගෙන ගියා. මේ කාලය ඇතුළත කළ යුතු වෙනස්කම් කර, මේ හතරවැනි අයවැය ලේඛනයෙන්වත් මහජනතාවට යම්කිසි සහනයක් සලසා දේවිය කියා පොදු මහජනතාව කල්පනා කළා. නමුත් ඒ බලාපොරොත්තුව මේ වරත් සුන්වී ගොස් තිබෙන බව කනගාටුවෙන් වුවද අපට කියන්නට සිදුවී තිබෙනවා.

මේ අවුරුදු තුනහමාර ඇතුළත ඉදිරිපත් කර තිබෙන අයවැය ලේඛන හතරෙන් පොදු මහජනතාව බලාපොරොත්තු වුණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මෛත්‍රීපාල සේනානායක මයා.]

සහනය නොලැබුණත්, මේ හත් හවුල් ආණ්ඩුව ඒ අයගේ මහජනතාව හැටියට සලකන විදේශීය ධනපතියන්ටත් දේශීය ධනපතියන්ටත් කිසිම අඩුවක් නැතිව ලබා දිය යුතු සම්පූර්ණ සහනය මේ අවුරුදු තුනහමාර ඇතුළත ලබාදී තිබෙන බව වැඩිපුර විස්තර සහිතව කියන්නට වුවමනා කරන්නේ නැහැ. දළ වශයෙන් බැලුවොත් මේ අවුරුදු තුන හමාර තුළදී ස්වදේශික හා විදේශික ධනපතියන්ට සහන වශයෙන් රුපියල් කෝටි දෙසීයක පමණ මුදලක් මේ හත් හවුල් ආණ්ඩුවෙන් ලැබී තිබෙනවා යයි අපට ප්‍රකාශ කරන්නට පුළුවනි. ඒ වාගේම මේ අවුරුදු තුන හමාර තුළදී පොදු මහජනතාවට දළ වශයෙන් රුපියල් කෝටි තුන්සිය තිස්හයක බරක් පටවා තිබෙන බවත් කියන්නට පුළුවනි. පොදු මහජනතාවට සහන සලසා දෙනවා යයි කී, ඉර හඳ දෙනවා යයි කී උදවියට පාලන බලය ලැබුණායින් පසුව දළ වශයෙන් රුපියල් කෝටි තුන්සිය තිස්හයක බරක් ඒ මහජනතාව පිට පටවා තිබෙනවා.

අයවැය ලේඛනයකදී පොදුවේ කාරණා දෙකක් ගැන කල්පනා කර බැලීම සිරිතයි. ඉන් එකක් නම් සහන දී තිබෙන්නේ කාටද යන්නයි. තවත් විධියකට කියතොත් කුමන පංක්තියකට සහන සලසා දී තිබෙනවාද යන්නයි. අනෙක් කාරණය නම් මහජනතාව ඕනෑකමින් බලාගෙන සිටින රැකිරක්ෂා ප්‍රශ්නය ජීවන වියදම් ප්‍රශ්නය විසඳීම සඳහා පියවරවල් ගෙන තිබෙනවාද යන්නයි. මේ හත් හවුල් ආණ්ඩුව ඇති වුණායින් පසුව පසුගිය අවුරුදු තුන හමාර තුළදී හා විශේෂයෙන් මේ අවුරුද්දේදී ඔය දෙවනුව කී ප්‍රශ්න දෙක මොන විධියට විසඳා තිබෙනවාදැයි මොහොතක් කල්පනා කර බලමු.

1965 මාර්තු මාසයේ 25 වැනිදා අග මැතිතුමා දිවුරුම් දීමෙන් පසුව මෙම හත් හවුල් ආණ්ඩුව ඇතිකොට පැය විසිහතරක් තුළදී කරන ලද ප්‍රකාශය මට මතකයි. "තෙල් කොම්පැනිකාරයන්ට දීමට තිබෙන වන්දි මුදල් වහාම ගෙවන්නට යනවා." යනුවෙන් කරන ලද ඒ ප්‍රකාශය එතුමා මේ හත් හවුල් ආණ්ඩුව පිහිටුවීමෙන් පසුව කරන ලද පළමුවැනි ප්‍රකාශයයි. තෙල් වන්දි ප්‍රශ්නය විසඳා අවසන් වුණායින් පසුව මේ ආණ්ඩුවේ කුළුපග මිත්‍රයන් වශයෙන් සලකනු ලබන ඇමෙරිකා එක්සත් ජනපදය හා බටහිර ජර්මනිය වැනි රටවලින් ආධාර ගලා එතැයි එතුමා අදහස් කරන්නට ඇති.

ඇත්තෙන්ම මේ කාල සීමාව තුළදී මේ ආණ්ඩුව වැඩිපුරම සහන දී තිබෙන්නේ කාටද? මා මුලින් කීවා වාගේ තෙල් කොම්පැනිකාරයන් බලාපොරොත්තු වූ වන්දි මුදල ඔවුන්ට දුන්නා. වන්දි විනිශ්චය මණ්ඩලයේ තක්සේරුවටත් වැඩි ප්‍රමාණයක් දෙන්නට විශේෂ නීති ඉදිරිපත් කර සම්මත කර ගත්තා. එය මේ ආණ්ඩුවේ පළමුවැනි ක්‍රියාවයි. ඊළඟට කෙළේ මොකක්ද? 1964 අවුරුද්දේ සිට, විදේශ කොම්පැනිකාරයන් මේ රටින් උපයන ලාභ මුදල් පිටරට ගෙන යෑම තාවකාලිකව තහනම් කර තිබුණා. මේ ආණ්ඩුව විදේශීය ධනපති කොම්පැනිකාරයින්ට එයිනුත් සහනයක් දී තිබෙනවා. සියේට 45 ක් වූ ප්‍රාග්ධන ලාභ බද්ද සියේට 25 දක්වා මේ ආණ්ඩුව අඩු කර තිබෙනවා. එය තුන්වැන්න වශයෙන් සඳහන් කරන්නට පුළුවනි. කොම්පැනි බද්ද සියේට 57 සිට 50 දක්වා අඩු කළා. එයිනුත් නතර නොවී මේ ආණ්ඩුව non-resident companies නමින් හඳුන්වනු ලබන, ලංකාවේ පදිංචිය නැති අයගේ කොම්පැනිවලින් අය කළ බද්ද සියේට 70 සිට 61 දක්වා අඩු කර තිබෙනවා. මේ ආණ්ඩුව කළ තවත් දෙයක් නම් ලංකාවේ සිටින විදේශිකයන්ගෙන් අය කළ වීසා බද්ද නැති කර දැම්මයි. විදේශ බැංකුකාරයින්ට තිබුණු අවහිරකම් ආදියත් මේ ආණ්ඩුව නැති කර දැම්මා. විදේශ බැංකුවල ලාංකිකයන් මුදල් තැන්පත් කිරීම සම්බන්ධයෙන් යම් යම් අවහිර තිබුණා. ඊයේ පෙරේදා නීතියක් සකස් කර ඒවාත් අස් කර දැම්මා. දහස් ගණන් පෞද්ගලික කොම්පැනිකාරයින්ට තිබුණු අලාභ පවා අනෙක් කොම්පැනිකාරයින්ගේ ලාභවලින් කපාගන්නට මාර්ගයක් මේ ආණ්ඩුව සලසා තිබෙනවා. ඔන්න ඕවා තමයි පසුගිය අවුරුදු තුනහමාර තුළදී මේ ආණ්ඩුව විදේශීය සහ ස්වදේශීය ධනපතියන්ට දී තිබෙන සහන.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සාමාන්‍ය පොදු මහජනතාවට මොන විධියේ සහන දී තිබෙනවාදැයි ඊළඟට බලමු. හාල් සලාකය සම්බන්ධයෙන් කර තිබෙන්නේ මොකක්ද? හාල් සේරුව ශත 25 බැගින් සතියකට හාල් සේරු දෙකක් ලබා ගැනීමේ වරප්‍රසාදය 1960 සිට මේ රටේ මහජනතාවට තිබුණු නමුත් එයින් එක් සේරුවක් නිකම් දෙනවා. ඇත්ත වශයෙන්ම එහි නියම ප්‍රතිඵලය කුමක්ද? ශත පණහකට හාල් සේරු දෙකක් ලබාගත් ජනතාවට අද සිදු වී තිබෙන්නේ එක් හාල් සේරුවක් නොමිලයේ ලබමින් දෙවැනි හාල් සේරුව සඳහා රු. 1.25 ක්, 1.30 ක් නැත්නම් 1.50 ක් ගෙවන්නටයි. ඔන්න ඔය විධියේ තත්ත්වයකට ජනතාව පත් කර තිබෙනවා. සාමාන්‍ය පොදු මහජනතාවට අවශ්‍ය වෙනත් ආහාරපාන ගැනත්, ළදරුවන්ට වුවමනා කරන කිරි පිටි ගැනත්, කුළුබඩු ආදිය ගැනත් තත්ත්වය ඉතාමත් කනගාටුදායකයි. වැඩි මිලට ගැනීමට සිදු වීමත්, ලැබෙන ප්‍රමාණය පවා අවුන්ස ගණනකට සීමා වී තිබීමත්, මේ ආණ්ඩුව පොදු මහජනතාවට දුන් සහනයන් හැටියට මේ ආණ්ඩුව කල්පනා කරතත්, එය ඇත්ත වශයෙන්ම පොදු මහජනතාව පිට පටවන ලද බරක් බව මේ අවස්ථාවේ කියන්නට ඕනෑ.

සාමාන්‍ය පොදු මහජනතාව බලාපොරොත්තු වූ සහන වෙනුවට ගරු මුදල් ඇමතිතුමා දී තිබෙන්නේ මොනවාද? සිගරට් මිල වැඩි වුණා. සාමාන්‍ය මනුෂ්‍යයා පාවිච්චි කරන අරක්කු බෝතලේ මිල පවා රුපියල් අටේ සිට දහය දක්වා වැඩි කළා. රුපියල් දහයේ අරක්කුවල මිල වැඩි වුණේ නැහැ. අරක්කු බීම හොඳ දෙය කැයි අපි කියන්නේ නැහැ. එහෙත් සාමාන්‍ය මනුෂ්‍යයා එය පාවිච්චි කරනවා. තමාගේ විනෝදය සඳහාත්, මහන්සි වූ විට යම් ප්‍රමාණයක සහනයක් ලබා ගැනීම පිණිසත්, ඇතැම් අය එය පාවිච්චි කරනවා. එහි මිල පවා ගරු මුදල් ඇමතිතුමා වැඩි කර තිබෙනවා. ඒ හැර, සියේට පහක්ව තිබුණු පිරිවැටුම් බද්ද එක පැන් පහරින්ම සියේට 10 ක් කර තිබෙනවා. සාමාන්‍ය දුප්පත් පාරිභෝගිකයාට අවශ්‍ය සෑම දෙයකම මිල සියේට පහකින් ඒ අනුව වැඩි කර තිබෙන බව කියන්නට දැන් අපට සිද්ධවෙලා තිබෙනවා.

විදේශ විනිමය හිමිකම් සහතික ක්‍රමය හේතුකොටගෙන අද සෑම බඩුවකම පාගේ මිල වැඩි වී තිබෙනවා. එයිනුත් විශේෂයෙන් එක් කාරණයක් ගැන සඳහන් කරන්න කැමතියි. වර්තමාන රජය අපේ අධ්‍යාපන ක්‍රමය ප්‍රතිසංවිධානය කරගෙන යනවාය කියනවා. අධ්‍යාපනය ලබන්නවුන්ට—විශේෂයෙන්, උසස් අධ්‍යාපනය ලබන්නවුන්ට—ලොකු ධෛර්යයක්, රුකුලක් දෙනවාය කියන මේ රජය අඩු ගණනේ පොත් පත්වල මිල සම්බන්ධයෙන්වත් යම්කිසි සහනයක් ඇති කරාවි යයි අප බලාපොරොත්තු වුණා. එහෙත් අද මොකක්ද සිදු වී තිබෙන්නේ? මේ රජය පොහොසතුන්ට නම් රුපියල් දහස් ගණන්වලින් සහන සලසා දී තිබෙනවා. එහෙත් උසස් අධ්‍යාපනයක් ලබන දුප්පත් ගැමි දරුවන්ට සිදු වී තිබෙන්නේ මොකක්ද?

වෛද්‍ය ශාස්ත්‍රය ඉගෙන ගැනීමේදී අවශ්‍ය වන, පිටරටින් ගෙන්වන පොත් කීපයක්ම තිබෙනවා. "Gray's Anatomy" නමැති ඉංග්‍රීසි පොත රුපියල් 140 ත් රුපියල් 175 ත් අතර ගණනකට වැඩි වී තිබෙනවා. ඊට විශේෂයෙන්ම හේතු වී තිබෙන්නේ විදේශ විනිමය හිමිකම් සහතික ක්‍රමයයි. "Datta's Biochemistry" නමැති පොත දැන් රුපියල් 25 ක් වී තිබෙනවා. "Cunningham's Practical Anatomy" කියන පොත දැන් රුපියල් 98 යි. නීතිය ඉගෙන ගන්නා අයට අවශ්‍ය පොතක් වන "Kenny's Criminal Law" නමැති පොත දැන් රුපියල් 85 යි. "Lee's Roman Dutch Law" නමැති පොත රුපියල් 56 ක් වී තිබෙනවා. "Cheshire's Contracts" නමැති පොතේ දැන් මිල රුපියල් 65 යි. උසස් අධ්‍යාපනය ලැබීම සඳහා කිසිම පහසුකමක් නොමැතිව සිටි දුප්පත් දරුවන්ට සැහෙන කාලයක සිට විශ්ව විද්‍යාලයේ දොරටුව පවා ඇරී තිබෙන අවස්ථාවක, ඔවුන් උනන්දුවෙන් ඉගෙන ගන්නා අවස්ථාවක, තමන්ට අවශ්‍ය පොත් මිල දී ගැනීමට මේ විධියට වියදම් කරන්නට දැන් ඔවුන්ට සිදු වී තිබෙනවා. ඔවුන් එවැනි අසීරු තත්ත්වයකට පත් කිරීම සාධාරණදැයි මුදල් ඇමතිතුමාගෙන් අහන්න කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මෛත්‍රීපාල සේනානායක මයා.]

මේ රටට අනවශ්‍ය පොත් පිටරටින් ගලා එන බවත්, විදේශ විනිමය හිමිකම් සහතික ක්‍රමය යටතේ දැන් ඒවා ගෙන්වීමට සිදු වී ඇති බවත්, ඊයේ පෙරේදා ප්‍රවෘත්ති පත්‍රයක පළ වී තිබෙනවා මා දුටුවා. ලංකාවට ගෙන්වන සෑම පොත පතකටම සහනයක් දෙන්නැයි මා කියන්නේ නැහැ. විශේෂයෙන්, අධ්‍යාපන කට යුතු සඳහා අවශ්‍ය පොත් පත් ටිකටවත් යම්කිසි සහනයක් දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. ජාතික උසස් අධ්‍යාපන මණ්ඩලයක් තිබෙනවා නොවෙයිද? ඒ මණ්ඩලය මගින්වත්, උසස් අධ්‍යාපනය ලබන ඒ දුප්පත් ශිෂ්‍යයන්ට අර විධියේ සහනයක් දෙන්නේ නැත්තේ ඇයි?

ඊළඟට අපි බලමු, මේ රටේ ධනපතියන්ට රජය කොයි තරම් සහන දී තිබෙනවාද, දුප්පතුන්ට කොයි තරම් සහන දී තිබෙනවාද කියා. මෙවර අයවැය යෝජනා අනුව, රුපියල් 5,000 ක වාර්ෂික ආදායමක් තිබෙන කෙනකුට රුපියල් 60 ක ආදායම් බද්දක් ගෙවන්නට සිදු වී තිබෙන අතර, එවැන්නකු මීට කලින් ගෙවූයේ රුපියල් 50 ක් පමණයි. රුපියල් 6,000 ක වාර්ෂික ආදායමක් ලබන්නකු කලින් ආදායම් බදු වශයෙන් රුපියල් 150 ක් ගෙවූ අතර, අළුත් යෝජනා අනුව රුපියල් 135 ක් ගෙවන්නට සිදු වී තිබෙනවා. ලක්ෂයක ආදායමක් ඇති කෙනකුට මෙතෙක් කල් බදු වශයෙන් ගෙවන්නට සිදු වූ රුපියල් 56,350 වෙනුවට අලුත් බදු ක්‍රමය අනුව ගෙවන්නට සිදු වන්නේ රුපියල් 46,865 ක් පමණයි. ඒ අනුව ලක්ෂයක ආදායමක් ඇති අයට රුපියල් 10,000 ක සහනයක් සලසා දී තිබෙනවා. රුපියල් දෙලක්ෂයක වාර්ෂික ආදායමක් ලැබූ අය රුපියල් 1,36,000 ක බද්දක් මෙතෙක් කල් ගෙවූ නමුත්, අලුත් බදු ක්‍රමය යටතේ එවැනි අයට ගෙවන්නට සිදු වන්නේ රුපියල් 1,11,000 ක බද්දක් පමණයි. ඒ අනුව දෙලක්ෂයක ආදායමක් ලබන අයට වර්ෂයකට රුපියල් 24,000 ක සහනයක් සලසා දී තිබෙනවා. ඔය අන්දමට මේ ආණ්ඩුව සහන සලසා දී තිබෙන්නේ ධනපති පන්තියට බව කියන්නට සිදු වී තිබෙනවා. මා මුලිනුත් සඳහන් කළ අන්දමට පසුගිය මහ මැතිවරණයේදී මහජනතාවට දුන් පොරොන්දු සහමුලින්ම අමතක කර දමා පසුගිය අවුරුදු $3\frac{1}{2}$ ඇතුළත මේ ආණ්ඩුව සහන සලසා දී තිබෙන්නේ විදේශික හා ස්වදේශික ධනපති පන්තියට පමණයි කියන එක නැවතත් කියන්නට සිදු වී තිබෙනවා. මේ අවුරුදු $3\frac{1}{2}$ ඇතුළත ධනපති අයට කෝටි 200 ක සහන සලසා ඇති අතර, දුප්පත් අයගේ කර පිට කෝටි 336 ක බරක් මේ හත් හවුල් ආණ්ඩුව මේ ආණ්ඩුවේ අයවැය ලේඛන හතරෙන් පටවා තිබෙන බව කියන්නට ඕනෑ.

මේ රජය වගා ව්‍යාපාරය ගැන ලොකුවට ප්‍රචාරයක් ගෙන යන මේ අවස්ථාවේ ඇත්ත වශයෙන්ම ඒ පිළිබ නියම තත්ත්වය කුමක්ද කියා අපි බලමු. වගා ව්‍යාපාරය දියුණු වේගන යන බවක් අපට දිනපතාම ගුවන් විදුලියෙන් අහන්නට ලැබෙනවා. එහෙත් පුදුමය නම් සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන්නේ 1965, 1966 හා 1967 යන වර්ෂවලට පමණක් වීමයි. ඊට කලින් අවුරුදුවල සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන්න කැමැත්තක් දක්වන්නේ නැහැ. එයට හේතුව කුමක්ද? 1964 ගැන කිව්වොත්—මැතිණියගේ රජය කාලයේදී—එම වර්ෂයේ වී නිෂ්පාදනය බුසල් 5,05,00,000 ක් දක්වා දියුණු වී තිබුණු බව පෙනෙනවා. 1965 වන විට එම ප්‍රමාණය බුසල් 3,03,00,000 ක් දක්වා අඩු වුණා. 1965 ට කලින් සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කළොත් අන්න ඒ වෙනස පෙනෙන නිසා ඒ අවුරුදුවල සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන්න කැමති නැහැ.

සාමාන්‍යයෙන් මුල සිටම වී නිෂ්පාදනය පිළිබඳ තත්ත්වය කුමක්ද කියා අපි මීළඟට බලමු. 1955 දී වී නිෂ්පාදනය බුසල් කෝටි $3\frac{1}{2}$ යි. ඒ ගරු ඩී. එස්. සේනානායක අගමැතිතුමා යටතේ මේ එක්සත් ජාතික පක්ෂය ආණ්ඩු කළ අවුරුදු 9 තිස්සේ වී වගාව දියුණු කළ ප්‍රමාණයයි. ඒ කාලයේ කෘෂිකර්ම ඇමති වශයෙන් සිටියේ වර්තමාන අගමැති ඩඩ්ලි සේනානායක මහතායි. තවත් විස්තර වශයෙන් කියනවා නම්, මේ රට නිදහස ලබන්නටත් කලින් 1931 සිට 1956 දක්වා මේ එක්සත් ජාතික පක්ෂය කරන අයගේ අතේ බලය තිබුණු කාලයේ වී නිෂ්පාදනය දියුණු කළේ බුසල් 3,50,00,000 දක්වා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පමණයි. එම ප්‍රමාණය 1956 දී 2,69,00,000 දක්වා අඩු වුණා. ඒ අනුව සියයට 23 කින් අඩු වී තිබෙනවා. 1957 දී වී නිෂ්පාදනය බුසල් 3,00,60,000 දක්වා දියුණු වුණා. 1958 දී වී නිෂ්පාදනය 3,66,00,000 දක්වා දියුණු වුණා. 1959 දී එම ප්‍රමාණය බුසල් 3,65,00,000 දක්වා දියුණු වුණා. 1960 දී එම ප්‍රමාණය බුසල් 4,31,00,000 දක්වා දියුණු වුණා. 1961 දී වී වගාව බුසල් 4,32,00,000 දක්වා දියුණු වුණා. 1962 දී එය බුසල් 4,81,00,000 දක්වා දියුණු වුණා. 1963 දී එය 4,92,00,000 දක්වා දියුණු වුණා. 1964 දී—ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවේ අවසාන අවුරුද්දේදී—වී වගාව 5,05,00,000 දක්වා දියුණු වුණා. එහෙත් 1965 දී එය බැස්සා, 3,63,00,000 දක්වා. 1966 දී එය 4,57,00,000 දක්වා නැග්ගා. 1967 දී එය 5,51,00,000 දක්වා නැග්ගා. එහෙත් ප්‍රචාරය ගෙන යන්නේ 1965 ට කලින් වී වගාව දියුණු කිරීම සම්බන්ධ යෙන් කිසිම දෙයක් කෙරුණේ නැත කියා පෙනෙන විධියටයි.

ගරු කථානායකතුමනි, අද ගම්බදව තිබෙන තත්ත්වය කුමක්ද? විශේෂ යෙන්ම උතුරු මැද පළාත වැනි වියළි ප්‍රදේශවල අද තිබෙන තත්ත්වය කුමක්ද? අවාසනාවකට මෙන් පසුගිය පෙබරවාරි මාසයේ සිට අද වන තෙක් එකම වැහි බින්දුවක්වත් ඒ ප්‍රදේශයට ලැබී නැහැ. ඒ පළාත්වල ගොවීන් ගොවිතැන් කටයුතු කරගෙන යන්නේ ඉතාමත් අමාරුවෙනුයි. ආණ්ඩුවේ වගා ව්‍යාපාරය ගැන අපේ කිසිම් විරුද්ධත්වයක් නැහැ. එහෙත් එවැනි දුෂ්කර ප්‍රදේශවල ගොවි ජනතාවට ආණ්ඩුවෙන් විශේෂ වරප්‍රසාද ලබා දෙනවා ඇතැයි අප බලාපොරොත්තු වෙනවා. මේ රජයෙන් සිදු වී තිබෙන්නේ කුමක්ද? අපේ පළාත්වල සිරිතක් වශයෙන් වැව් තාවලු ගොවිතැන් කෙරෙනවා. පුරාණයේ සිටම වැව් තාවලු ගොවිතැන පිළිබඳ ඒ වැඩ පිළිවෙළ කෙරෙන්නේ අත්හදා බැලීමක් අනුවයි. වර්ෂාව පිළිබඳව විශ්වාසයක් තබන්නට බැරි නිසා—දෙකන්නක්ම වැඩ කර ගන්නට පුළුවන් වේදෝ යන අවිශ්වාසය නිසා—අපේ පළාත්වල ගොවීන්, වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ නීති රීති අනුව ගොවිතැන් කිරීමේ වැඩ පිළිවෙළක් අනුගමනය කරනවා. ඒ අනුව ඔවුන් හේන් ගොවිතැන් කරනවා; වැව් තාවලු ගොවිතැන් කරනවා; සාමාන්‍ය කුඹුරු ගොවිතැන් කරනවා. එහෙත් මේ රජයේ වැඩ පිළිවෙළ නිසා වී වගාව දියුණු කිරීමට මහන්සි ගත් ඒ ගොවීන් අද විශාල අධෛර්යයකට පත් වී සිටිනවා. ට්‍රැක්ටර් යොදවා වැව් තාවලු ගොවිතැන් කරන මුදලාලිලාට මේ සහනය දෙන්නය කියා මා කියන්නෙ නැහැ. ඒ වැව් යටතේ ඇති ඉඩම් හිමියන්, වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ නීති රීති අනුව සිරිතක් වශයෙන් කරන වැව් තාවලු ගොවිතැන නිසා ඔවුන්ට සිදු වුණේ මේ අවුරුද්දේ රුපියල් 150 ක් දඩ කන්නටයි.

ගොවි ණය පහසුකම් සැලසීම සම්බන්ධ යෙන් සිදු වී තිබෙන දේ ගැන බලමු. අපේ කාලයේදී සියයට 6 පොලියට අප ගොවීන්ට ණය දුන්නා. අද ඒ පොලී ප්‍රමාණය සියයට 12 දක්වා නංවා තිබෙනවා. එසේ නංවා තිබෙද්දී අද සිදු වන්නේ කුමක්ද? පසුගිය පෙබරවාරි මාසයේ සිට වැහි බිංදුවක්වත් නොලැබීම නිසා ඒ ප්‍රදේශයේ සමහර ගම්වල ජනතාව අද කන්නට පවා දෙයක් නැතිව ඉතාමත් අසරණ තත්ත්වයකට වැටී සිටිනවා. එවැනි අසරණ තත්ත්වයකට වැටී සිටින අවස්ථාවේදී ඔවුන්ගේ හාල් කුපන් පොත් ටිකත් තහනම් කිරීමෙන් ඒ ගොවි ජනතාවට විශාල පහරක් ගසා තිබෙන බව කියන්නට සිදු වී තිබෙනවා.

ගරු කථානායකතුමනි, විවිධ සේවා සමුපකාර සමිති මගින්, ගොවිතැන් කිරීම සඳහාත්, බිත්තර වී සඳහාත්, පෝර සඳහාත් වශයෙන් කොටස් තුනකට ගොවි ණය දෙනවා. ඒ ණය ලබා ගන්නට පුළුවන් වන්නේ පළමුවෙන් අත්සන් කරලයි. නමුත් පදවිය වැනි ගොවි ජනපද තිබෙන ප්‍රදේශවලත් තවත් ගම්බද ප්‍රදේශ කිපයකත් ගොවීන්ට පොහොර සපයා නැති නමුත් අත්සන් කළ නිසා මුදල් ගෙවන්නය කියනවා. එවැනි වැඩ පිළිවෙළක් අද ඒ ප්‍රදේශවල ගෙන යන බව මා දන්නවා. සමහර විට දෙපාර්තමේන්තුව මේ කාරණය ගැන දන්නේ නැතිව ඇති. නමුත් අත්සන් කළ පළියට—ඒ කියන්නේ පොහොරත් ගන්නවාය කියා අත්සන් කළ පළියට—

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මෛත්‍රීපාල සේනානායක මයා.]

නොලැබුණු පොහොරවත් මුදල් ගෙවන්නට, ණය මුදල් ලබා ගන්නට යම් යම් අවස්ථාවලදී සිද්ධ වී තිබෙනවා. මේ තත්ත්වය දිසාපතිතුමාට පෙන්වා දෙන්නට අපට පුළුවන් වුණා. ඒ වාගේම යම් යම් ස්ථානවල පොහොර ගෙනැවිත් පිට තැන්වලට විකුණා තිබෙනවා. මෙවැනි හොර මැරකම්වලට අවස්ථාව ලැබී තිබෙන නිසා මහජනතාවට කිසිම සහනයක් නොලැබෙන තත්ත්වයක් දැන් ඇතිවී තිබෙනවා.

තවත් විශේෂයෙන්ම මතක් කළයුතු කාරණයක් තිබෙනවා. ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා මේ අවස්ථාදේ සභා ගර්භය තුළ සිටීම ගැන මා සතුටු වෙනවා. මගේ කොට්ඨාශයේ යම් වැඩ බලන ආදායම් පාලක නිලධාරියකු ගැන ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාට පැමිණිලි කරන්නට මට සිද්ධ වුණා. මේ රටේ ආදායම් පාලක නිලධාරිවරුන් වශයෙන් සථිර සේවයට පත්ව සේවය කළ අය අද උසස් ස්ථානවල සිටින බව මා ආඩම්බරයෙන් ප්‍රකාශ කරනවා. ඒ සමහර අය අද ඇමතිවරුන් වශයෙන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වශයෙන් හා දිසාපතිවරුන් වශයෙන් මේ රටේ වගකිවයුතු ස්ථාන භාරව කටයුතු කරනවා. නමුත් මා සඳහන් කරන මේ ආදායම් පාලක නිලධාරියා නිසා මොකක්ද ඇතිවී තිබෙන තත්ත්වය ? වල් ගම කියන මේ නිලධාරියා ආදායම් පාලක නිලධාරී වශයෙන් වැඩ බලන්නට එවා තිබෙන කෙනෙක්. ඔහු බොහොම දක්ෂයි එක් කරුණකට. ඔහු වගා කරන්නේ කොහොමද ? යම් කෙනෙකු ඉඩමකට තාවකාලික බදු ඔප්පුවක් ගන්නට ඉල්ලුම් කළොත් රුපියල් 100 ක් නොදී ඒ වැඩේ මේ නිලධාරියාගෙන් කරවා ගන්නට බැහැ. මා ගරු ඇමතිතුමාට මේ නිලධාරියා ගැන පැමිණිලි කළා.

මේ කාරණය ගැන මේ ගරු සභාවේදීත් ප්‍රසිද්ධියේ කථා කළයුතුය කියා මා කල්පනා කරනවා. ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා මේ වැඩ බලන ආදායම් පාලක නිලධාරියා මාරු කරන්නටය කියා නියෝග කර තිබුණා. ඇත්ත වශයෙන්ම ඔහු ආදායම් පාලක නිලධාරියකු නොවෙයි ; ඒ තනතුරේ වැඩ බලන්නට එවා තිබෙන පුද්ගලයෙක් ; ලිපිකරු මහත්මයෙක්. මොහුගේ ක්‍රියා කලාපය නිසා අද ඒ ප්‍රදේශයම ගඳ ගහනවාන ගරු ඇමතිතුමා 7 වන දා එහෙ ගියාය කියා මට ආරංචියි. එදා ඔබතුමාට ගෞරව කිරීමට, ඔබතුමා ගෙන යන වැඩ පිළිවෙළට සහයෝගය දැක්වීමට මහජනතාව නොපැමිණුණා නම් ඒකට හේතුව මේ වැඩ බලන ආදායම් පාලක නිලධාරියාගේ ක්‍රියා කලාපය බව මා සඳහන් කරන්නට සතුටුයි. මා එදා ඔබතුමාට පැමිණිලි කළා. මේ වැඩ බලන ආදායම් පාලක නිලධාරියා මාරු කරන්නටය කියා දිසාපතිතුමාත් ඉල්ලුම් කර තිබෙනවා. මොහුගේ අල්ලස් දූෂණය කොයි තරම්ද කියනවා නම් එක මිනිසකුට තාවකාලික බදු ඔප්පුවක් දී මාස තුනක් ගත වන්නට ප්‍රථමයෙන් ඒක වෙනස් කර ඉඩම තවත් කෙනෙකුට දෙනවා. මිල මුදලටයි මේවා කරන්නෙ. මේ සියලුම දේවල් මට ඔප්පු කරන්නට පුළුවනි. මේ නිලධාරියා ගැන මා ගරු ඇමතිතුමාගෙන් ප්‍රශ්න මාලාවක් අසා තිබෙනවා. මහජනතාවත් දැන් බැරිම තැන අල්ලස් කොමසාරිස්තුමාටත් ගරු ඇමතිතුමාටත් මොහුගේ ක්‍රියා කලාපය ගැන පෙත්සම් යවා තිබෙනවා. මොහුගෙන් බේරෙන්නට බැරි තත්ත්වයකට දැන් ඒ ප්‍රදේශයේ මහජනතාව මුහුණපා සිටිනවා. ඉඩම් කච්චේරියක් ඇති වුණොත් මුදල් දෙන ප්‍රමාණයේ හැටියටයි ඒ ඉඩම් කච්චේරියෙ වැඩ කෙරෙන්නෙ. යම් සහනයක් දෙන්නය කියා ගොවියකු මේ නිලධාරියාගෙන් ඉල්ලීමක් කළොත් මුදල් දෙන පිළිවෙළටයි ඒ වැඩේ කෙරෙන්නෙ. නමුත් ප්‍රවාහණ ඇමතිතුමා මේ නිලධාරියා ආරක්ෂා කරන බව මට කණගාටුවෙන් කියන්නට සිද්ධ වී තිබෙනවා.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி. சொய்ஸா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

ලැජ්ජයි, ලැජ්ජයි.

මෛත්‍රීපාල සේනානායක මයා.
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayake)

ඇත්ත වශයෙන්ම මේ නිලධාරියාගෙන් රජයට වන අවැඩ ගැන ප්‍රවාහණ ඇමතිතුමා දන්නවා නම් එතුමා මේ නිලධාරියාව ආරක්ෂා කරාවිය කියා මා සිතන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැහැ. ප්‍රවාහණ ඇමතිතුමා එතුමාගේ ඡන්ද කොට්ඨාශයට ගියාම මේ නිලධාරියා ප්‍රවාහණ ඇමතිතුමා මුණගැසෙන්නට යනවා. ඒක තමයි කරන හපන්කම. මේ විධියේ පුද්ගලයින්ගෙන් වගා ව්‍යාපාරය දියුණු කරන්නට පුළුවන්ය කියා ප්‍රවාහණ ඇමතිතුමා කල්පනා කරනවා නම් ඊට වඩා ලොකු මෝඩකමක් තවත් නැති බව මා එතුමාට කියන්නට සතුටුයි. මොහු ගැන විභාගයක් පවත්වනවා නම් මා මේ චෝදනා සියල්ලක්ම ඔප්පු කරන්නට ලැස්තියි. විභාගයක් පවත්වන මෙන් ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාගෙන් තරයේම ඉල්ලා සිටිනවා. ඉඩමක් දෙන්නට අල්ලස් වශයෙන් මොහු රජයේ ජීප් එකෙන්ම, අසුවල් දවසේ, අසුවල් ගමේ සිට වී ගෝනි දෙකක් දමාගෙන අසුවල් ස්ථානයට ගෙනවුත් අසුවල් අය ලවා ඒ වී ගෝනි බැවාය කියාත් මට විස්තර වශයෙන් කරුණු ඉදිරිපත් කළ හැකි බව නිර්භයව ප්‍රකාශ කරනවා. පරිපාලන සේවයෙන් ඕනෑ කෙනකු පත් කරන්න. අපි කියන අය පත් කරන්න යයි අපි ඉල්ලන්නෙ නැහැ. මම කරුණු දෙකක් කියනවා. ආදායම් පාලක සේවය ඉතාමත් නම්බුකාර සේවයක් වශයෙන් මෙතෙක් කල් පැවතීගෙන ආවා. ඒක නැත කරන්න ඒකට ගොම ගහන්න එපා යයි මා ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාට මතක් කරනවා. මොනම ආණ්ඩුවක් යටතේ වුණත් රජයේ සේවකයන්ගෙන් මහජනයා බලාපොරොත්තු වෙන්නේ යුක්තිසහගත සේවය පමණයි. එවැනි අවංක සේවකයන් අද රජයේ සේවයේ සිටිනවා. එවැනි සේවකයන් සොයා ගැනීමට පුළුවන් තත්ත්වයක් තිබෙනවා. මා මුලින් කිව්වා වගේ පළමුවෙන් ආදායම් පාලක සේවයට තේරුණු උදවිය—අපේ ආහාර ඇමතිතුමාත් තවත් ගරු මන්ත්‍රීවරුන්—මේ ගරු සභාවේ ඉන්නවා. ඒ වගේම දැනට දිසාපතිවරුන් වශයෙන් සේවය කරන උදවියත් සිටිනවා. එම නිසා එවැනි උසස් සේවයකට නිගා නොකරන ලෙස නැවතත් මා ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අවංක සේවකයන් සොයා ගන්න බැරිකමක් නැති නිසා එවැනි ක්‍රියා ශූර අවංක සේවකයන් මෙම තනතුරුවලට පත් කරන ලෙස එතුමාට මතක් කරනවා.

ගරු කථානායකතුමනි, මේ රජය ධනපතියන්ට දී තිබෙන්නේ මොන විධියේ සහනයන්ද යන්නත්, දුප්පතුන් පිට පටවා තිබෙන්නේ මොන විධියේ කරදරද යන්නත් මා මුලින්ම තමුන්නාන්සේට පෙන්වා දුන්නා. දැන් මා මේ සභාව ඉදිරිපිට කියවන්ට අදහස් කරනවා, අගමැති කාර්යාලයෙන් නිකුත් කර තිබෙන චක්‍රලේඛයක්. අද මේ ආණ්ඩුවට පක්ෂපාතව ක්‍රියා කරන පත්‍ර සමාගම් මොන විධියේ වැඩ පිළිවෙළක් ගෙන යනවාද කියා ඒ චක්‍ර ලේඛයෙන් පැහැදිලි වෙනවා ඇති. එය නිකුත් වී තිබෙන්නෙ ඉංග්‍රීසියෙන් නිසා මම එය ඒ භාෂාවෙන්ම කියවනවා :

"Senate Bu'lding
Colombo. 3rd Dec. 1967.

Permanent Secretary,

The Ministry of Information and Broadcasting has on the instructions of the Hon. Prime Minister, commenced a very extensive and intensive drive stressing the necessity for hard work and production to contribute to the economic development of the country. Part of this campaign will be by raido and by means of posters and also by Press Advertisements. As far as Press advertisements are concerned I have been directed to take advantage of the Advertising Votes of Public Corporations.

For this purpose it is necessary to have for the year, about 400 pages in the Newspapers. It is suggested that your Ministry take up 25 full pages and make them available to the Ministry of Information and Broadcasting for utilization in this campaign. I shall be glad to know what the distribution of these 25 pages will be as amongst the Corporations under your Ministry."

ආර්. ප්‍රේමදාස මයා. (පළාත් පාලන ඇමතිගේ සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. ஆர். பிரேமதாச—உள்ளூராட்சி அமைச்சரதும், தகவல், ஒலிபரப்பு அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. R. Premadasa—Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information & Broadcasting)

So, what is wrong in that?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මෛත්‍රීපාල සේනානායක මයා.
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayake)

I shall tell you what is wrong. Please do not get excited. To continue:

"As the campaign on the directions of the Hon. Prime Minister is to commence immediately, I shall be grateful for an immediate reply, indicating the allocation of pages as between Corporations. Thereafter the Ministry of Information and Broadcasting will deal direct with the individual Corporation, if you agree.

Sgd. G. V. P. Samarasinghe,
Permanent Secretary,
Ministry of Defence & External Affairs, and Ministry of Information & Broadcasting"

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

වරද මොකක්ද ?

මෛත්‍රීපාල සේනානායක මයා.
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayake)

මෙන්න වරද. මේකයි, ගෙවන පිළිවෙල :

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

මොන කාරණයක් සඳහාද ?

මෛත්‍රීපාල සේනානායක මයා.
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayake)

එක් එක් සංස්ථාවේ හා දෙපාර්තමේන්තුවේ ප්‍රචාර සඳහා—

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

ඔය චක්‍ර ලේඛයේම තිබෙනව. මොන කාරණයක් සඳහාද කියා.

මෛත්‍රීපාල සේනානායක මයා.
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayake)

මම චක්‍ර ලේඛය සම්පූර්ණයෙන්ම කියෙව්වා.

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

කරුණාකරල ඒ කොටස නැවතත් කියන්න. විශේෂයෙන්ම යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) ටිකක් ප්‍රමාදවෙලයි ආවෙ.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

මම ඔක කියවල තියෙනව.

මෛත්‍රීපාල සේනානායක මයා.
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayake)

මෙන්න කථානායකතුමනි, මේ සල්ලි බෙදන හැටි: "ඩේලිනිව්ස්" පත්තරයේ එක අඟලකට රු. 25 යි. පිටුවක ගාස්තුව රුපියල් 4,200 යි. පිටු 400 ක් ලබාගත යුතු බව මෙම චක්‍ර ලේඛනයේ කියා තිබෙනවා. ඒ අනුව "ඩේලිනිව්ස්" පත්‍රයට පමණක් අවුරුද්දකට රුපියල් 16,80,000 ක් ගෙවන්නට සිදු වී තිබෙනවා. "ටයිම්ස්" පත්තරයට රු. 12,60,000 ක් ගෙවනවා. "ඩේලිමිරර්" පත්තරයට රු. 3,50,000 යි; "සන්" පත්තරයට රු. 6,72,000 යි ; "ඔබ්සර්වර්" පත්තරයට රු. 10,08,000යි; "දිනමිණ" ට රු. 11,59,000යි; "ලංකාදීප" පත්තරයට රු. 8,23,200 යි ; "දවස" පත්තරයට රු. 6,72,000 යි ; "තිනකරන්" පත්තරයට රු. 6,72,000 යි ; "වීරකේසරී" පත්තරයට රු. 6,72,000 යි. මහජනයා මුලා කිරීම සඳහා මෙපමණ මුදලක් වියදම් කරන්නට මේ ආණ්ඩුව ලෑස්තියි. පසුගිය අවුරුදු තුනහමාර ඇතුළතදී දේශීය හා විදේශීය ධනපතීන්ට කෝටි දෙසිය ගණනක සහන දී, දුප්පත් මහජනතාව පිට කෝටි 336 ක බරක් පටවා කළ පව් වසා ගැනීමට මේ තරම් විශාල මුදලක් ධනපති පත්තර කොම්පැනිවලට දීමට ආණ්ඩුව ලෑස්තියි. [බාධා කිරීම්]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා. (කර්මාන්ත හා ධීවර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. டீ. செல்றன் ஜயசிங்க—கைத்தொழில், கடற்றொழில் அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. D. Shelton Jayasinghe—Parliamentary Secretary to the Minister of Industries and Fisheries)

තමුන්නාන්සේගේ කර්මාන්ත ප්‍රදර්ශනය ප්‍රචාරය කරන්නට කොපමණ වියදම් කළාද ?

මෛත්‍රීපාල සේනානායක මයා.

(திரு. மைத்திரிபால சேனநாயக்க)

(Mr. Maithripala Senanayeke)

ආණ්ඩුවේ සල්ලි සතයක්වත් වියදම් කළේ නැහැ.

මෙතරම් විශාල මුදලක් වියදම් කරමින් අපේ කර්මාන්ත ඇමතිතුමා ප්‍රචාරය කරන්නේ මොනවාද ? "ඉල්මනයිට්" හෙවත් බණිජවැලි. මෙරට ප්‍රවෘත්ති දැන්වීම් මාර්ගයෙන් ඉල්මනයිට් ප්‍රචාරය කොට ඒවා ලංකාවේ වෙළෙඳාම් කරන්නට පුළුවන්ද ? ලංකාවේ කවුද ඒවා මිළට ගන්නේ ? ලංකාවේ ඉල්මනයිට් විකිණීමට තිබෙන බව පිටරටවල ප්‍රචාරය කරනවා නම් මෙපමණ විශාල මුදලක් වියදම් කිරීමේ තේරුමක් තිබෙන බව අපට වටහා ගන්නට පුළුවනි. එහෙත්. ලංකාවේම එය ප්‍රචාරය කිරීමේ ඇති ප්‍රයෝජනය මොකක්ද ?

මේ ආණ්ඩුව සහන දෙන තැන්වලට නම් එය කිසිම අඩුපාඩුවක් නැතිව දී තිබෙන බව මේ වැඩ පිළිවෙළින් අපට පෙනී යනවා. මහජනතාවට නොයෙක් විධියේ සහන දෙන බව පසුගිය මහා මැතිවරණ කාලයේදී ප්‍රචාරය කළ මේ ආණ්ඩුව පසුගිය අවුරුදු තුනහමාර තිස්සේ මහජනතාව මුළා කරමින් ධනපති ක්‍රමය ආරක්ෂා කර ගන්නට, තහවුරු කර ගන්නට, වැඩ පිළිවෙළක් ගෙනගියා මිස පොදු මහජනතාවට කිසිම සහනයක් සෙතක් සලසා නැති බව මා ප්‍රකාශ කරනවා.

අපේ කර්මාන්ත උප ඇමතිතුමා ඕනෑවාට වැඩියෙන් ටිකක් කලබල වන නිසා එතුමන්ලා විසින් පවත්වාගෙන යන එක් කර්මාන්තයක් ගැන පමණක් මා මේ අවස්ථාවේදී වැදගත් කරුණක් පෙන්වා දෙන්නට අදහස් කරනවා. මේ රටේ වානේ කර්මාන්තය සඳහා ඇති කරන ලද වානේ සංස්ථාවේ රෝල් මෝල සම්බන්ධයෙන් අද පවතින තත්ත්වය මොකක්ද? "ලෝ කාබන්-බිලැක් බිලට්" කියන වර්ගය ගෙන්වා ඒවා වෙනත් දේවලට පාවිච්චි කරනවා. රෝල් මෝල කඩකප්පල් කිරීමට ක්‍රියා කරගෙන යනවා. මීටර් 6න් පහළ ප්‍රමාණවලින් යුත් වානේ කම්බි සෑදීමට පාවිච්චි කරන "ලෝ කාබන්" වලින් මීටර් 16 කම්බි සාදාගෙන යනවා. එසේ සාදන ලද කම්බි කොපමණ ප්‍රමාණයක් අද නොවිකිණී තිබෙනවාද ? ටොන් 144 ක් අද විකුණාගන්නට බැරුව තිබෙනවා. ඒ සියල්ලම අර "ලෝ කාබන්" වලින් සෑදූ කම්බි.

ඊ ළඟට කටු කම්බි සාදන යන්ත්‍ර ගැන බලමු. කටු කම්බි සාදන යන්ත්‍ර 8 ක් සංස්ථාවෙ තිබෙනවා. එහෙත් දැනට වැඩ කරන්නෙ යන්ත්‍ර දෙකක් පමණයි. අනික් සියලුම යන්ත්‍ර ක්‍රියා විරහිතව තිබෙනවා. එසේ ක්‍රියා විරහිතව තිබෙන ඒ යන්ත්‍ර අලුත්වැඩියා කිරීමට කිසිම පියවරක් ගෙන නැහැ. ඒවායේ වැඩට පුහුණු සේවකයන් යොදවන්නෙ නැහැ. ඔන්න ඔය විධියටයි වානේ සංස්ථාවේ වැඩ කෙරෙන්නෙ.

වානේ සංස්ථාවේ ප්‍රවාහණ අංශයේ තත්ත්වය මොකක්ද ? ටොන් 20, 30, 40 ගෙන යන්න පුළුවන් ට්‍රේලර් 3ක් තිබෙනවා. එහෙත් ඒවා පාවිච්චි කරන්නේ නැහැ. ඒවායින් කරන්නට නියමව තිබෙන වැඩ කොන්ත්‍රාත්කරුවන්ට භාර දෙනවා. ඒ මොකද ? බඩු එහාට මෙහාට ගෙන යන්නට අවශ්‍ය සෑම අවස්ථාවකදීම ඒ ට්‍රේලර් කැඩිලා. ඒවා පාවිච්චි කරන්නේ නැහැ. ඒ පිළිබඳව තවත් විස්තර කාරක සභා අවස්ථාවේදී ඉදිරිපත් කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

ඊ ළඟට මෙහි තවත් හොඳ සෙල්ලමක් තිබෙනවා. මෙහි දේපළ අංශය භාරව ඉන්න නිලධාරියා කවුද? ජේපොන්සේකා නමැති මහත්මයෙක්. රුපියල් 250 ක පමණ වැටුපකට ලඝුලේඛකයකු වශයෙන් බඳවා ගත් ඒ මහතාට අද දේපළ අංශය භාර දී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මෛත්‍රීපාල සේනානායක මයා.]

දැන් රුපියල් හත් අට සීයක පඩියක් දෙනවා. මොකක්ද මිනිහා කරන වැඩේ? ඒ භූමිය ඇතුලේ වගාකරගෙන යනවා. මොනවාද වගා කරන්නෙ? ඉඟුරු, වැල් පෙනෙල, කරවිල, මඤ්ඤොක්කා, තණකොළ සහ වැල් දෙහි යන වර්ගයි. ඕවා තමයි වගා කරන්නෙ. ලඝු ලේඛකයෙක් කොහොමද වගාව සම්බන්ධව දන්නෙ? ගොවිතැන් සම්බන්ධව ලඝුලේඛකයන් දන්නවාද? ඉඟුරුයි මඤ්ඤොක්කයි එකට එක පාත්තියේ හිටවන මිනිහෙක් මේ රටේ ඉන්නවද? [බාධා කිරීම්.] අනික් කාරණය ඒ අංශයට කුලී කරුවන් බඳවාගත්තේ කොන්ත්‍රාත්කරුවන් මාර්ගයෙනුයි. කුලී කරුවකු සපයා දීම සඳහා කොන්ත්‍රාත්කරුවට රුපියල් 4.50 ක් ගෙවනවා. කොන්ත්‍රාත්කරුවා කුලිකරුවාට රුපියල් 4 ක් ගෙවා අනික් ශත 50 ඔහු ගන්නවා. කවුද මේ කොන්ත්‍රාත්කරුවා? අතුරුගිරියේ පදිංචි එක්සත් ජාතික පක්ෂයේ ප්‍රබල ආධාරකරුවකු වන ඒබ්‍රහම් පෙරේරා මහතායි. ඇයි මේ කුලීකරුවන් කොන්ත්‍රාත්කරුවෙක් මාර්ගයෙන් ගන්නෙ? ඉඟුරුයි මඤ්ඤොක්කයි එකට වවන්න වුණත් ඇයි කොන්ත්‍රාත්කරුවෙක් මගින් නැතුව කුලී කරුවන් කෙළින්ම බඳවා ගන්න බැරි? මේ පිළිබඳව ද තවත් විස්තර කාරක සභාවේදී ඉදිරිපත් කිරීම බලාපොරොත්තු වෙනවා.

ඔය විධියේ කරුණු පිළිබඳව කල්පනා කර බලන විට, කථානායකතුමනි, දැන් අවුරුදු තුනහමාරකුත් පසු වී හතරවෙනි අයවැය ලේඛනයත් ඉදිරිපත් කර අවසන්ව ඇති මේ හත් හවුල් ආණ්ඩුව මහජනයා මුලා කිරීමට කොපමණ උත්සාහ කළත් ඉදිරියට නම් එය කරන්නට බැරි බව සඳහන් කරන්නට අපට සිදු වී තිබෙනවා. ලක්ෂ කෝටි ගණන් පත්‍ර කොම්පැනිකාරයින්ට දී ඒ මාර්ගයෙන් තමන්ගේ වැරදි වසා ගැනීමට හෝ නොකළ දේවල් මවා පෑමට හෝ පුළුවන්ය කියා හිතන්න එපා. ඒ ප්‍රචාරවලින් එතුමන්ලාව මනින්න මහජනයා සූදානම් නැහැ. එම නිසා පුළුවන් තරම් ඉක්මනින් මේ ආණ්ඩුව පෙරළා දැමීමෙන් පමණයි මේ රටේ මහජනතාවට සහනයක් ලබා ගැනීමට පුළුවන් වන්නේ, කියා අපට කියන්න සිද්ධ වී තිබෙනවා. මා විසින් ඉදිරිපත් කරනු ලැබූ ඒ කරුණු අනුව, මේ හත් හවුල් ආණ්ඩුවේ 4 වෙනි අයවැය ලේඛනයට අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

පූ. භා. 11.07

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන (කර්මාන්ත හා ධීවර ඇමති)

(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன—கைத்தொழில், கடற்றொழில் அமைச்சர்)

(The Hon. D. P. R. Gunawardena—Minister of Industries and Fisheries)

ගරු කථානායකතුමනි, ජාතික රජයේ 4 වැනි අයවැය වාර්තාව පිළිබඳ විවාදය ආරම්භ වූ අවස්ථාවේදී එම විවාදයට මුලින්ම සහභාගි වීමට පුළුවන් වීම ගැන මා පළමුවෙන්ම සන්තෝෂ වෙනවා. මෙවර අයවැය ලේඛනයත් සමග මෙතෙක් ඉදිරිපත් කර ඇති අයවැය ලේඛන 4ම මේ රටේ ආර්ථික තත්ත්වය නඟා ලීමට ආධාර වී තිබෙන බව මෙම විවාදයේදී හොඳ හැටි පැහැදිලි වනු ඇතැයි මා ඉස් ඉස්සෙල්ලාම කියන්න කැමතියි. මෙම ජාතික රජය ආරම්භ වූ දිනවල තිබුණ ආර්ථික අමාරුකම්, කර්මාන්ත හා ගොවිතැන් අතින් තිබුණ අමාරුකම්, මුදල් හදල් ණයට ගැනීමට තිබුණ අමාරුකම් අද බොහෝ දුරට මඟ හැරී තිබෙන බව ගරු මුදල් ඇමතිතුමාගේ කථාවෙන් හොඳ හැටි පැහැදිලි වුණ බව මා අමුතුවෙන් මතක් කර දිය යුතු කාරණයක් නොවෙයි. එහෙත් ඒ කාරණා අපේ මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමාට (මෛත්‍රීපාල සේනානායක මයා.) පැහැදිලි වී නොතිබීම ගැන මා කනගාටු වෙනවා. මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා ගොවිතැන් ගැන හොඳට දන්න කෙනෙක්; දැනගන්න ඕනෑ කෙනෙක්. මට භාරව තිබෙන කර්මාන්ත ගැන යමක් කියන්න කලින් වී වගාව ගැන මා යමක් කියන්න කැමතියි. මා ඉතාම කනගාටු වෙනවා, තමන් මුලදී යෙදී සිටි වෘත්තීය ගණනාවකටම අකැමැතිව අද ඒවා අමතක කර දමා තිබීම ගැන.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මට මතකයි, 1956-59 කාලයේදී, වැව් ගොඩවීම පිළිබඳ ප්‍රශ්නයක් මතු වුණු බව. ඒ දවස්වල අප කවුරුත් දැරූ මත යක් තමයි, වැව් තාවුළු ගොවිතැන් කිරීම හොඳ නැති බව. වැව් තාවුළු ගොවිතැන් කිරීමෙන් වැව් ගොඩවන නිසා, ඒ අන් දමට දීර්ඝ කාලයක් ගොවිතැන් කර ගෙන ගෑමෙන් වැව්වලින් නියම ප්‍රයෝජන ලබාගන්න බැරි වෙනවා; වැව් පතුල ක්‍රම ක්‍රමයෙන් ගොඩ බිමේ මට්ට මට උස් වෙනවා. එම නිසා ඒ කාලයේදී අප කීවා, වැව් පතුල හාරන්න ඕනෑය, එකතුවන මඩ ඉවත් කරන්න ඕනෑය කියා. සමහර උදවියට කොළඹට ආවාට පස්සෙ, ගොවිතැන් කරන කාලයේදී තමන් යමක් ඉගෙන ගත්තා නම්, ඒවාත් අමතක වෙනවා. ඉදහිටවත් පද විය,. මැදවච්චිය දිහාට ගොස් බලනවා නම් හොඳයි. ඒ කාරණය විශේෂයෙන්ම මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමාට—තුන් හවුලේ උප නායකතුමාට—මතක් කරන්න කැමතියි.

දැන් තුන් හවුල ඇතුළෙ නොයෙක් විධියෙ වාද භේද, එක් එක් අයගේ හැප්පීම්, එක් පක්ෂයක් අනික් පක්ෂය සමග හැප්පීම්, බෙලි කැපීම් ආදිය ඇති වෙනවාලු. සමහර විට තුන් හවුලේ උප නායකතුමා අනාගතයේදී යම් යම් දේවල් ගැන බලාපොරොත්තුවෙන් සිටිනවා වෙන්නට පුළුවනි. සමහර විට විරුද්ධ පාර්ශ්වයේ නායක මැතිණිය මෙහි නොපැමිණ සිටින්නේ ඒ නිසාදැයි කියන්න දන්නේ නැහැ. කෙසේ වුණත් ගරු කථානායකතුමනි, අයවැය ලේඛන විවාදය ආරම්භ කරමින් කථා කරන විට, සාමාන්‍යයෙන් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරු ගරු සභාවේ පිරීඉතිරී සිටිම, මෙයට පෙර අයවැය ලේඛන පිළිබඳ විවාද ඇති වූ අවස්ථාවලදී සිරිතක්. නමුත් අද විරුද්ධ පාර්ශ්වයේ නායිකාව මෙම ගරු සභාවේ පෙනෙන්න නැහැ. පිටත ඉන්නවාද කියන්න මා දන්නේ නැහැ. සමසමාජ පක්ෂයේ නායකයා කලින් මෙතැන සිටියා; දැන් පෙනෙන්න නැහැ. උප නායකතුමාත් හිටියා; කොහේ ගියාදැයි කියන්න දන්නේ නැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

එතකොට තමුන්නාන්සේලාගේ පැත්තේ අය?

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන
(கௌரவ டீ. பி. ஆர். குணவர்தன)
(The Hon. D. P. R. Gunawardena)

අපේ පැත්තේ වුවමනා තරම් ඉන්නවා. ඒ ගැන කිසිම සැකයක් නැහැ. විශේෂයෙන්ම අප කවුරුත් දන්නවා, මෙම විවාදය ආරම්භ කරන්නේ විරුද්ධ පාර්ශ්වයෙන්ය කියන කාරණය. නමුත් විරුද්ධ පාර්ශ්වයෙන් මෙම විවාදය ආරම්භ කරනවාය කියන හැඟීමක්වත් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් තුළ තිබී නැහැ. මෙහිදී මා විශේෂයෙන්ම බලාපොරොත්තු වුණා, ආණ්ඩු පක්ෂයෙන් මන්ත්‍රීවරුන් අඩු වුණත්, විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරු මෙතැනට ඇවිත්, තුන් හවුලට කියන්න තිබෙන්නේ මොනවාද, තුන් හවුලේ වැඩ පිළිවෙළ මොකක්ද, තුන් හවුලේ ප්‍රතිපත්තිය මොනවාද, ඉදිරිපත් කර ඇති අයවැය සම්බන්ධයෙන් තුන් හවුලට යමක් කියන්න තිබෙනවාද කියා දැනගැනීමට උනන්දුවක් දක්වාවිය කියා. සමහර විට එම කොටස් දැනගෙන සිටින්නට ඇති වැඩිපුර යමක් කියවෙන්නේ නැතෙයි කියා; මෙහි ඇවිත් ඒ තරම් ප්‍රයෝජනයක් සිදු වන්නේ නැතෙයි කියා.

And it goes on. That is the position. I am speaking of the terror that reigned in that era from about 1931 onwards until 1956. My good Friends, the hon. Third Member for Colombo Central (Mr. Keuneman), the hon. Member for Akuressa (Dr. S. A. Wickremasinghe) and the hon. Member for Kamburupitiya (Mr. Percy Wickremasinghe) are still living on old shibboleths. — [*Interruption*] Stalinism is out of date ; Stalinism is now conservative.

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்ஸி விக்கிரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)

නිකම් මේ කබරුපිටියෙන් අල්ල ගත්ත එපා [බාධා කිරීමක්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please! I shall have to ask the hon. Member to lease the House, if he keeps on interrupting.

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்ஸி விக்கிரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)

No, Sir.

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන
(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)
(The Hon. D. P. R. Gunawardena)

He is uncomfortable.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

The hon. Member is constantly interrupting. He was seen carrying on a convsrsation with the Serjeant-at-Arms ; a thing he should not do. If he has anything to say he can say it in his speech.

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන
(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)
(The Hon. D. P. R. Gunawardena)

He can reply when the time comes.

Well, Sir, I do not propose to take much more time—I have taken nearly 2½ hours—although I have considerable material to deal with. All that I have to say is this : from 1965 the National Government has repaired the damage done by the previous Government firstly in the field of communal relations between the Sinhalese and the Tamils and, secondly among the religious communities. During this period we have succeeded in having a certain degree of peaceful relations between these communities, and I think the country has accepted the position that that is necessary for the progress of our country ; that we cannot make economic progress, that we cannot make social progress, that we cannot make progress in the field of education, intellectually and spiritually, unless we get together and have a stable Government which is supported by all these communities—Sinhalese, Tamil, Malay, Moor, Burgher and all the others who are in this country. That is absolutely necessary.

Second, it is only by increasing production, by increasing the wealth of this country that you can raise the standard of living and not by any other means. An increase in production means an increase in the agricultural sector as well as in the industrial sector. During the last one and a half years we have achieved fairly important successes in the agricultural sector which no one can deny. We have succeeded in reducing the imports of rice by the food campaign. I am only sorry that the people who

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන]

call themselves national leaders are not taking an active part in it. They were very critical at the beginning, but they are now just being drawn in, because the people in their very areas have made them realize that unless they join in they cannot face the people. Now they are coming out, but it is much better to be honest and come out openly, support the campaign for food production—rice as well as subsidiary foodstuffs—and not try to create industrial unrest by bringing out the public sector people—the public servants. You led them up the garden path on 8th January 1966 and they had to suffer a lot. I do not think they are going to believe what you say, I do not think they will have any confidence in any of the leaders of the three parties that have joined together. I do not think the people will trust you any more. How can they, when every time you led them you have let them down. It is useless to try to create trobule in this country. If you cannot help, if you cannot give your support, keep quiet. That is my advice. I do not want to say anything more than that.

අ. භා. 3.13

ජෝර්ජ් රාජපක්ෂ මයා. (මුල්කිරිගල)
(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ—முல்கிரிகல)
(Mr. George Rajapakse—Mulkirigala)

ගරු කථානායකතුමනි, දිවා භෝජනය සඳහා රැස්වීම අත්සිටුවන්නට කලින් ගරු කර්මාන්ත ඇමතිතුමා කළ කථාවේ පෙර වදන අසා සිටි මට ෂේක්ස්පියර්ගේ ඉංග්‍රීසි කාව්‍යයක වාක්‍යයක් මතක් වුණා.

"Full of sound and fury, but signifying nothing."

බොහොම සැරයි; බොහොම සද්දයි; නමුත් පුස්. ගරු කර්මාන්ත ඇමතිතුමා කථා කළ විලාසය දෙස බලන විට ඇත්තෙන්ම තමන්ගේ දේශපාලන සෙළුව වසා ගැනීමට දඟලන පුද්ගලයකුගේ විලාසයෙන් එතුමා කථා කළ බව පෙනී ගියා. අද කර්මාන්ත ඇමතිතුමා කථා කළේ ඒ විලාසයෙනුයි. එතුමා කථා කරන විට මගේ හිත, මගේ මතකය, 1963 මැයි මාසයේ 1 වැනිදාට යොමු වුණා. 1963 මැයි 1 වැනිදා ගරු කර්මාන්ත ඇමතිතුමාත්—එවකට අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා—ලංකා සමසමාජ පක්ෂයේ නායක යටියන්තොට ගරු මන්ත්‍රීතුමාත් (ආචාර්ය එන්. එම්. පෙරේරා) ලංකා කොමියුනිස්ට් පක්ෂයේ නායක අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමාත් (වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ) ජීප් රථයක නැගී ලක්ෂ සංඛ්‍යාත ජනකායකගේ අත්පොලසන් නාදය මධ්‍යයේ නිදහස් චතුරශ්‍රයට ගොස් මඟුල් බෙර සද්ද මැද්දේ එක්සත් වාමාංශික පෙරමුණකට අත්සන් තැබූ හැටි මට මතකයි.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට විරුද්ධව.

ජෝර්ජ් රාජපක්ෂ මයා.
(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)
(Mr. George Rajapakse)

ඒක හරි. මගේ ප්‍රශ්නය මේකයි. එදා වාමාංශික එක්සත් පෙරමුණේ ප්‍රධාන නායකයා වශයෙන් පත්වීමට දඟලූ ගරු කර්මාන්ත ඇමතිතුමා ඒ ගිවිසුමට තම අත්සන තබද්දී රුසියාවේ ස්ටාලින්ගේ මළ සිරුර වළලා තිබුණු තැන දැනගෙන සිටියේ නැද්ද? 1952 සිට අද දක්වාමත් ගරු කර්මාන්ත ඇමතිතුමා දැනගෙන හිටියේ නැද්ද රුසියාවේ ස්ටාලින්ගේ මළ සිරුර වළලා තිබෙන තැන? ගරු කර්මාන්ත ඇමතිතුමා රුසියාවට ගිය අවස්ථාවේදී එම මළ සිරුර වළලා තිබෙන තැන සොයා ගන්නට බොහොම අමාරු වුණාලු. None are so blind as those who will not see.

ගරු කථානායකතුමනි, ගරු කර්මාන්ත ඇමතිතුමා ඔහුගේ කථාව ආරම්භයේදීම අපට අවවාදයක් දුන්නා. එය තර්ජනාත්මක අවවාදයක්. බටහිර ලෝකයේ ශිෂ්‍යයන් අතර විශාල නොසන්සුන්කමක් තිබෙනවාය, සමාජවාදී රටවලත් ඒ තත්ත්වයම පවතිනවාය, ලංකාවේ ශිෂ්‍යයන් අතරත් නොසන්සුන්කමක් තිබෙනවාය, එහෙත් විරුද්ධ පාර්ශ්වයේ අය ඒවාට ඇඟිලි ගහන්නට යන්න එපාය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියා එතුමා ප්‍රකාශ කළා. ගරු කථානායක තුමනි, සිය වසරක අධ්‍යාපනයෙන් පසුව මේ රටේ අධ්‍යාපනයට ලැබුණු හරිම බඩුව වන ඉම්ය මුදියන්සෙලාගේ රපියල් අභය වන්ස ඊරියගොල්ල මහතා දැකීමම ඇති මේ රටේ ශිෂ්‍යයන් කුලප්පු වන්න ; අපි ඕනෑ නැහැ.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව රදළ ආණ්ඩුවක්ය කියා ගරු කර්මාන්ත ඇමතිතුමා අද ව්‍යව හාර කරනවා. එමෙන්ම සේනානායකලා ලංකා දේශපාලන බිමෙන් අතුගා දමන තුරු නින්ද යන්නේ නැත කියා එක්තරා වකවානුවකදී කී ගරු කර්මාන්ත ඇමති තුමා අද මේ හත් හවුල් ආණ්ඩුවේ පෙර මුණ ආසනයක් අරගෙන සිටිනවා. එමෙන් ම සිරිමා බණ්ඩාරනායක රදළ ආණ්ඩුවට පස්සා දොරින් රිංගන්නට හැදූ අවස්ථාවේ දූන් විරුද්ධ පාර්ශ්වයේ සිටින නායිකාව ගේ රදළ දෙපතුල ළඟට ගොස් වැඳ වැටී රදළ සෙරෙප්පුව ලෙවකෑ අවස්ථාවේදී ගරු කර්මාන්ත ඇමතිතුමාට අද ඔය කියන දේවල් මතක් වුණේ නැහැ. O Tempora! O Mores!—අනේ කාලේ-වනේ වාසේ "—කියා කියමනක් තිබෙනවා, ගරු කථානායකතුමනි.

ගරු කර්මාන්ත ඇමතිතුමාගේ කථාවේ දෙවැනි කොටස ශීඝ්‍රගාමී ලංගම බස් රථ යක් යන වේගයෙන් කියවාගෙන ගියා. එය පුස් කෑ නිලධාරියකුගේ පුස් කෑ වාතී වක්. එය සභාමේසය මත තැබුවා නම් වඩාත් හොඳින් වටහා ගන්නට තිබුණා. එතුමා කියෙව්වේ පාලන වාර්තාවක්දැයි කියන්නට මම දන්නේ නැහැ. ඒ කොයි හැටි වෙතත්, අපට තේරුම් ගැනීමට පවා බැරි තරම් ශීඝ්‍රගාමී අන්දමටයි එය කියවා ගෙන ගියේ. තමන්ගේ අතීතයේ එක් තරා කාලයක මේ රටට මාක්ස්වාදය ගෙනැවිත් දුන්, කම්කරුවන් විසින් තමන්ගේ පන්තියට කළ ද්‍රෝහිකම් නිසා එළවා දමනු ලැබූ එතුමා අද ධනපති රජය කට ඇතුළු වී සිටිනවා. එදා, සී. පී. ද සිල්වා ඉන්න රජයකට කවදාවත් ඇතුළු නොවෙමැයි වහසිබස් දෙඩූ මේ තැනැත්තා අද මඤ්ඤොක්කයි ඉඟුරුයි වාගේ එකට එකතු වෙලා ඉන්නවා නොවෙයිද ?

ගරු කථානායකතුමනි, අවුරුදු තුන හමාරක් තිස්සේ හත්හවුල් ආණ්ඩුවෙන් බැට කෑ මේ රටේ දුක් විඳින ජනතාව, මෘදු මොළොක් හදවතක් ඇති, හිතක් පපුවක් ඇති, නිහතමානි ගතිපැවතුම් ඇති ගරු මුදල් ඇමතිතුමාගේ සිව්වැනි අයවැය ලේඛනය ඉදිරිපත් කළ අවස්ථාවේදීවත් යම්කිසි ප්‍රමාණයක සහනයක් ලැබෙතැයි බලාපොරොත්තුවෙන් පුල පුලා සිටියා. එහෙත් අයවැය ලේඛනය කියෙව්වාට පස්සේ නම් ගරු මුදල් ඇමතිතුමාට මොළොක් හදවතක් තබා මොන විධියේ හෝ හදවතක් නැති බවත්, ඒ වෙනුවට ලෝක බැංකුව තමන්ගේ ශරීරය තුළ අන්තර්ගතව ඇති බවත් ජනතාවට වැට හුණා.

ගරු මුදල් ඇමතිතුමා අයවැය ලේඛන හතරක් ඉදිරිපත් කළා. ඒ හතරෙන්ම ප්‍රකාශ කරන ලද අදහස් සහ යෝජනා වලිය ගැන කල්පනා කර බලන විට අපට නිගමනයකට බසින්නට සිදු වී තිබෙන් නේ, ගරු මුදල් ඇමතිතුමා ලෝක බැංකු වේ යටහත්, කීකරු, සුවච, සේවකයකු බවයි. මේ රටේ නරක අතට හැරීගෙන ගිය ආර්ථිකය යහ මඟට නැවත හැරවීමට වුව මනාය කියමින් ගත වූ අවුරුදු තුනහමාර ඇතුළත ගත් වැදගත් ආර්ථික පියවරවල් දෙක ගැන කියන්නට තිබෙන්නේ මොකක්ද ? ඒ පියවරවල් දෙකම ගත්තේ ලෝක බැංකුවේ අවවාද, අනුශාසනා සහ උපදෙස් අනුවයයි අපි කෙළින්ම කියනවා. මේ රටේ ජනතාවගේ හාල් සලාකය නැති කෙළේත්, මේ රටේ රුපියලේ වටිනාකම අඩු කෙළේත්, ඊට පසුව විදේශ විනිමය සහතිකපත් ක්‍රමය යන නමින් එකක් අටවාගෙන නැවත වරක් රුපියලේ අගය දෙවැනි වරටත් අඩු කෙළේත්, ලෝක බැංකුවේ අවවාද, අනුශාසනා සහ උපදෙස් ඇතිවය යන්න මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට සිදු වී තිබෙනවා. මේ අයවැය ලේඛනයෙන් පැහැදිලිව පෙනී යන්නේ හැමදාම කියන එක්තරා වැදගත් කාරණ යක් බව මේ අවස්ථාවේත් කියන්නට ඕනෑ. මේ හත්හවුල් රජය අධිරාජ්‍යවාදී අයිතිවාසිකම් සහ ධනේශ්වර අයිතිවාසි කම් ආරක්ෂා කර දීමට ඇප කැප වී සිටින දේශපාලන හවුලක් බවයි කියන්නට සිදු වී තිබෙන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් රාජපක්ෂ මයා.]

මේ අයවැය ලේඛනය දෙස බලන්න. 1970 දී මේ රටේ නැවත වරක් පැරකුම් යුගය උදා වුණාට පස්සේ මැතිවරණයක් පැවැත්වීමට නියමිතයි. මැතිවරණයක් ළඟා වෙත්ම ධනේශ්වර පන්තියට උභතෝකෝටික ප්‍රශ්නවලට මුහුණ පාන්නට සිද්ධ වෙනවා. මේ අය එක අතකින් ධනේශ්වර පන්තිය ආරක්ෂා කරන්නට ඕනෑ. මැතිවරණ අරමුදලට ඔවුන්ගේ මුදල් වුවමනා නිසයි, ඒ. අනෙක් අතින්, ජනතාවට රිදෙන විධියට ක්‍රියා කරන්න වත් අමාරුයි. බලය ලබා ගැනීමට ඔවුන්ගේ ඡන්දයත් වුවමනා නිසයි, ඒ. ඒ නිසා මේ අයවැය ලේඛනය, ඇත එන මැතිවරණයකට එක් ඇහැක් යොමු කර ගෙන සකස් කළ එකක් බවයි අපට පෙනෙන්නේ. ගරු මුදල් ඇමතිතුමාගේ මේ අයවැය ලේඛනය දෙස කල්පනාකාරීව බැලුවොත් අපට එක් කරුණක් නම් සක් සුදක් සේ පැහැදිලිව පෙනෙනවා. කොයි තරම් වහන්නට උත්සාහ කළත් එය පැහැදිළිව පෙනෙනවා. ධනේශ්වර පන්තියට විශාල වාසි ලබා දී මේ රටේ සිටින නිර්ධන පන්තියේ ජනතාව මත බර පටවා තිබෙන බව පැහැදිලිවම ඔප්පු කරන්නට පුළුවනි.

සියලුම ආදායම් බදු ගෙවන්නන්ට සහන දෙනවායයි ගරු මුදල් ඇමතිතුමා කීවා. ඇත්ත. මේ රටේ ඉන්නා, ආදායම් බදු ගෙවන්නන්ගේ ප්‍රමාණය කොතෙක්ද? 1,62,853 දෙනයි. ඉනුත් මධ්‍යම පන්තියේ අයබදු ගෙවන්නන්ට මුදල් ඇමතිතුමා දුන් සහනය ඉතාමත් සුළුයි. දිනපතා නැඟී එන බඩු මිළ හා සංසන්දනය කර බලන විට, ඒ සහනය කිසි වැදගැම්මකට නැති එකක් බව මේ ගරු සභාවේදී කියන්න කැමැතියි. අනෙක් අතට, විශාල ආදායම් තිබෙන ලොකු ධනපතියන්ට රුපියල් දහස් ගණනින් සහන දී තිබෙනවා. අර මධ්‍යම පන්තියට සුළු සහනයක් වත් දුන්නේ ඇයි? මුදල් ඇමතිතුමා අපක්ෂපාතීව, සියල්ලන්ටම ඒකාකාරව ක්‍රියා කර නවාය යන හැඟීම මහජනතාවගේ හිත් වලට රිංගවන්නටයි.

උදාහරණ අවශ්‍ය නම් එකක් පමණක් පෙන්වන්නම්. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් නිකුත් කෙරුණු චක්‍ර ලේඛයක මෙවැනි ගණන් ලැයිස්තුවක් තිබෙනවා: ස්වාමිපුරුෂයා, භාර්යාව, දරුවන් දෙදෙනෙකු හෝ යැපෙන්නන් දෙදෙනකු සහිත ආදායම් බදු ගෙවන්නෙක්, සේවය මගින් රුපියල් 5,550 ක තක්සේරු වන වාර්ෂික ආදායමක් ලබන්නේ නම් ඔහු දැනට ගෙවිය යුතු වාර්ෂික ආදායම් බද්ද රුපියල් 50 යි. එහි බලපවත්වන අනුපාතය සියයට .91 යි. එහෙත් යෝජිත වාර්ෂික ආදායම් බද්ද රුපියල් 30 යි. එහෙම නම්, ඒ අනුව ඔහුට ලැබෙන වාර්ෂික වාසිය රුපියල් 20 ක් පමණයි. අනෙක් අතට, ස්වාමිපුරුෂයා, භාර්යාව, දරුවන් දෙදෙනකු හෝ යැපෙන්නන් දෙදෙනනකු සහිත, රුපියල් 1,50,000 ක වාර්ෂික ආදායම් ලබන බදු ගෙවන්නෙක් දැනට ගෙවන වාර්ෂික ආදායම් බද්ද රුපියල් 95,950 ක් වන අතර, යෝජිත වාර්ෂික ආදායම් බද්ද වනුයේ රුපියල් 78,780 ක් පමණයි. ඒ අනුව ඔහුට ලැබෙන වාර්ෂික වාසිය රුපියල් 17,170 ක් වෙනවා.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

ඇයි, ධන බද්ද? ධනය පිළිබඳව එනතු කරන බද්දක් එකතු කරන්න.

Add the wealth tax also. If you do that you will find there is no substance in your argument.

ජෝර්ජ් රාජපක්ෂ මයා.
(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)
(Mr. George Rajapakse)

ඒවා උත්තර දෙන විට කියන්න. ඊයේ පත්තරයක තිබුණා. ඒවාත් එක්කම ගණන්-හිලව්. [බාධා කිරීම්]

ගරු මුදල් ඇමතිතුමා අරක්කුවලට, සිගරැට්වුවට පමණක් නොව ලංකා ලසිම් වලටත් බදු පනවා තිබෙනවා. රෙදි වර්ග කීපයකට කලින් තිබුණු බදු එතුමා ඉවත් කළා. අනෙක් පැත්තෙන්, "සළු සලේ" සභාපතිතුමා රෙදි මිළ වැඩි කරනවා. එම නිසා එය "ලංකා සළු සල" නොව "ලංකා සෙළු සල" බවට පත් වී තිබෙනවා.

ඇත්තටම, ලංකා සළු සලේ වීත්ත, පොප්ලින් මිළ දර්ශනය දිහා බලන විට මට මතක් වුණා, ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(ආචාර්ය ඩබ්ලිව්. දහනායක) සිරිමා බණ්ඩාරනායක රජය කාලයේ කූපනයට රෙදි යාර 6 ක් දුන් අවස්ථාවේ, අර කියන්න බැරි තැන ශ්‍රාවස්තියේ තුවායකින් වසා ගෙන එතුමා පාර්ලිමේන්තුවට ආවා. එතුමා විරුද්ධ පාර්ශ්වයේ හිටියා නම්, අද එතුමාට එන්න වෙන්නේ හබරල කොළයකින් වසාගෙනයි.

මුදල් ඇමතිතුමා විසින් පිරිවැටුම් බද්ද වැඩි කරනු ලැබීමෙනුත් පහර විදින්නේ දුප්පතාටයි. තමුන්නාන්සේලා කොයි තරම් පිළිකුල් සහගත තත්ත්වයකට වැටී තිබෙනවාදැයි කීවොත්, නිතරම තමුන්නාන්සේලා ආරක්ෂා කිරීමට උත්සාහ කරන ධනපති පත්තරවලට පවා සිදු වී තිබෙනවා, තමුන්නාන්සේලා විවේචනය කරන්න. අකමැත්තෙන් වුණත් ධනපති පත්තර පවා තමුන්නාන්සේලා විවේචනය කරන්නේ, අවවාද වශයෙනුයි.

මේ රටේ ධනපති පත්තර බිස්සට අයත් පත්තරයක, අයවැය කථාවට පසු දා පළ වූ කතු වැකියක් මා කියෙව්වා. තමුන්නාන්සේලා ආරක්ෂා කිරීමටයි, මෙසේ කියා තිබෙන්නේ. මම ඒ කොටස කියවන්නම්:

"The Upper Ten, the affluent and the prosperous have everything to gain and nothing to lose by this budget. The 'submerged hundred', the middle and working classes, have on the contrary, hardly a breath of benefit from the winds of 'relief' that have blown the way of the rich."

You will agree with that, Mr. Minister.

"By its twenty-five per cent increase on the price of coconut arrack, the National Government will not only drive the Common Man . . ."—

This is where the shoe pinches for the Editor of the "Ceylon Daily Mirror"—

". . . into the arms of the Opposition, but also into the clutches of a greater menace—the Kasippu killer.

All in all, we are sorely disappointed with what presumably set out to be a seductive election budget. The heady aroma of relief may lure the wealthy already lolling on the cushions of comfort but it will surely repel the larger mass of people, wallowing in want."

This is an assessment made—

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

They are disappointed.

ජෝර්ජ් රාජපක්ෂ මයා.
(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)
(Mr. George Rajapaksa)

Yes, they are disappointed. They were hoping you would not make these mistakes. They want to protect you. This is a piece of gratuitous advice they are giving you: do not protect the capitalist classes so blatantly and so manifestly, do it covertly if you would.

ගරු කථානායකතුමනි, මේ රජය බලයට පත් වූයේ මේ රටේ වැඩ කරන දුප්පත් ගොවි කම්කරු ජනතාවට මුහුණ පෑමට සිදු වී ඇති ප්‍රශ්න විසඳීමට ප්‍රතිඥා දීලයි. පසු ගිය මහා මැතිවරණ කාලයේදී තමුන්නාන්සේලා කිව්වේ, තව මාස තුන හතරක් යන්නට පෙර බඩු මිල අඩු කරනවාය කියායි; උග්‍රව පවතින රැකීරක්ෂා ප්‍රශ්නය විසඳනවාය කියායි; සෞඛ්‍ය ප්‍රශ්නය විසඳනවාය කියායි. ඇත්තෙන්ම එදා තිබුණු තත්ත්වයත්, අද තිබෙන තත්ත්වයත් අපි සංසන්දනය කර බලමු.

රැකීරක්ෂා ප්‍රශ්නය ගැන බලමු. අද මේ රජයෙන් ශිෂ්‍ය ගුරු පත්වීමක්වත් ලබා ගන්නට බැරිව ඉතාමත් අමාරුවෙන් තමන්ගේ දිවි පෙවෙත ගෙන යන උපාධිධාරීන් 6,900 ක් මේ රටේ ඉන්නවා. තමුන්නාන්සේලා උගත් තරුණ තරුණියන්ගේ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳා තිබෙන්නේ ඔය ආකාරයටයි. සතියකට පමණ පෙර පැවැත් වුණු ශිෂ්‍ය ගුරු විභාගයට, ජ්‍යෙෂ්ඨ, අධ්‍ය යන පොදු සහතික පත්‍ර ආදී විභාග සමත් 1,13,000 ක් පෙනී සිටියා. මේ රටේ උගත් තරුණ තරුණියන්ගේ රැකීරක්ෂා ප්‍රශ්නය කොයි තරම් උග්‍ර වී තිබෙනවාද යන්න එයින්ම තමුන්නාන්සේලාට පෙනී යනවා ඇති. මේ තත්ත්වය නැති කර දැමීමට මේ රජය කිසිම දෙයක් කර නැහැ.

ගරු කථානායකතුමනි, 1965 මාර්තු මාසයේදී රජයේ රැකීරක්ෂා කාර්යාලවල ලියාපදිංචි වී සිටි රැකීරක්ෂා රහිත උදවියගේ සංඛ්‍යාව 1,64,355 යි. තමුන්නාන්සේලා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් රාජපක්ෂ මයා.]

බලයට පත්ව අවුරුදු තුනහමාරකට පසු—අද—රජයේ රැකිරක්ෂා කාර්යාලවල ලියාපදිංචි වී සිටින රැකිරක්ෂා රහිත අයගේ ගණන එදාට වඩා ලක්ෂයකින් වැඩි වී තිබෙනවා. එසේ නම් තමුන්නාන්සේලා රැකිරක්ෂා ප්‍රශ්නය විසඳීමට අබමල් රේණුවක ප්‍රමාණයේවත් වැඩ කර නොමැති බව පිළිගන්නවා ඇති. එහෙත් තමුන්නාන්සේලාගේ දේශපාලන පන්දම්කාරයන්ගේ, තමුන්නාන්සේලාගේ පරාජිත අපේක්ෂකයන්ගේ, තමුන්නාන්සේලාගේ හෙන්චයියලාගේ රැකිරක්ෂා ප්‍රශ්නය නම් විසඳා තිබෙනවා. තමුන්නාන්සේලාට හිතවත් ලොකු මිනිසුන්ට රජයේ සංස්ථාවල ලොකු තනතුරු දී ඔවුන්ගේ රැකිරක්ෂා ප්‍රශ්නය නම් විසඳුවා. එහෙත් මේ රටේ දුප්පත් අහිංසක මිනිසුන්ගේ රැකිරක්ෂා ප්‍රශ්නය විසඳීමට තමුන්නාන්සේලා උත්සාහයක්වත් දරා නැහැ.

සෞඛ්‍ය තත්ත්වය ගැන බලමු. 1965 දී—සිරිමා බණ්ඩාරනායක මැතිණිය තමුන්නාන්සේලාට ආණ්ඩුව භාර දෙන අවස්ථාවේදී—මේ රටේ සිටියේ මැලේරියා රෝගීන් 11 දෙනෙකු පමණක් බව, වෛද්‍යවරුන්ගේ පරීක්ෂණයකින් පසු සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද සංඛ්‍යා ලේඛන අනුව පෙනී යනවා. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන අනුවයි මා කථා කරන්නෙ. ඊළඟට හත් හවුල් ආණ්ඩුවේ අවුරුදු තුනහමාරක පාලනයෙන් පසු අද කොහොමද තත්ත්වය? අද මේ රටේ මැලේරියා රෝගය වසංගත තත්ත්වයකිනුයි පවතින්නෙ. අද මේ රටේ ලක්ෂ හතහමාරක් මැලේරියා රෝගයෙන් පෙළෙනවා. මෙදැයි තමුන්නාන්සේලා කළ සෞඛ්‍ය සේවය.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி. சொய்ஸா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)
කී දෙනෙකු මළාද?

ජෝර්ජ් රාජපක්ෂ මයා.
(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)
(Mr. George Rajapaksa)
ඒවා වුවමනා නැහැ.

ඒ වාගේම ක්ෂය රෝගයත් බහුල වශයෙන් පැතිරී තිබෙනවා. ක්ෂය රෝගීන්ට සහ ඔවුන්ගෙන් යැපෙන්නන්ට මුදලින් ආධාර කිරීමේ වැය ශීර්ෂය යටතේ ගිය වර්ෂයේ අයවැය ලේඛනයෙන් රුපියල් 68,50,000 ක් තමුන්නාන්සේලා වෙන් කර තිබුණා. නමුත් මේ වර්ෂයේ අයවැය ලේඛනයෙන් එම වැය ශීර්ෂයෙන් රුපියල් 15,20,089 ක් කපා තිබෙනවා. එහෙම නම් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව යටතේ ක්ෂය රෝගීන්ටත් ඔවුන්ගෙන් යැපෙන්නන්ටත් දෙන ආධාර මුදල් පවා අඩු කර තිබෙනවා, නැත්නම් කපා තිබෙනවා.

අද අපේ ආරෝග්‍යශාලාවල ලෙඩුන්ට ප්‍රතිකාර කිරීමට වෛද්‍යවරුන් නැහැ. අපේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් විභාග සමත් වී වෛද්‍යාචාර්යවරුන් වශයෙන් වෛද්‍ය විද්‍යාලයෙන් පිට වෙනවා. නමුත් ලබන අවුරුද්දේ වෛද්‍ය විද්‍යාලයෙන් පිට වන වෛද්‍යවරුන්ට රජයේ රක්ෂාවල් සැපයීමට තරම් ශක්තියක් මේ ආණ්ඩුවට නැති බව අද දන්නවා. එසේ නම් එවැනි බැරෑරුම් ප්‍රශ්න විසඳීමට මේ ආණ්ඩුව අපොහොසත් වී තිබෙන නිසා ජනතාවගේ නාමයෙන් මේ ආණ්ඩුවට කරන්නට තිබෙන එකම යුතුකම ඉල්ලා අස් වී ගෙදර යාමයි.

ඊළඟට ජීවන වියදම් ප්‍රශ්නය ගනිමු. අප රට භාර දෙන අවස්ථාවේදී ජීවන අංකය 112 යි. දැන්, හත් හවුල් කාරයින්ගේ අවුරුදු තුනහමාරක පාලනයෙන් පසු ජීවන අංකය 121 ට නැග තිබෙනවා. මේ ආණ්ඩුව එක හාල් සේරුවක් කපා අනික් සේරුව නිකම් දෙනවා. ඒකත් ඇතිවයි ජීවන වියදම 121 ට නැග තිබෙන්නෙ. ඉතින් මේ ආණ්ඩුවේ බංකොලොත් භාවය, ප්‍රශ්න විසඳීමට ශක්තියක් නැති බව, මේ ආණ්ඩුවේ ක්‍රියා කලාපයෙන්ම ජනතාවට ඔප්පු වී අවසානයි.

දැන් මොහොතකට පෙර කර්මාන්ත හා ධීවර ඇමතිතුමා ජාතික සමගිය ගැන බොහොම වේගයෙන් කථා කළා. 1958 සිද්ධීන් ගැනත් එතුමා සඳහන් කළා. 1958 දී තිබුණු ඒ ආණ්ඩුවේ වගකිවයුතු ඇමතිවරයකු වශයෙන් කර්මාන්ත ඇමතිතුමා එදා ඒ අවස්ථාවේදී නිසොල්මන්ව සිට අද කථා කිරීමේ තේරුම කුමක්ද කියා මා එතුමාගෙන් ප්‍රශ්න කරනවා. මමත් ඒ ආණ්ඩුවේ සිටියා. 1958 දී ව ඒ සියලුම විපත්වල නායකයා එවකට තිබුණු ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයේ ඇමතිවරයකු වශයෙන් සිටි වර්තමාන කර්මාන්ත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇමතිතුමා බව මා නිර්භයවම කියනවා. අතීතය අමතක කර දැන් එතුමා ශුද්ධවන්තයකු හැටියට ජනතාව ඉදිරිපිට පෙනී සිටින්නට උත්සාහ දරනවා. ජාතික සමගියක් ඇති වෙනවාට අප සියලු දෙනාම සතුටුයි. නමුත් ජාතික සමගියක් ඇති විය යුත්තේ කුමන පදනමක්. උඩද කියන එකයි මේ රටේ තිබෙන ප්‍රශ්නය. හත් හවුල් ආණ්ඩුවක් පිහිටුවා ගත් පළියට ජාතික සමගියක් ඇති කළාය කියා තමුන්නාන්සේලා කියනවා නම් එය ව්‍යාජයක්, බොරුවක්, බව මා මේ ගරු සභාවේදී ප්‍රකාශ කරනවා. මේ හත් හවුල් ආණ්ඩුවේ එක කොටසක් තමයි ෆේඩරල් පක්ෂය නොහොත් ද්‍රවිඩ රාජ්‍ය පක්ෂය. ද්‍රවිඩ රාජ්‍ය පක්ෂයේ මූලික සිද්ධාන්තය මේ රටේ ෆේඩරල් ආණ්ඩුවක් පිහිටුවීමයි; මේ රට දෙකඩ කිරීමයි. කර්මාන්ත හා ධීවර ඇමතිතුමා "ශ්‍රී" බස් එකක් ගැන සඳහන් කරමින් මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමාට (මෛත්‍රීපාල සේනානායක මයා.) සමච්චල් කරන ආකාරයට කථා කළා. නමුත් සිංහල "ශ්‍රී" අකුර ගැසූ බස් යාපනයට යැවූ අවස්ථාවේ එය නොරිස්සූ ෆේඩරල් පක්ෂය නොහොත් ද්‍රවිඩ රාජ්‍ය පක්ෂය ඒ බස් වල තාර ගෑ අවස්ථාව මතකද? අදත් ද්‍රවිඩ රාජ්‍ය පක්ෂය සිංහල භාෂාව මේ රටේ එකම රාජ්‍ය භාෂාව හැටියට පිළිනොගන්න බව හත් හවුලේ ඇමතිවරුන් පිළිගන්නවාද? මා අභියෝග කරනවා ෆේඩරල් පක්ෂයේ මන්ත්‍රීවරුන්ට, පුළුවන් නම් මේ ගරු සභාවේ නැගිට "අප රාජ්‍ය භාෂා පනත පිළිගන්නවා" ය කියන්න. උතුරේ සිට දකුණ දක්වා මේ මුළු ලංකාවේ එකම රාජ්‍ය භාෂාව හැටියට සිංහල භාෂාව, නීතිගත කළ සිංහල පමණක් පනත අපි පිළිගන්නවා, යයි පුළුවන් නම් නැඟිට කියන ලෙස ෆේඩරල් පක්ෂයේ මන්ත්‍රීවරුන්ට මම අභියෝග කරනවා. එහෙම කියන්ට බැහැ. මේ රටේ සිංහලයන් නොරුස්සන, සිංහලය මේ රටේ රාජ්‍ය භාෂාව වශයෙන් පිළිනොගන්න, සිංහල ගුරුවරුන් උතුරට යවනවාට විරුද්ධ, මේ රටේ සිංහලයන්ගේ අයිතිවාසිකම් සියල්ලටම විරුද්ධ, රට දෙකට කඩන්ට උත්සාහ කරන පක්ෂයක් සමග ඇති කර ගන්න සමගිය මොන සමගියක්ද? එය ව්‍යාජ සමගියක් බව මේ ගරු සභාවට මතක් කර දෙන්ට කැමතියි. තමුන්නාන්සේලා ද්‍රවිඩ රාජ්‍ය පක්ෂය සමග ඇති කර ගත් සමගිය ධනපතිපන්තියක් සමඟ ඇති කර ගත් සමගියක් පමණයි. ෆේඩරල් පක්ෂයේ අතීතය අමතක කරන්ට එපා. ප්‍රගතිශීලී හැම පියවරකටම හැමදාම විරුද්ධ වූ එකම පක්ෂය ෆේඩරල් පක්ෂයයි. බස් ජනසතුවට, වරාය ජනසතුවට, තෙල් සමාගම් හා ඉන්ෂුවරන්ස් සමාගම් ජනසතුවට, මහජන බැංකුව පිහිටුවීමට, පාසල් රජයේ පාලනයට ගන්නවාට, කුඹුරු පනතට යන මේ හැම ප්‍රගතිශීලී කටයුත්තකටම විරුද්ධ වුණේ ෆේඩරල් පක්ෂයයි. එවැනි පක්ෂයක එක් අයෙකුට ඇමතිකමක් දුන් පමණින් ජාතික සමගියක් ඇති වෙනවද?

උතුරේ මාවිඩ්ඩපුරම් කෝවිලට ඇතුළු වී එක දෙවියන් අදහන්න හරිජන යයි කියන අසරණ අහිංසක ජනතාවට සමතත්ත්වයක් නොදෙන මේ ද්‍රවිඩ රාජ්‍ය පාක්ෂිකයන් සමග මොන ජාතික සමගියක්ද? මේ ආණ්ඩුව ජාතික සමගියක් ගොඩ නගන්න යන්නෙ ඔවුන් සමගද? දෙගොල්ල අදහන එකම දෙවියා ඉදිරිපිට සමානාත්මතාවක් ඇති කරන්ට බැරි මිනිසුන් අපට ජාතිවාදය ගැන බණ කියන්ට එනවා. ගරු කර්මාන්ත ඇමතිතුමා ජාතික සමගියක් ගැන කථා කළා. ගරු කථානායකතුමනි, ඔවුන් ගැන මීට වඩා කථා කරන්ට වුවමනාවක් නැහැ. ජාතික සමගියේ නැටිය පරණ වෙලා යයි මා හිතුවා. එහෙත් අද නැවතත් ඒක වාදනය කළා. බොහොම කාලයකින් ඒ ගැන කථා කළේ නැහැ. රට සහා ධවල පත්‍රිකාව පිළිබඳ විවාදයේදී මේ රජයේ ජාතික සමගිය රටට හොඳහැටි පෙනුණා. අප මෙතැන නොසිටි නිසා අපට පෙනුණේ නැහැ. ඒ විවාදයේදී, යාපනයේ ගරු මන්ත්‍රීතුමා (පොන්නම්බලම් මයා.) ද්‍රවිඩ රාජ්‍ය පක්ෂයට තදින් පහර ගැසුවා. ද්‍රවිඩ රාජ්‍ය පක්ෂයේ මන්ත්‍රීවරුන් අනික් පැත්තෙන් ඒ පැත්තේම සිටින යාපනයේ මන්ත්‍රීතුමාගේ පක්ෂයට පහර ගැසුවා. ඒ අතර ආණ්ඩු පක්ෂයේම සිටින මුස්ලිම් මන්ත්‍රීවරුන් ඒ දෙගොල්ලටම පහර ගැසුවා. සිංහල මන්ත්‍රීවරුන් කථා කරන්න භයේ පුවු රත් කරමින් ඕපියා. හොර ගිවිසුමේ ප්‍රතිඵලයක් වශයෙන් ඉදිරිපත් වූ යෝජිත රට සහා ධවල පත්‍රිකාව පිළිබඳ විවාදයේදී ඇතිවූ තත්ත්වය ඒකයි. එහෙත් මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන]

හත් හවුල්කාරයන් ලජ්ජා නැතිව අපි රටේ ජාතික සමගිය ඇති කළා යයි නන් දොඩවනව.

ගරු කථානායකතුමනි, දැන් ඒ තැටි යත් පරණ වෙලා තවත් අළුත් තැටියක් ගහනවා. ගරු රාජ්‍ය ඇමතිතුමා මේවා ගැන දන්නවද; මේවාට අනුමතිය දුන්නාද කියා මා දන්නෙ නැහැ. හැමදාම උදේ 7ට ගුවන් විදුලි යන්ත්‍රයේ බොත්තම කැරකෙව්වම ඇහෙන්නෙ මොකක් ද? "පැරකුම් යුගය උදා වෙනව. 1970 දී මේ රට ස්වයංපෝෂිත වෙනව. 1956 දී, තුන් කෝටි විසි ලක්ෂයයි." පටන් ගන්නෙ ගෑණු කට හඬකින්. නැවතත් පිරිමි කට හඬකින් කියනව, "1966 දී හාර කෝටි පනස් අට ලක්ෂයයි" කියා. නැවතත් තවත් කට හඬකින් කෙනෙක් කියනව, "1967 දී පන් කෝටි පනස් ලක්ෂයයි, වැඩි වී තිබෙන ප්‍රමාණය වී බුසල් එක් කෝටි අසූ නව ලක්ෂයයි. මේක ජනතා ජයග්‍රහණයකි" කියා. හැමදාම උදේ සිට රෑ වෙන තුරු, ලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් අපට ඇහෙන්න ඔය පදයයි. ගරු කථානායකතුමනි, ලංකා ගුවන් විදුලි සංස්ථාව ආණ්ඩුව යටතේ ක්‍රියා කරන සංස්ථාවක්. එවැනි සංස්ථාවකින් ජනතාවට අපක්ෂපාත ප්‍රවෘත්ති සපයනවා ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා. ඒ වගේම එහි වැඩ කටයුතු යම්කිසි තත්ත්වයක් ඇතිව නීත්‍යානුකූලව සිදු වෙනවා ඇතැයි අපි විශ්වාස කරනවා. එහෙත් අමූලික බොරු වපුරමින් රජයට ආවඩන්නට ලංකා ගුවන් විදුලි සංස්ථාව මේ අන්දමට උත්සාහ කරනව නම් ඒක ඉතාමත් නින්දනීය ප්‍රයත්නයක් බව මේ ගරු සභාවේදි කනගාටුවෙන් මතක් කරනවා. මේ ප්‍රචාරයේ ඇත්තක් තිබෙනවාද? ඇයි මේ අන්දමට ගණන් හිලව් විකෘති කර ජනතාවට ව්‍යාජ අදහස් දෙන්න උත්සාහ කරන්නෙ?

ලංකා ගුවන් විදුලි සංස්ථාව තිබෙන්නෙ අපක්ෂපාතව ජනතාවට සත්‍ය ප්‍රවෘත්ති සපයන්නයි. එසේ නැතුව රජයට ඕක්කු ගහන්න නොවෙයි. රජයට පන්දම් ඇල්ලීම පැත්තක තිබියදී, තමන්ගේ රාජකාරිය හරිහැටි කරන ලෙස ලංකා ගුවන් විදුලිය සංස්ථාවේ වන්දි භට්ටයන්ට දන්වන මෙන් මා ගරු මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මෙම ගණන් හිලවු හදා තිබෙන්නේ කොහොමද? තමුන්නාන්සේලා ආණ්ඩුව බාරගත් අවස්ථාවේදී—1965 දී—ඇති වුණු ගංවතුර ආදී වූ යම් යම් අවාසනාවන්ත ස්වභාවික සිද්ධීන් නිසා—මේ ආණ්ඩුවේ මූසලකම නිසායයි කියන්නට තරම් මා හරක නැහැ—ඒ අවුරුද්දේදී මේ රටේ වී නිෂ්පාදනය බුසල් 3 කෝටි 20 ලක්ෂය දක්වා අඩු වුණා. ඊළඟ අවුරුද්දේදී එය 4 කෝටි 58 ලක්ෂය දක්වා වැඩි වුණා. 1967 දී 5 කෝටි 51 ලක්ෂය දක්වා වැඩි වුණා. ගුවන් විදුලිය සංස්ථාවේ ප්‍රචාරකයන් කියන හැටියට, ඔවුන් ජනතාවට පෙන්වන්නට උත්සාහ කරන්නේ සිරිමා බණ්ඩාරනායක මැතිණියගේ රජය තිබුණු කාලයේදී මේ රටේ කෘෂිකාර්මික දියුණුවක් හෝ වී නිෂ්පාදනයේ වැඩි වීමක් හෝ ඇති නොවුණු බවයි. අන්න ඒකයි මේ ප්‍රචාරකයන් කියන පට්ටපල් බොරුව. ඔවුන් හැම තිස්සේම කියන්නේ 1965 දී වැඩි වුණු ගණන පමණයි. 1964 දී අප තමුන්නාන්සේලාට ආණ්ඩුව බාර දෙන විට, සිරිමා බණ්ඩාරනායක රජය යටතේ මේ රටේ වී නිෂ්පාදනය ඊට ඉහත කවදාවත් නොතිබුණු මට්ටමකට නැඟ තිබුණු බව—වී නිෂ්පාදනය අතින් වාර්තාවක් පිහිටුවා තිබුණු බව—ඔවුන් කියන්නේ නැහැ. එය වසන් කරනවා. ඒ කාලයේදී ඒ අස්වැන්න වැඩි වුණු ප්‍රමාණය අනුව ගණන් බැලුවොත් අද මේ ආණ්ඩුව ගෙන යන බොරුව පැහැදිලි වශයෙන්ම ඔප්පු කරන්නට පුළුවනි. එම නිසා, මේ ප්‍රශ්නය සම්බන්ධව "ඇත්ත" පත්තරයෙහි පළ වුණු වැදගත් ලිපි දෙකක් ඉදිරිපත් කරන්නට මා අදහස් කරනවා. "ඇත්ත" පත්තරයෙන් කියවනවාට මුදල් ඇමතිතුමා කැමැති නැද්ද?

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

ඕනෑ එකකින් කියවන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජෝර්ජ් රාජපක්ෂ මයා.
(திரு. ஜோர்ஜ் ராஜபக்ஷ)
(Mr. George Rajapaksa)

මේ ලිපි දෙක ලියා තිබෙන්නේ, සහතික මිළ ක්‍රමයට විසි වසරක් පිරීම නිමිත් තෙන් ගොවිජන සේවා නියෝජ්‍ය කොම සාරිස් වී. නවරත්න මහතාත් සමූපකාර සංවර්ධන කොමසාරිස් පතිරණ මහතාත් විසින් "ලංකාදීප" පත්තරයට සපයන ලද ලිපි දෙකක සඳහන් වුණු කරුණු අනුවයි. මේ රටේ වී අස්වැන්න පිළිබඳව ඒ දෙදෙනා දෙවිධියකට කරුණු දක්වන වා. සිරිමා බණ්ඩාරනායක රජය පැවති කාලයේදී මේ රටේ ගොවිතැන් කටයුතු වල කිසිම දියුණුවක් නොතිබුනු බවක් රටට පෙන්වීමට නවරත්න මහත් මයා උත්සාහයක් දරා තිබෙනවා. ඔහු එසේ කරන්නේ, මේ රජයට ආ වඩා පන්දම් අල්ලා ඊළඟ අවුරුද්දේදී ගොවිජන සේවා කොමසාරිස් වීමේ බලාපොරොත්තුවෙන් වෙන්න ඇති. ඔහු වී අස්වැන්න පිළිබඳව 1948 ගණන් හිලව් වලින් පටන් ගෙන ඊළඟට අවුරුදු 4ක් පන්නවා 1952 ගණන් ඉදිරිපත් කරනවා. ඊළඟට 1955 ත් ඊළඟට 1958 ත් ඊළඟට 1960 ත් ගණන් ඉදිරිපත් කරනවා. 1960 දී වී නිෂ්පාදනය බුසල් 4 කෝටි 30 ලක්ෂයක් බව ඔහු කියනවා. ඊළඟ අවුරුදුවල ගණන් ඔහුට අමතක වීමෙන්දෝ, එසේ නැත්නම් ඒවා හෙළි කළහොත් මේ ආණ්ඩුවේ බොරුව තව දුරටත් ගෙනයන්නට අමාරු වන නිසාදෝ, 1965 වනතුරු ගණන් හිලවු කොහේදෝ හංගාගෙන—රෙද්ද අස්සේදැයි මා දන්නෙ නැහැ—ඔහු ඊළඟට 1966 ගණන් ඉදිරිපත් කරනවා. 1964 දී සිරිමා බණ්ඩාරනායක රජය යට තේ වී නිෂ්පාදනය අතින් පිහිටුවන ලද වාර්තාව ගැන ඔහු වචනයක්වත් කියන් නේ නැහැ. ගොවිජන සේවා නියෝජ්‍ය කොමසාරිස්ගේ ගණන් හිලවු අනුව නම් ලංකා ගුවන් විදුලිය සංස්ථාව කියන දේ හරි. ඔවුන් කියන්නෙ 1965 සිට 1968 දක්වා කාලය තුළ වී අස්වනු ප්‍රමාණය බුසල් 1 කෝටි 89 ලක්ෂයක් වැඩි වී තිබෙන බවයි. එහෙත් ගරු කථානායක තුමනි, නියම වශයෙන් මෙය ගණන් ගත හැක්කේ මේ විධියටයි. අප රට පාල නය කරන කාලයේ, 1960 සිට 1964 දක්වා වී නිෂ්පාදනය පිළිබඳ සංඛ්‍යා ලේඛන මෙන්න. 1960—4,10,00,000යි. 1961—4,31,00,000 යි. 1962—4,80,00,000 යි. 1963—4,91,00,000 යි. 1964—5,05,00,000 යි. ඇයි මේ ගණන් කියන්න බැරි? මේ ගණන් හිලව්වලින් පෙනෙන්නේ 1960 සිට 1964 දක්වා වී නිෂ්පාදනය අනුක්‍රම යෙන් වැඩි වී තිබෙන බවයි. ඒ වැඩිවීමට හේතුවක් තිබෙනවා. මේ ආණ්ඩුව වගාව ගැන කොතෙක් කෑ ගසමින් කටයුතු කළත් එතුමන්ලා ඒ වගා කටයුතු කරන් නේ දොම්පේ මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) විසින් එදා ඉදිරිපත් කරන ලද කෘෂිකර්ම සැලැස්ම අනුවයි. දෙම්පේ ගරු මන්ත්‍රීතුමා විසින් එදා ඉදිරිපත් කරනු ලැබූ සැලැස්මේ නිෂ් පාදනයයි එතුමන්ලා අදත් ලබන්නේ.

ගරු කථානායකතුමනි, 1967 ගණනින් 1965 ගණන අඩු කර—අර ගංවතුර තිබුණ කාලයේ ගණන අඩු කර—කියනවා 1,94,00,000 කින් අස්වැන්න වැඩි වී තිබෙනවාය කියා. අනේ පිං සිද්ධ වේවි, ඒ ගණන 1964 ගණනින් අඩු කරන්න. 1967 වී නිෂ්පාදනය 5,51,00,000 යි. 1964 සිරිමා බණ්ඩාරනායක මැතිණියගේ කාලයේ 5,05,00,000 යි. එතකොට එතුමන්ලා මිනි මොක් රථ, ට්‍රැක්ටර්, යන්ත්‍ර සූත්‍ර, වෙලෝනා කාරයන්, මොරටුවේ ගරු මන්ත්‍රීතුමා (එම්. රස්කින් ප්‍රනාන්දු මයා.) ආදී ලොකු ලොක්කොත්, පත්‍රත්, ගුවන් විදුලියත් ආදී සියල්ලම එකතුව කරන ලද වගා ව්‍යාපාරයෙන් වැඩි වී තිබෙන්නේ වී බුසල් ලක්ෂ 94 ක් පමණයි.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

ලක්ෂ 94 යි කියන්නේ nine million.

ජෝර්ජ් රාජපක්ෂ මයා.
(திரு. ஜோர்ஜ் ராஜபக்ஷ)
(Mr. George Rajapaksa)

හරි, nine million තමයි. එතකොට එතුමන්ලා වැඩි කර තිබෙන්නේ ලක්ෂ 94 ක් පමණයි. 1964 සිට අද වන තුරු මේ සේරම දහඅට පාලියම එක්ක වැඩි කර තිබෙන්නෙ ඔපමණයි. ඔය ටිකට තමයි එතුමන්ලාගේ මේ කන් කෙඳිරිය අපට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් රාජපක්ෂ මයා.]

අහන්න වෙලා තිබෙන්නෙ. උදේ සිට රෑ වනතුරු රේඩියෝ එකේ කන් කරච්චලේ ඉන්න බැහැ, පැරකුම් යුගයක් උදා වෙන වලු. මේ කරච්චලය කොයි තරම් තිත්ත වී තිබෙනවාද කියතොත්, ධනපති පත්‍රකාරයනුත් දැන. රේඩියෝ එක වහනවා; විවේචනාත්මක ලිපි ලියනවා. එක්තරා ධනපති පත්‍රයක ඉතාමත් හොඳට විග්‍රහ කර තිබුණා. ඉස්සර, කථානායකතුමනි, ලේක්හවුස් එක විසින්ම තමන්ගේ ආයතනය ගැන විරුදාවලි නාමයක් සදා කියන්න යෙදුණා. Watchdog of the Nation නොහොත් ජාතියේ මුර බල්ලෝය කියා: ඉතින් ඒ බල්ලෝ කියන හැටියට ගරු කථානායකතුමනි, 1968 අගෝස්තු මස 1 වෙනිදා "සිළුමිණ" පත්‍රයේ කතුවැකියෙන්ම මම කරුණු ඉදිරිපත් කරන්නම්. ඒ කතුවැකිය සම්පූර්ණයෙන්ම මා කියවන්න ඕනෑ. ඒ මන්ද? මා කී වචන ටිකේ සාරාංශය සම්පූර්ණයෙන්ම එහි ගැබ් වී තිබෙන නිසයි. 1968 අගෝස්තු 1 වෙනිදා "සිළුමිණ" පත්‍රයේ කතුවැකියේ මෙසේ සඳහන් වෙනවා:

"පැරකුම් යුගයක් උදා කරමු! පැරකුම් යුගයක් උදා කරමු! සැමදාමත් උදේ හතේ පටන් රෑ නින්දට යන තුරුත් ගුවන් විදුලියෙන් පැරකුම් යුග බිහි කරවති. බෙර හඬවා-ඝණ්ඨා නාද කරවා තොරතෝංචියක් නැතිව කරන මේ කන් කෙඳිරිය ගුවන් විදුලියට ඇහුම්කන් දෙන්නවුනට දුන් කරච්චලයකි."

ගරු මුදල් ඇමතිතුමනි, මේ තමුන්නාන්සේගේ නෑයන්ගේ පත්තරේ.

"එය 'පැරකුම් යුගයට' කරන සමච්චලයක් බවට දැන් පරිවර්තනය වී ඇත. ඒ නිසරු කන් කෙඳිරියකිය නිසා වැය වන ශ්‍රමය ගැන අපි අපේ කනගාටුව පළ කරමු.

ගුවන් විදුලියෙන් කෙඳිරි ගගා බිහි වූ පැරකුම් යුගයක් ගැන අපි නොඇසීමු. ගුවන් විදුලියෙන් නෙලුම් කවි කියවා බිහි වූ පැරකුම් යුගයක් මේ රටේ නොවිය."

බොහෝම හරි.

"එහෙත් අද ගුවන් විදුලි තරංග මාලා ඔස්සේ පැරකුම් යුගයක් බිහිකරවීමට තතනති. මෙබඳු නිෂ්ඵල ප්‍රයත්නයන් කෙරෙහි වැය කරනු ලබන මිනිස් ශ්‍රමයත් කාලයත් ගැන කවුරු හෝ වග කිව යුතුය."

විශේෂයෙන්ම මේ කාරණය පෙන්නා දෙන්න ඕනෑ. මේ අන්දමට කරන බොරු ප්‍රචාරයන්ට කවදා හෝ නිලධාරීන් මහ ජනතාවට වග කියන්න ඕනෑ.

"පසුගිය වසරේ ගෙන්වූ ප්‍රමාණයට වඩා අඩුවෙන් සහල් මේ වසර තුළදී මේ රටට ආනයනය කරනු ලබන බවක්ද 'පැරකුම් යුග කන්කෙඳිරියෙන්' රටට මුරගා කියයි. එය කිව යුත්තක්දැයි මෙහිදී ප්‍රශ්න කරමු. මේ රටේ පාරිභෝගිකයා සඳහා වූ සහල් සලාකයෙන් හරි අඩක් කපා හැර ඇති බවක් මේ ප්‍රචාරකයනට අමතක වී නම් අපි කනගාටු වෙමු. පාරිභෝගිකයාට බෙදා දුන් සලාකයෙන් හරි අඩක් කපා හැරි විට අවශ්‍ය වූ සලාක ප්‍රමාණය අඩු වී යාම ආශ්චර්යයක් යැයි හඳුන්වමුද?"

හාල් සලාකය කපා, ඒ හාල් ප්‍රමාණය පිටරටින් ගෙන්වූයේ නැහැ. එයින් විදේශ විනිමය ප්‍රමාණයකුත් ඉතිරි වුණා. මෙය මහ ලොකු හපන්කමක් හැටියට පෙන්නා දෙන්න උත්සාහ කරනවා.

"එය ගුවන් විදුලියට මහත් ආශ්චර්යයක් වනු ඇත. එහෙත් මේ රටේ වෙසෙන පොදු මිනිසා එහි නියම තත්ත්වය දනී."

හත් හවුල දන්නෙ නැතුවාට මේ රටේ පොදු මහජනතාව එය දන්නවා. ඒ අය රවටන්න බැරි බව දැන්වත් අවබෝධ කර ගන්න ඕනෑ.

"වගා කරව්! වගා කරව්!! කීපමණින්ම වගා කරන්නෝත් වෙත්ද? වගාව සඳහා අත්‍යාවශ්‍ය ඉඩම් ගොවි උපකරණ බීජ හා පොහොරත් ගුවන් විදුලි තරංග මාලා ඔස්සේ පහළ වේදැයි විමසිය යුතුය. පොළොව කොටා බිම් සකස් කර පොහොර යොදා වගා කළොත් පමණක් මේ රටට අවශ්‍ය දෑ මේ පොළොවෙන් ලබාගත හැකියැයි අපි සිතමු. ගුවන් විදුලි තරංග මාලා ඔස්සේ වැවෙන බෝග වගාවන් ගැන මෙරට වැස්සෝ නොදනිති."

ජාතියේ මුර බල්ලොයි එහෙම කියන්නේ.

"රජ්ජුරුවන්ට නැතූ සුදු හකුරු පිළිබඳ පුරාවෘත්තයක් මේ රටේ ප්‍රාථමික පංතිවල ඉගෙන ගන්නා කුඩා දරුදැරියෝ පාසල්වලදී කියවති. එසේම කියන්නා කෙසේ කීවත් අසන්නා සිහි බුද්ධියෙන් ඇසිය යුතුයැයි අපේ පැරණිගැමියෝ සිය කථාබහේ දී නිතර නිතර උපමා විලාශයෙන් ව්‍යවහාර කරති."

මේවා කියන්නේ මේ ආණ්ඩුවට උදව් කළ බේරේ ගෙදර පත්‍රකාරයොයි.

"අත වැනුනොත් කටත් වැනෙනැයි අපේ ගැමියෝ කියති. අපිද ඒ නිගමනයෙහි හරය දකිමු. අපි ඒ අනුමත කරමු. ඒ හැර කයිවාරුවෙන් තත්දෙඩවීමෙන් මැසිවිලි නැඟීමෙන් පැරකුම් යුග උදා නොවන බැව් ගුවන් විදුලියේ වගකිව යුත්තන්ට මතක් කරමු."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රාජ්‍ය ඇමතිතුමා විශේෂයෙන් මේවා සිතේ තබාගන්න.

"චිරක්කරයේ හාස්කම් එදා ජීවත් වූ පැරකුම් යුග වාසීහු නුදුටුහ. ගුවන් විදුලියේ සංගීත රාවය එදා ඔවුහු නොලදහ. පෙරහැර පාවාඩ හා මඟුල් බෙර හඬ මැද්දේ පොල්තෙල් පහන් දල්වා සහල්මැව් මේ හාස්කම් ගැන ඔවුහු විශ්වාසයක් නොතැබූහ. ඔවුහු උදැල්ලත් නගුලත් ගෙන කුඹුරට බටහ. කුඹුරු කරවා පෝහොර යොදවා ඉහළම අස්වැන්නක් ලැබූහ. අටු කොටු පුරවා ගත්හ."

ඒ පැරකුම් යුගයේදී. ඒ කාලයේදී ට්‍රැක්ටර්, ජීප්, ගුවන් විදුලි යන්ත්‍ර, කැමරා තිබුණේ නැහැ.

"ගොවියාගේ අටුකොටු පිරීයත්ම රටේ සරුසාර භාවය වැඩිවී ගියේය. අඟහිඟ කමින් අත් මිදුනු රට වැස්සෝ රටේ අනාගත දියුණුව සඳහා සිය ශ්‍රමය වැය කළහ. ඒ හැර අනතින් ලැබෙන වරප්‍රසාදයක් ගැන හෝ මෙතෑනින් විශේෂ වාසියක් තකා මැසිවිලි ගායනයෙහි නොයෙදුනහ. වන්දි හට්ටකම් නොකළහ."

ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)
(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)

මොකක්ද පත්‍රය?

ජෝර්ජ් රාජපක්ෂ මයා.
(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)
(Mr. George Rajapaksa)

"සිළුමිණ" පත්‍රය. මේකත් බේරේ ගෙදර පත්‍රයක්.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

වෙන්න බැහැ.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා. (දොම්පෙ)
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க—தொம்பே)
(Mr. F. R. Dias Bandaranaike—Dompe)

තමුන්නාන්සේලා එදා ආරක්ෂා කරන්න සටන් කළ බේරේ ගෙදර පත්‍රවලින් මයි මේවා කියන්නෙ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please! The Sitting is suspended for half an hour. On resumption the Hon. Deputy Speaker will take the Chair.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 4.30 ට නියෝජ්‍ය කථානායකතුමාගේ [එම්. සිවසිතම්පරම් මයා.] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

இதன்படி அமர்வு பி. ப. 4.30 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று, உப சபாநாயகர் அவர்கள் [திரு. எம். சிவசிதம்பரம்] தலைமை தாங்கினார்கள்.

Sitting accordingly suspended till 4.30 P.M. and then resumed, MR. DEPUTY SPEAKER [MR. M. SIVASITHAMPARAM] in the Chair.

ජෝර්ජ් රාජපක්ෂ මයා.
(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)
(Mr. George Rajapaksa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තේ පානයට පෙර මා විස්තරයක් කරමින් සිටියේ, මේ රටේ නිෂ්පාදනය පිළිබඳව ගොවි ජන සේවා නියෝජ්‍ය කොමසාරිස්තුමා විසින් "ලංකාදීප" පත්‍රයේ සහතික මිල සම්බන්ධ අතිරේකයට ලියන ලද ලිපියක ව්‍යාජ ලේඛන ගැනයි. ඊට වඩා අපක්ෂපාතී ලෙස නියම ගණන්හිලව්වලින් යුක්තව එම අතිරේකයටම වාර්තාවක් සැපයූ සමුපකාර සංවර්ධන කොමසාරිස් වී. පතිරණ මහතාගේ ලිපියෙහි සඳහන් වී තිබෙන වී වගාව පිළිබඳ ගණන් හිලව් ටිකක් වාර්තාගත වීම සඳහා මේ අවස්ථාවේදී ඉදිරිපත් කරන්නට කැමතියි. පතිරණ මහතා 1958 සිට 1967 දක්වා වර්ෂයෙන් වර්ෂය මේ රටේ වී නිෂ්පාදනය පිළිබ සංඛ්‍යා ලේඛන නියම අන්දමට, ඒ කිසිවක්ත් කිසිවක් හංගන්නේ නැතුව, ප්‍රකාශ කර තිබෙනවා. මෙම සංඛ්‍යා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් රාජපක්ෂ මයා.]
ලේඛනවල දී තිබෙන්නේ වී බුසල් ප්‍රමාණයන් ගෙනුයි. ඒ මෙසේයි: 1958 දී බුසල් 3 කෝටි 60 ලක්ෂයයි. 1959 දී බුසල් 3 කෝටි 64 ලක්ෂයයි. 1960 දී බුසල් 4 කෝටි 10 ලක්ෂයයි. 1961 දී බුසල් 4 කෝටි 31 ලක්ෂයයි. 1962 දී බුසල් 4 කෝටි 80 ලක්ෂයයි. 1963 දී බුසල් 4 කෝටි 91 ලක්ෂයයි. 1964 දී බුසල් 5 කෝටි 5 ලක්ෂයයි. මෙම ගණන්හිලව් වලින් එක්තරා කාරණයක් පැහැදිලි වෙනවා. 1958 සිට 1964 දක්වා වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩු කාලයේ දී මේ රටේ වී නිෂ්පාදනය ක්‍රමානුකූලව වැඩි වී තිබෙනවා. වර්ෂයක් වර්ෂයක් පාසා වී නිෂ්පාදනය අඩු වූයේ නැහැ; වැඩි වී තිබෙනවා. එහෙත් 1965 හත් හවුල පාලනය භාර ගත්තායින් පසුව සිදු වූයේ කුමක්ද? 1965 දී වී නිෂ්පාදනය 3 කෝටි 62 ලක්ෂයට බැස්සා. 1966 දී 4 කෝටි 58 ලක්ෂයයි. 1967 දී 5 කෝටි 50 ලක්ෂයයි. මෙම සංඛ්‍යා ලේඛනවලට අනුව කරුණු දෙකක් පැහැදිලියි. 1958 සිට 1964 දක්වා වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩු සමයේදී මේ රටේ වී නිෂ්පාදනය වී බුසල් 1 කෝටි 39 ලක්ෂයකින් වැඩි වුණු බව පෙනෙනවා. ඒවාගේම 1960 සිට 1964 දක්වා වූ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩු කාලයේදී මේ රටේ වී නිෂ්පාදනය වී බුසල් 95 ලක්ෂයකින් වැඩි වී තිබෙනවා. තේ පානයට පෙර මා කථා කරමින් සිටිය දී මෙම සංඛ්‍යාව වැරදි අන්දමකට සඳහන් වුණා. මා දැන් එය නිවැරදිවයි කියන්නේ. 1960 සිට 1964 දක්වා වූ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩු කාලයේදී වී නිෂ්පාදනය බුසල් 95 ලක්ෂයකින් වැඩි වී තිබෙනවා. එහෙත් 1964 සිට 1967 දක්වා වූ කාලය තුළ ඒ කියන්නේ හත් හවුල් පාලන කාලය තුළ වී නිෂ්පාදනය වැඩි වී තිබෙනනේ බුසල් 45 ලක්ෂයකින් පමණයි. එයින් පෙනී යනවා, ගුවන් විහිළු සංස්ථාව දැන් හංගන්නට උත්සාහ කරන්නේ මෙම ඉලක්කම බව. මෙම ඉලක්කම්වලට අනුව පැහැදිලි ලෙස පෙනී යන්නේ මේ අය කොතරම් කයිවාරු ගැසුවත් මෙම වගා ප්‍රෝඩාවෙන් ජනතාව ඉදිරියට රවටන්නට බැරි බවයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සහල් සලාකය කපන්නට යන අවස්ථාවේ දී හත් හවුල් රජයේ ගරු මුදල් ඇමතිතුමා අපට කිව්වේ කුමක්ද? සහල් සලාකය කපන්නේ පිටරට ජාත්‍යන්තර වෙළඳ පොළේ සහල් නැති නිසාය කිව්වා. එතුමා එදා ඉදිරිපත් කළ ප්‍රධාන තර්කය එයයි. එහෙත් අපට දැන් පැහැදිලි ලෙසින්ම පෙනෙනවා මුදල් ඇමතිතුමා සහල් සලාකය කපන්නට තීරණය කළේ ජාත්‍යන්තර වෙළඳ පොළේ සහල් නැති නිසා නොව සහල් මෙරටට ගෙන්වීම අඩු කිරීමෙන් ඉතාමත්ම අවශ්‍යව තිබූ විදේශ විනිමය ආරක්ෂා කර ගැනීම සඳහාය යන්න. ඒ බව තමුන්නාන්සේලා පිළිගන්නවා ඇති. ගරු මුදල් ඇමතිතුමා එය පිළිගන්නවාද? [බාධා කිරීමක්.] ගරු මුදල් ඇමතිතුමා එය පිළිගන්නා බව පෙනෙනවා. එයින් ඔප්පු වන්නේ 1966 දෙසැම්බර් 17 වන දින සහල් සලාකය කැපූ අවස්ථාවේදී ජනතාවට කී කාරණය සම්පූර්ණයෙන්ම අසත්‍යයක් බවයි. මේ රජය සහල් සලාකය කැපුවේ ජාත්‍යන්තර වෙළඳ පොළේ සහල් නැති නිසා නො වෙයි; විදේශ විනිමය ආරක්ෂා කර ගැනීමටයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හාල් සලාකය කැපීම නිසා ඇති වුණ තත්ත්වය මොකක්ද? මහ බැංකු වාර්තාවෙන් එය බොහොම හොඳට පැහැදිලි වෙනවා. හාල් සලාකය කැපීම නිසා විදේශ විනිමය ඉතුරු වී තිබෙන බව හොඳට පැහැදිලි වෙනවා. ආහාර කොමසාරිස්තුමාගේ වාර්තා අනුව මහ බැංකු වාර්තාවේ එය බොහොම හොඳට පැහැදිලි කර තිබෙනවා. 1966 දී පිටරටින් හාල් ටොන් 494 දහසක් මේ රටට ගෙන්වා තිබෙනවා. 1967 දී ගෙන්වා තිබෙන්නේ හාල් ටොන් 381 දහසක් පමණයි. ඒ අනුව 1967 දී ගෙන්වන ලද හාල් ප්‍රමාණය ටොන් 113 දහසකින් අඩු වී තිබෙනවා. ඊළඟට 1966 දී පිටි ටොන් 264 දහසක් මේ රටට ගෙන්වා තිබෙනවා. 1967 දී පිටි ටොන් 517 දහසක් ගෙන්වා තිබෙනවා. හාල් සලාකය කැපීම හේතු කොට ගෙන වැඩිපුර පිටි ටොන් 253 දහසක් මේ රටට ගෙන්වීමට සිදු වී තිබෙන බව දැන් තමුන් නාන්සේලාට පැහැදිලිව පෙනෙනවා ඇති. තමුන්නාන්සේලා කියන පරිදි වගා ව්‍යා[...] දියුණු වුණේ නම්, 1966 දී ගෙන්වන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලද පිටි ප්‍රමාණය මෙන් දෙගුණයක් පමණ. 1967 දී ගෙන්වන්න සිදු වුණේ ඇයි? අපි අහන ප්‍රශ්නය එයයි. ඒ නිසා දැන් තමුන්නාන්සේලා පිළිගන්නවා ඇති, හාල් සේරුව කැපීමෙන් විදේශ විනිමය ඉතිරි කර ගැනීමට බැරි වුණ බව. තමුන්නාන්සේලාට, හාල් ගෙන්වනන්ට වඩා විශාල මුදලක් පිටි ගෙන්වීම සඳහා වැය කිරීමට සිදු වී තිබෙනවා. තමුන්නාන්සේලා කර තිබෙන්නේ අපේ ජනතාවට, මේ රටේ දුක් විඳින ජනතාවට පුස් පාන්, පුස් රොටි ආදිය කන්න දී පැරකුම් ඇති කර වීමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එක් කරුණක් කියන්න කැමතියි. පැරකුම් යුගයේදී රටට අවශ්‍ය තරම් පමණක් නොවෙයි, පිටරට යැවීමටත් හාල් නිෂ්පාදනය කළේ සුමානයකට එක් හාල් සේරුවක් කමින් ජීවත්වුණ අය විසින් නොවෙයි. ඒ කාලයේ මේ රටේ හොඳ ශක්ති සම්පන්න, හොඳට වගා කරන්න දන්න ගොවි ජනතාවක් සිටියා. ඒ අය විසින් තමයි, මේ රටේ පැරකුම් යුගයක් බිහි කළේ. පුසා පාන්, පුස් රොටි, පිට්ටු ආදිය ඒ වගේම දවස හතකට එකා හාල් සේරුවක් පමණක් කන මේ රටේ ගොවි ජනතාවට පැරකුම් යුගයක් බිහි කිරීම කෙසේ වත් කරන්න නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පැරකුම් යුගයේ සිටි අපේ ගොවි ජනතාව උදේටත් බත් කෑව, දවල්ටත් බත් කෑව, රෑටත් බත් කෑව—තුන් වේලටම බත් කෑව. ඔය විධියට තුන් වේලටම බත් කමිනුයි ඒ අයට පැරකුම් යුගයක් බිහි කරන්න පුළුවන් වුණේ. පුස් පාන්, පුස් රොටි, පිට්ටු ආදිය කාල නොවෙයි. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව විසින් හාල් සේරුව කැපීම නිසා මේ රටේ ගොවි ජනතාවට පුස් පාන්, පුස් රොටි ආදිය කන්න සිදු වී තිබෙනවා. මේ රටේ ගොවි ජනතාව හොඳ ශක්ති සම්පන්න පුද්ගලයන් කරන තෙක්, මේ රටේ ගොවි ජනතාවට පෝෂ්‍යදායක ආහාර කන්න දෙන තෙක් තමුන්නාන්සේලා කියන ඔය පැරකුම් යුගය නැවතත් මේ රටේ ඇති කරන්න පුළුවන් වන්නේ නැහැ. ඒ නිසා තමුන්නාන්සේලා ගෙන යන ඔය ව්‍යාපාරය දිය මත අඳින ඉරක් මෙන් නැත්නම් වැල්ලේ තබන අඩියක් මෙන් වෙනවාට කිසිම සැකයක් නැහැ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් ඇති වී තිබෙන තත්ත්වය ඒ ආකාරයට ගුවන් විදුලිය මගින් ප්‍රචාරය කරවන්න ඕනෑ. දැනට ගුවන් විදුලිය මගින් කරන ප්‍රචාරයන් සම්පූර්ණ ප්‍රෝඩාවක් බව කියන්න ඕනෑ. ඒ බව මහජනතාවත් දැනගන්න ඕනෑ. ඇයි මේ විධියේ වගා ප්‍රෝඩාවක් කර ගෙන යන්නෙ? ගුවන් විදුලි සංස්ථාවේ සිටින වන්දි භට්ටයන් ලවා මෙහි තිබෙන ඇත්ත තත්ත්වය රටට පැහැදිලි කරවන්නෙ නැත්තේ ඇයි? ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් තවත් වැඩියෙන් කරුණු දක්වීමට වුවමනාවක් නැහැ. නමුත් මා එක් කරුණක් කියන්නට ඕනෑ. තමුන්නාන්සේලා විසින් නිකුත් කරන ලද 1966-67 කෘෂිකර්ම සංවර්ධන යෝජනාවලියේ මෙන්න මේ විධියට කියා තිබෙනවා:

"ආසියාතික සෙසු රටවල මෙන් ලංකාවේ වී ගොවිතැන පහත සඳහන් හේතුන් නිසා දියුණු කළ නොහැකි වී තිබේ. ලංකාවේ ඉඩම්වලින් සියයට 64 ක් පමණ අක්කරයට අඩු බිම් කට්ටියි. සියයට 36 ක් පමණ අක්කර බාගයට අඩු ඒවායි. . . ." සියයට 85 කට පමණ ඉඩම් අක්කර දෙකකට අඩුයි. අයිතිකරුවන් වගා කරන්නේ මෙම ඉඩම්වලින් සියයට 60 කි. කුඹුරුවලින් සියයට 25 සිට 30 දක්වා පමණක් වගා කරන්නේ අඳ ගොවීන් ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ගොවියෝ සාමාන්‍යයෙන් ණය ගැතියෝය. නිෂ්පාදනයෙහිලා තමන්ගේ ශ්‍රමයට වැඩි ධනයක් ආයෝජනය කළ නොහැකි ඔවුහු දුර්වල ආර්ථික හේතුන් නිසා හීන වූ නිෂ්පාදනයෙන් විපාක දෙන විෂම චක්‍රයකට ගොදුරු වූවෝ වෙති.

මේ විග්‍රහ කරන්නේ මේ රටේ ගොවි ජනතාව ගැනයි. මෙයින් පැහැදිලි වන්නේ මේ රටේ ගොවි ජනතාවගෙන් සියයට 85 ක් අක්කර දෙකකට අඩු බිම් ප්‍රමාණයක් බැගින් වගා කරන බවයි. ගොවි ජනතාවගෙන් සියයට 85 ක් අක්කර දෙකකට අඩු බිම් ප්‍රමාණයක් බැගින් වගා කිරීමෙන් නම් කොතරම් හොඳින් වගා කළත් එයින් තමුන්නාන්සේලා අද ඉදිරිපත් කරන තර්කය සනාථ වන්නේ නැහැ. අද මේ රටේ ගොවි ජනතාවට හුඟක් සල්ලි තියෙනවාලු. කොතරම් නම් සල්ලි තියෙනවාදැයි කියතොත් ඒ සල්ලිවලින් කර කියා ගන්නට දෙයක් නැතුව සුරාසල්වලට ගොස් සුම්හිරි පානේ පදමට ගසමින් කාලය නාස්ති කර දමනවාලු. ලැබෙන ආදායමින් කර කියා ගන්නට දෙයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් රාජපක්ෂ මයා.]

නැතිලු. ඔවුන්ට මිල දී ගැනීම සඳහා සුඛෝපභෝගී භාණ්ඩ මේ රටේ නැතිලු. ඒ නිසා විදේශ විනිමය සහතික පත් ක්‍රම යක් ඇති කොට එහි ආධාර යෙන් සුඛෝපභෝගී භාණ්ඩ ගෙන්වා බ්ලැක් මාකට් මිලට ඒවා ගොවීන්ට විකුණන්නට ඕනෑ යයි ලෝක බැංකුව කියනවා. ගොවීන් ට ඔර්ලෝසු දෙන්නට ඕනෑලු. අයිස් පෙට්ටි දෙන්නට ඕනෑලු. ඇත්තෙන්ම මේ ආණ්ඩුව කියන සෞභාග්‍යය මේ රටේ ගොවි ජනතාවට නම් උදාවී නැහැ. ගොවි ජනතාවට සෞභාග්‍යය උදා වී තිබෙනවා යයි කියතොත් එය සම්පූර්ණයෙන් ම අසත්‍යයි. අපේ ගම්වලට ගොස් ගොවි ජනතාවගේ තත්ත්වය කුමක්දැයි සොයා බලන්න. හම්බන්තොට, තිස්සමහාරාමය පැත්තට ගොස් ගොවීන්ගේ තත්ත්වය කුමක්දැයි බලන්න. යෝධ වැව යටතේ වැඩ කරන කුඹුරුවල තත්ත්වය කුමක් දැයි බලන්න. මේ කන්නයේදී යෝධ වැව යටතේ වැඩ කරන කුඹුරුවලින් එක වී ඇටයක්වත් ලබා ගන්නට බැරි බවට තිස්සමහාරාමයේ ගරු මන්ත්‍රීතුමා මාත් සමග එකඟ වෙනවා ඇතැයි මා කල්පනා කරනවා.

සී. එෆ්. ඩබ්ලිව්. එදිරිසූරිය මයා. (තිස්ස මහාරාමය)

(திரு. சி. எப். டபிள்யூ. எதிரிசூரிய—திசமகரும)

(Mr. C. F. W. Edirisuriya—Tissamaharama)

ඇත්ත තමයි.

ජෝර්ජ් රාජපක්ෂ මයා.

(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)

(Mr. George Rajapaksa)

එහෙම නම් මේ රටේ ගොවීන්ට මේ තරම් සෞභාග්‍යයක් උදා වී තිබෙනවා යයි තමුන්නාන්සේලා කියන්නේ කොහොමද? මොකක්ද ඔය කරන තර්ක යේ හරය? මේ රටේ ගොවි ජනතාව රව ටන්න එපා. ගොවි ජනතාවට බොරු කියන්නට එපා. සත්‍යය ප්‍රකාශ කොට ඔවුන්ගේ සහයෝගය ලබාගෙන වගාව දියුණු කරන්නට උත්සාහ ගන්නා ලෙස මා මේ අවස්ථාවේදී මේ ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා. ඇත්තෙන්ම වී වගාවෙන් ප්‍රයෝජන ලැබී තිබෙනවා නම් එසේ ලැබී තිබෙන්නේ අහිංසක ගොවියන්ට නොව ඔවුන් සූරාකන ගම්භාරයන්ට පමණයි. ඒ හැරෙන්නට සාමාන්‍ය ගොවිජනතාවට උදා වූ සෞභාග්‍යයක් නැහැ.

ගුවන් විදුලි සංස්ථාව වගා ව්‍යාපාරය ගැන ප්‍රචාර කරතත් එහි සිටින අය වගාව ගැන මොකවත් දන්නේ නැහැ. ඒ අය ගොවි ජනතාවගේ නියම තත්ත්වය දන් නේ නැහැ. ආහාර නිෂ්පාදනය කිරීමට අවශ්‍ය කරන දේවල් ගැන දන්නේ නැහැ. දනට කරගෙන යන නොමනා ප්‍රචාරය අසාගෙන සිටින අපේ ගොවි ජනතාවට හිනා යනවා. ඇත්තෙන්ම මේ ප්‍රචාරය විහිළුවක්.

මේ හත් හවුල් ආණ්ඩුව බලයට පත් වීමෙන් පසුව පවත්වන්නට යෙදුණු ප්‍රථම රාජාසන කථාව මගින් ගොවි ජනතාවට එක්තරා පොරොන්දුවක් දෙන්නට යෙදුණා. බලය ලැබී උදම් වූ හත් හවුල් ආණ්ඩුව සිය ප්‍රථම රාජාසන කථාව මගින් මේ රටේ අඳ ගොවියන්ට එක්තරා වැදගත් පොරොන්දුවක් දුන්නා. ඒ මොකක්ද? ඒ අඳ ගොවීන් ගොවිතැන් කරන ඉඩම් ඔවුන්ට සින්නක්කර පවරා දෙන බවයි. මෙය උතුම් ප්‍රතිපත්තියක් ගැබ් වූ යෝජ නාවක්. පොළොව කොටන්නාට පොළොවේ අයිතිය තිබිය යුතුයි. ඒ අයි තිය පොළොව කොටන්නාට දෙන බවට තමුන්නාන්සේලා මුල් රාජාසන කථා වෙන්ම පොරොන්දු වුණා. එහෙත් මේ ආණ්ඩුව බලයට පත් වී දනට අවුරුදු තුන හමාරක් ගත වී ඇතත් තවමත් ඒ පොරොන්දුව ඉෂ්ට කෙළේ නැහැ. මුල් රාජාසන කථාවෙන් දුන් පොරොන්දුව තමුන්නාන්සේලා කඩ කර දමා තිබෙ නවා. ගොවීන්ට දුන් ඒ පොරොන්දුව ඉෂ්ට කර දෙන්නේ නැතිව අද ඔවුන්ට නිකම් ආවඩනවා. ගොවියාගේ සහයෝගය ඔය අන්දමට නම් ලබා ගන්නට බැහැ. ඇත්තෙන්ම තමුන්නාන්සේලා බලයට පත් වීමෙන් පසුව ගොවීන්ට ලබා දුන් එක සහනයක් නම් කරන ලෙස මා මතක් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

වී බුසලට රුපියල් 14 බැගින් දෙන්නට පටන් ගත්තා. ඒක හොඳ නැද්ද?

ජෝර්ජ් රාජපක්ෂ මයා.
(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)
(Mr. George Rajapaksa)

මම ඒ ගැන කියන්නම්. තමුන්නාන්සේලා රුපියල් 14 බැගින් දෙන්නට පටන් ගත්තා තමයි. ඒ අතර තමුන්නාන්සේලා 1966 දෙසැම්බර් මාසයේදී හාල් සලාකය කපා දැම්මා. 1967 නොවැම්බර් මාසයේදී වී බුසලට වැඩිපුර රුපියල් දෙකක් දෙන්නට පටන් ගනිමින් තවත් වැඩක් කළා. ඒ ගැන මේ උදවියට මතක නැද්ද? අප වී බුසලට රුපියල් 12 ක් දුන්නා.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

එදා රුපියල් 12 බැගින් දෙන්නට පටන් ගත්තෙත් අපමයි.

ජෝර්ජ් රාජපක්ෂ මයා.
(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)
(Mr. George Rajapaksa)

අපේ ආණ්ඩු කාලයේදී අප සහතික මිල යෝජනා ක්‍රමය යටතේ වී බුසලකා ගත්තේ රුපියල් 12 ගණනේයි. මේ ආණ්ඩුව වී බුසලක මිල රුපියල් දෙකකින් වැඩි කළා. රුපියල් දහහතර බැගින් වී බුසලකට දැන් ගෙවනවා. එහෙත් ඇත්ත වශයෙන්ම ඒක තමයි ගරු මුදල් ඇමති තුමා විසින් මේ රටේ ගොවි ජනතාවට කරන ලද ලොකුම ව්‍යාජ ක්‍රියාව. එක් අතකින් රුපියල් දෙකක් දී අනෙක් අතින් රුපියලක වටිනාකම සියේට විස්සි කින් අඩු කළා. එයින් වූ ප්‍රතිඵලය කුමක්ද? හැම රුපියලකින්ම ශත විස්ස බැගින් අඩු වුණා. එතකොට රුපියල් 14න් රුපියල් 2.80ක් අඩු වුණා. කලින් වී බුසලකට ගෙව්වේ රුපියල් දොළහයි. දැන් ගෙවන්නේ රුපියල් දහහතරයි. එහෙත් රුපියලේ මිල නැත්නම් අගය සියේට විස්සකින් අඩු වීම නිසා රුපියල් දහහතරේ වටිනාකම රුපියල් එකොළහකුත් ශත විස්සකට සමානයි. ගොවියාගෙන් එක්තරා මුදලක් අරන් ඊට අඩු මුදලක් ගොවියාට ගෙවනවා. තමුන්නාන්සේලාගේ සහතික මිල ක්‍රමය අනුව ගොවියාට ඇත්ත වශයෙන්ම ලැබෙන්නේ රුපියල් දහහතරක් නොව රුපියල් එකොළහකුත් ශත විස්සක් පමණයි. තමුන්නාන්සේලා ගොවියාගෙන් රුපියල් දෙකකුත් ශත අසූවක් කොල්ලකාගෙන තිබෙනවා, හොරෙන් අරන් තිබෙනවා. ඉතින්, ඕකත් දීමනාවක්ද? එක සාක්කුවකට රුපියල් දෙකක් දමලා අනෙක් සාක්කුවෙන් දෙකයි අසූවක් ගන්නවා. ඒ නිසා තර්කයක් වශයෙන් මට මෙය ඉදිරිපත් කරන්නට පුළුවනි. අදත් අපට මෙය ඉදිරිපත් කරන්නට පුළුවනි. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ ආණ්ඩුව පැවති කාලයේදී සහතික මිල ක්‍රමය යටතේ වී බුසලකට යම් මුදලක් ගොවියාට ගෙවන්නට යෙදුණා නම්, ගොවියාට සමාජයේ උසස් තැනක් දෙනවාය කියන තමුන්නාන්සේලාගේ ආණ්ඩු යටතේ වී බුසලකට අද ගෙවන්නේ ඇත්ත වශයෙන්ම ඊට වඩා බෙහෙවින් අඩු මුදලක බව මම කියනවා. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ ආණ්ඩුව පැවති කාලයේදී, ගොවියා මේ ආණ්ඩුව යටතේ වී බුසලකට ගන්නා මුදලට වැඩි ප්‍රමාණයක් ගත් බව ඒ අනුව හොඳටම පැහැදිලියි. ඒ නිසා මේ කාරණය මේ ආණ්ඩුවට මහා හයියෙන් කයිවාරු ගහන්නටවත්, ආඩම්බර වන්නටවත් තරම් දෙයක් නොවෙයි. ඇත්ත වශයෙන්ම තමුන්නාන්සේලා ලජ්ජා විය යුතුයි, එක පත්තකින් වැඩි කළ දීමනාව අනෙක් පැත්තෙන් ආපසු ගැනීමේ වැඩ පිළිවෙළ ගැන.

පෝර සම්බන්ධයෙන් පවතින තත්ත්වයත් මම කොටින් කියන්නම්. අපේ ආණ්ඩුව තිබුණු කාලයේදී, 1964දී, "ඇමෝනියා සල්පේට්" නම් පෝර වර්ගය සඳහා හොණ්ඩරයකට ගොවියා ගෙව්වේ රුපියල් 8.65යි. සියේට තිස්තුනහමාරේ ආධාර ක්‍රමය යටතේ අපේ කාලයේදී ගෙව්වේ රුපියල් 10.95යි. 1967දී ගොවියා රජකරවීමට පොරොන්දු වූ තමුන්නාන්සේලාට ගොවියා ගෙවන්නේ හොණ්ඩරයකට රුපියල් 12.63 යි. සියේට තිස්තුනහමාරේ ආධාර ක්‍රමය යටතේ රුපියල් 16.84යි. කීයකින් වැඩිවෙලා තිබෙනවාදැයි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් රාජපක්ෂ මයා.]

කල්පනා කර බලන්න. "පොටෑෂ්" හොණ්ඩරයකට 1964 දී ගෙව්වේ රුපියල් 9.40යි. සියේට තිස්තුනහමාරේ ආධාර ක්‍රමය යටතේ රුපියල් 11.95යි. ගොවියා රජකරවීමට පොරොන්දු වූ තමුන්නාන්සේලා ඒ රසායනික පෝර වෙනුවෙන් රුපියල් 12.53 කුත් රු. 16.10 කුත් අය කරනවා දැන්. මේ අනුව බලන විට ටිකින් ටික වැඩි වී තිබෙන බව පෙනෙනවා නොවෙයිද? පොස්පේට්වලට 1964 දී සියේට 50 ආධාර ක්‍රමය යටතේ රුපියල් 6.75යි. සියේට 33 ආධාර ක්‍රමය යටතේ රුපියල් 8.40යි. තමුන්නාන්සේලා 1968දී ගොවියා රජකරවීමට දුන් පොරොන්දුව අනුව සියේට පණහේ ආධාර ක්‍රමය යටතේ 8.93ක් අය කරනව. සියේට තිස්තුනහමාරේ ආධාර ක්‍රමය යටතේ රුපියල් 12.84ක් අය කරනවා නොවෙයිද? දැන් ඒකත් වැඩි වෙලා නැද්ද?

කර්මාන්ත කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා අද "යූරියා" ගැනත් කථා කළා. යූරියා ගැන කියන්නට තිබෙන්නේ මොනවාද? 1964දී යූරියා රසායනික පෝරවලට අපේ ආණ්ඩුව හොණ්ඩරයක අය කෙළේ රුපියල් 14.60යි. සියේට තිස්තුනහමාරේ ආධාර ක්‍රමය යටතේ රුපියල් 18.85යි. 1968දී, හත් හවුල් ආණ්ඩුව යටතේ ගොවියා රජකරවීමට පොරොන්දු වූ කාලයේ, ඒකත් වැඩි කළා. සියේට පණහේ ආධාර ක්‍රමය යටතේ රුපියල් 20.13 ක් වෙලා තිබෙනවා. සියේට තිස්තුනහමාරේ ආධාර ක්‍රමය යටතේ රුපියල් 26.84 ක් වෙනවා. ගොවියා පාවිච්චි කරන රසායනික පෝරවලට මේ විධියට සීඝ්‍රයෙන් මිල වැඩිවෙලා තිබෙනවා නොවෙයිද? හත් හවුල් ආණ්ඩුව යටතේ ගොවියාට ලැබී තිබෙන සහනය ඕකද? ගොවියා රජකරවීමටත්, පැරකුම් යුගයක් උදා කරවීමටත්, වැඩ කරනවාය කියන මේ ආණ්ඩුව ගොවියාට අත දී තිබෙන්නේ ඔය ආකාරයටයි.

ගොවියාට වුවමනා කරන ට්‍රැක්ටර් සම්බන්ධයෙන් පවතින තත්ත්වය ගැනත් සලකා බැලීම සෑහෙයි. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ ආණ්ඩව තිබුණු කාලයේදී, 1964දී, ට්‍රැක්ටර් පාවිච්චි කර අක්කරයක බිම් ප්‍රමාණයක තුන් හීය ම—පුරන් කෙටීම, දෙහීය සහ පෝරුගෑම —කරවා ගැනීමට ගොවියා ගෙව්වේ රුපියල් තිහක් පමණයි, කුලිය වශයෙන්. තමුන්නාන්සේලා ගොවියා රජ කරවීමට වැඩ කරනවාය කියන මේ කාලයේ ඒ කුලියත් වැඩි වෙලා. දැන්, 1968දී එය රුපියල් හැටක් වී තිබෙනවා. දැන් ට්‍රැක්ටර්වලින් හාන්නටත් බැරි තත්ත්වයක් උදාවී තිබෙනවා. ඒ තරමට එකින් එක නැග තිබෙනවා. මා කියන දේවල් ඇත්ත බව තිස්සමහරාමයේ ගරු මන්ත්‍රීතුමා පිළිගන්නවා. එතුමා ඇත්ත කියන කෙනෙක්. එතුමාත් මෙය පිළිගනිද්දී ගොවියාට ආධාර කෙළේයයි මේ ආණ්ඩුව කියනවා නම් මෙය මොන තරම් ලොකු බොරුවක්ද? හොඳට අහගන්න.

ටී. බී. ඉලංගරත්න මයා. (කොලොන්නාව)
(திரு. ரீ. பி. இலங்கரத்ன—கொலொன்னுவ)
(Mr. T. B. Ilangaratne—Kolonnawa)
කොකාත් පිළිගන්නවා.

ජෝර්ජ් රාජපක්ෂ මයා.
(திரு. ஜோர்ஜ் ராஜபக்ஷ)
(Mr. George Rajapaksa)

ඊළඟට, ගොයම්වලට ගහන කෘමි නාශක බෙහෙත්වල මිල ගණන් බලමු. අපේ කාලයේ—1964—අවුන්ස 32 "එන්ඩ්‍රික්ස්" බෝතලයක මිල රුපියල් 9යි. එහෙත් ගොවියා රජ කරවීමට උත්සාහ දරන හත් හවුල් ආණ්ඩුව යටතේ 1968 දී එහි මිල රුපියල් 15 දක්වා රුපියල් 6 කින් වැඩි වී තිබෙනවා. 1964 අපේ කාලයේ, M.C.P. නමැති කුඩ මැටි නාශක බෙහෙත් අවුන්ස 32ක බෝතලයක මිළ රුපියල් 5යි. එහෙත් 1968 දී, මේ හත් හවුල් ආණ්ඩුව එහි මිළ රුපියල් 8 දක්වා වැඩි කර තිබෙනවා, ගොවියා රජ කරවන්න. ගොයම් මැස්සන්ට ගහන "B.H.C. ක්‍රිස්ල්ස්" නමැති කුඩ 1964 අපේ ආණ්ඩව කාලයේ රු. 1.90යි. එහෙත් මේ හත් හවුල් ආණ්ඩව යටතේ 1968 දී එහි මිළත් රුපියල් 2.22 දක්වා වැඩි කර තිබෙනවා, ගොවියා රජ කරවන්න.

ඊළඟට බිත්තර වී ගැන බලමු. එච් 4 නමුහුන් වර්ගය 1964 සිරිමා බණ්ඩාරනායක ආණ්ඩුව පැවති කාලයේදී ගොවීන්ට දුන්නේ, බුසලක් රුපියල් 12 ගණණේයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

1968 දී ගොවියා රජ කරවීමට වැඩ කරන මේ ආණ්ඩුව යටතේ එය රුපියල් 16 දක්වා වැඩි වී තිබෙනවා.

එපමණක් නොවෙයි. තමන්ගේ කුඹුරු හරකුන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා ගොවියන්ට කටුකම්බි වුවමනා කරනවා. 1964 දී අපේ කාලයේ කටු කම්බි හොණ්ඩරයක් රුපියල් 56 යි. ගොවියා රජ කර වීම සඳහා තමුන්නාන්සේලා 1968 දී කටු කම්බි හොණ්ඩරයක මිල රුපියල් 90 දක්වා වැඩිකර තිබෙනවා.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
කටුව ගැහුවා.

ජෝර්ජ් රාජපක්ෂ මයා.
(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)
(Mr. George Rajapaksa)
1964 දී, අපේ රජය විසින් ගොවියාට කිඹුලා උදැල්ලක් රුපියල් 8 බැගින් දුන්නා. එහෙත් 1968 දී, ගොවියා රජ කරවීම සඳහා මේ රජය විසින් කිඹුලා උදැල්ලක මිල රුපියල් 14 දක්වා වැඩි කළා. 1964 දී, අපේ ආණ්ඩු කාලයේදී ගොවියාට අමුඩ ලේන්සුවක් සත 30 ගණනේ ලබා ගන්නට පුළුවන් කම තිබුණා. එහෙත් 1968 දී, ගොවියා රජ කරවීම සඳහා මේ රජය අමුඩ ලේන්සුවේ මිලත් රුපියල දක්වා වැඩි කළා.

ගොවියාට රෑ තමන්ගේ පැලට යෑමට එළියක් වුවමනා කරනවා. අපේ මුතුන් මිත්තන් නම් පැලට ගියේ හුළු අත්තක් පත්තු කරගෙනයි. එහෙත් මේ කාලයේ අපේ ගොවි මහතුන් පුරුදු වී සිටිනවා, රෑ තම පැලට යන විට ආරක්ෂාව සඳහා වි ලි පන්දමක් හෙවත් ටෝච් එකක් ගෙන යන්නට. 1964 සිරිමා බණ්ඩාරනායක කාලයේ ටෝච් බැටරියක මිල සත 30 යි. ගොවියා රජ කරවීමට කටයුතු කරන තමුන්නාන්සේලා විසින් එහි මිලත් රුපියල දක්වා වැඩි කළා. තමුන්නාන්සේලා ටෝච් බැටරිවල පාලන මිල ඉවත් කළා.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)
1956 මිල ගණන් සමඟ සසඳා බලන්න.

ජයකොඩි මයා.
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)
එහෙම නම් 1947 මිල ගණනුත් බලන්න ඕනෑ.

ජෝර්ජ් රාජපක්ෂ මයා.
(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)
(Mr. George Rajapaksa)
අනෙකුත් සියලුම පුරවැසියන්ට වාගේම, මේ රටේ ගොවියාටත් කම්කරුවාටත් සිය එදිනෙදා ජීවිතය ගෙන යාම සඳහා අවශ්‍ය බඩු බාහිරාදිය තිබෙනවා. ඒවායේ මිල එකින් එක වැඩි වී තිබෙනවා. මේ අවුරුදු 3 1/2 ක තමුන්නාන්සේලාගේ ආණ්ඩු කාලය තුළ ඒ එකම භාණ්ඩයකවත් මිල අඩු වුණාද? මිනිසාගේ එදිනෙදා ජීවිතය ගෙන යාම සඳහා වුවමනා කරන ඒ එකම භාණ්ඩයකවත් මිල අඩු වුණ යයි පුළුවන් නම් කියන ලෙස මා අභියෝග කරනවා.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)
1956 න් පස්සෙ කොහොමද?

ජෝර්ජ් රාජපක්ෂ මයා.
(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)
(Mr. George Rajapaksa)
1956 ගැන නොව වර්තමානය හෙවත් තමුන්නාන්සේලාගේ කෙරුවාවල් ගැනයි, අප කථා කරන්නේ. පරණ පුස් කෑ කොස් ඇට එළියට අදින්න ඕනෑ නම්, 1953 දී තමුන්නාන්සේලා කළ ඒවාත් කියන්නම්. ඉර හඳ පවතින තුරු හාල් මිල වැඩි කරන්නේ නැතැයි පොරොන්දු දෙමින් බලයට පත් ව තමුන්නාන්සේලා 1953 දී හාල් මිල වැඩි කිරීම හේතුකොටගෙන, මේ රටේ වීරෝදාර ජනතාව තම සාධාරණ කෝපය පළ කිරීමට හර්තාලයක් ඇති කළ අවස්ථාවේදී. යුද්ධ හමුදාව යොදා අහිංසක මිනිසුන් 9 දෙනෙක් බල්ලන් මෙන් මහ පාරේ වෙඩි තබා මැරූ හැටි මේ හත් හැවිලි ආණ්ඩුවට අමතකද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)
1958 දී මැරූ අය ?

ජෝර්ජ් රාජපක්ෂ මයා.
(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)
(Mr. George Rajapaksa)
මැරූ අය ගැන කථා කළොත් තමුන්නාන්සේලාගේ පයියෙත් හුණු තිබෙනවා. [බාධාකිරීම්] ඇයි, හිනා වෙන්නේ ? ඒක හොඳ සිංහල වචනයක්. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ ආණ්ඩුව කාලයේ දී සිමෙන්ති හොණ්ඩරයක මිල රුපියල් 9 යි. එහෙත් තමුන්නාන්සේලාගේ කාලයේදී සිමෙන්ති හොණ්ඩරයක මිල රුපියල් 12.50 යි ; බ්ලැක් මාර්කට් මිල රුපියල් 19 යි. මේ රජය බලයට පත්වුණාට පසුව ගරු මුදල් ඇමතිතුමා සහ එතුමාගේ කැබිනට් මණ්ඩලය ඒකමතිකව තීරණය කර ගොවියාත්, කම්කරුවාත්, මධ්‍යම පන්තියත් වශයෙන් හැම දෙනාම පාවිච්චි කරන සීනි රාත්තලක මිල සත 5 කින් වැඩි කළා ; භූමිතෙල් ගැලොමක මිල සත 5 කින් වැඩි කළා ; කිරි බෝතලය සත 13 කින් වැඩි කළා. එමෙන්ම සියලුම රෙදිපිළි වර්ගවල මිල වැඩි කර තිබෙනවා. ඊයේ පෙරේදා ලංකා "හෙළ" සැල—ජේ. එල්. එම්. ප්‍රනාන්දු මහතාගේ හෙළ සැල—මගින් පොඩි ළමයින්ගේ කලිසම්වලට අවශ්‍ය කරන කාඩ් ඩ්‍රිල් හා බ්ලූ ඩ්‍රිල් වල මිළ වැඩි කළා. එහෙනම් තමුන්නාන්සේලාගේ තීරණවලින් ජනතාවට අවශ්‍ය පාරිභෝගික භාණ්ඩවල මිල වැඩි කර තිබෙනවා. මෙසේ තිබියදී දුප්පත් ජනතාවගේ ජීවන වියදම අඩු කිරීමට වැඩ කළාය කියා තමුන්නාන්සේලා කට ඇරල කියන්නේ කොහොමද ?

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ ආණ්ඩුව කාලයේදී අපි ගොවීන්ට ණය දුන්නේ සියයට 6ක පොළියටයි. ගොවියා රජකරවන්නට කැමරාව බඩ මැද බැඳගෙන ගොවි සංචාරවල යෙදෙන මේ අගමැතිතුමාගේ ආණ්ඩුව ගොවීන්ට ණය දීමේ ක්‍රමය වෙනස් කොට මහජන බැංකුවෙන් මුදල් අරගෙන විවිධ සේවා සමුපකාර සමිති මාර්ගයෙන් අලුත් ක්‍රමයක් අනුව ගොවීන්ගෙන් සියයට 12 ක පොලියක් අය කරනවා.

ගරු මන්ත්‍රීවරු
(கௌரவ அங்கத்தவர்கள்)
(An hon. Member)
ඒකත් හරිද ?

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)
වැරදියි.

ජෝර්ජ් රාජපක්ෂ මයා.
(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)
(Mr. George Rajapaksa)
සමහරකුගෙන් සියයට 12 යි ; සමහරකුගෙන් සියයට 9 යි. ඒක හරිද ? හොඳයි තමුන්නාන්සේලා අය කරන්නේ සියයට 9ක පොලියක් යයි කියමු. හොඳයි අපි එයින් සතුටු වන්නම්. අපි අය කළේ සියයට 6ක පොලියක්. එහෙත් තමුන්නාන්සේලා කියන අන්දමට තමුන්නාන්සේලා සියයට 9 ක පොලියක් අය කරනවා. හැබැයි අපි කියනවා තමුන්නාන්සේලා සියයට 12 ක පොලියක් අය කරනවාය කියා.

ගරු මන්ත්‍රීවරු
(கௌரவ அங்கத்தவர்கள்)
(Hon Members)
ඒක හරිද ?

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)
සියයට 9 යි කියනවා, සියයට 12 යි කියනවා, කෝක හරිද කොහොමද දන්නේ ?

ජෝර්ජ් රාජපක්ෂ මයා.
(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)
(Mr. George Rajapaksa)
හොඳයි අපි අය කළේ සියයට 6 ක පොලියක්. තමුන්නාන්සේලා ඊට වැඩි පොලියක් අය කරනවාය කියන එක පිළිගන්නට ඕනෑ. ඊටත් වඩා කැත, නින්දිත, නීච, නීතික ක්‍රියාව තමයි ගොවීන්ගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හාල් පොත් උගසට ගැනීම. ගොවියාගේ පමණක් නොවෙයි, ඔහුගේ බිරියගේ හා දරුවන්ගේ හාල් පොත් පවා උගසට ගන්නවා. තමන්ගේ පියාට යම්කිසි කරදරයක් නිසා ණය ගෙවන්නට බැරි වුණොත් අහිංසක දරුවන් බඩගින්නේ ඉන්නද? අසරණ දරුවන්ගේ හාල් පොත් උගසට ගන්නේ ඇයි? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේත් නීතිඥයෙක් නිසා නීතිඥයෙක් වශයෙන් මේ සම්බන්ධව ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්නට මා කැමතියි. මේ ආණ්ඩුව සකස් කර ඇති මේ ණය දීමේ ක්‍රමය සම්පූර්ණයෙන්ම නීති විරෝධියි කියා මා කියනවා. මේ රටේ තිබෙන ජන සම්මත නීතිය යටතේ ගොවීන්ගේ හාල් පොත් උගසට ගන්නට කිසිවකුට බලයක් නැහැ. ඇයි වෙන කෙනකුගේ හාල් පොතක් තවත් කෙනකු ළඟ තබා ගැනීම හිරේ යැවිය හැකි වරදක් බව තමුන්නාන්සේලා දන්නවා. එය නීති විරෝධි ක්‍රියාවක්. එමෙන්ම තමන්ගේ හාල් පොත විකිණීම හා උගසට තැබීමත් හිරේ යැවිය හැකි වරදක්. එහෙත් මේ ආණ්ඩුව ලක්ෂ සංඛ්‍යාත ගොවි ජනතාවක් ලවා ඒ නීති විරෝධි ක්‍රියාව කරවනවා. ගොවීන් ලවා එවැනි උගසකට බලහත්කාරයෙන් අත්සන් ලබාගෙන තිබෙනවා. මේ රටේ තිබෙන උගස් නීතිය යටතේ කෙනකුට මුදලක් අවශ්‍ය වූ විට තමන් සතු බඩුවක් මුට්ටුවක් උගසට තබා යම්කිසි පොලියකට මුදලක් ගන්නට පුළුවන්. ඔහු එය ණය මුදල හා පොළිය නොගෙව්වොත් එසේ උගසට තැබූ භාණ්ඩය විකුණා තමන්ගේ මුදල අයකර ගැනීමට ඒ උගස හිමියාට පුළුවන්. නමුත් මේ ආණ්ඩුව කරන්නෙ මොකක්ද? තමුන්නාන්සේලා කරන්නේ ඉතාමත් නින්දිත වැඩක්. ගොවියාට කියා ඔහුගේ භාර්යාවගේත්, දරුවන්ගේත් හාල් පොත් උගස් තබවනවා. ඒක සම්පූර්ණයෙන්ම නීති විරෝධියි. මට පුළුවන්, මට අයිති දෙයක් උගස්තියන්නට. එහෙත් මගේ භාර්යාවගේ හෝ දරුවන්ගේ හාල් පොත් උගස් තියන්නට මට අයිතියක් නැහැ. තමුන්නාන්සේලා මේ ණය ඔප්පුවලට ගොවියාගේ අත්සන ලබාගෙන ඔහුගේ භාර්යාවගේ සහ දරුවන්ගේ හාල් පොත් උගසට ගැනීම මේ රටේ ජන සම්මත නීතියට විරුද්ධ ක්‍රියාවක් බව මා කියා සිටිනවා. මේ සම්බන්ධයෙන් අපේ පළමු වැනි චෝදනාව එයයි. තමුන්නාන්සේලා එය පිළිගන්නවා ඇති.

එසේ නම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇති වන තත්ත්වය කුමක්ද? මෙවැනි ඔප්පුවල හැටියට දැන් අපේ පළාත්වල ණය නොගෙවූ ගොවීන්ගේ පවුල්වල හාල් පොත් රාජසන්තක කිරීමේ ව්‍යාපාරය ආරම්භ කර තිබෙන බව තිස්සමහාරාමයේ ගරු මන්ත්‍රීතුමා (ඩී. ඒප්. ඩබ්ලිව්. එදිරිසූරිය මයා.) දන්නවා ඇති. ණය නොගෙවූ ගොවීන්ට 24 වැනි වාරයේ හාල් පොත් නිකුත් කරන්නට එපාය කියා කච්චේරිවලට නිවේදන යවා තිබෙනවා. ගොවියාගේ පමණක් නොව ගොවියාගේ භාර්යාවගේත්, දරුවන්ගේත් හාල් පොත් නිකුත් නොකර සිටීමට මේ ආණ්ඩුවට නීත්‍යානුකූලව කිසිම බලයක් නැහැ. තමුන්නාන්සේලා මේ තක්කඩි ක්‍රියාව කරනවා නම් අප ඒ සම්බන්ධයෙන් අධිකරණයේ පිහිට සොයාගෙන යනවා. ඒ සම්බන්ධයෙන් අපි ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරිපිටට යනවා. ගොවියාගේ හාල් පොත් ගන්නට මේ ආණ්ඩුවට බලයක් නැති බව හිතේ තබා ගන්න. තමුන්නාන්සේලාගේ ණය ඔප්පුවේ සඳහන් කර තිබෙන්නේ කුමක්ද? ගොවියාගේ නම හැටියට මගේ නම යොදා මේ ණය ඔප්පුව මම කියවන්නම්. එතකොට එය තමුන්නාන්සේලාට තේරෙයි.

"ණය කරුගේ ප්‍රකාශය"

ණය කරු කියන්නේ ණය ගන්නා ගොවියායි.

"මෙහි පහත අත්සන් කරන බුද්දියාගම පදිංචි සාමාජික අංක 131 දරණ ජෝර්ජ් රාජපක්ෂ වන මම 1124 වන සමූපකාර ආඥා පනත යටතේ නිසි ලෙස ලියාපදිංචි කරන ලද සීමාසහිත වීරකැටියේ විවිධ සේවා සමූකාර සමිතියෙන්, එම සමිතියේ අතුරු ව්‍යවස්ථා අනුව සමූපකාර සමිති ආඥා පනතටද, ඒ ආඥාපනත යටතේ පනවා ඇති නියෝගවලටද යටත්ව අවුරුද්දට සියයට දොළහේ / නවයේ පොළියට 1968 ක් වූ මැයි මස 21 වැනි දින වන අද දින දෙන්නට යෙදුනාවූ 3 වැනි පිටේ ඇති උප ලේඛනයේ සඳහන් පරිදි කොටස් වශයෙන්, මුදලින් සහ ද්‍රව්‍යවලින් මා ලබා ගත්තාවූ රුපියල් 220.02 ණය මුදල......"

ඇමතිවරුන් පැනලා දුවනවා. [බාධා කිරීමක්] තමුන්නාන්සේ තමයි, අවුරුදු 10 ක් තිස්සේ මේ රටේ ගොවිතැන් කාලා තියෙන්නේ. අවුරුදු 10ක් තිස්සේ මේ රටේ ගොවීන්ට වුවමනා වතුර දුන්නේ නැහැ; ඉඩම් දුන්නෙ නැහැ; පොහොරත් දුන්නෙ නැහැ. පිලිප් ගුණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් රාජපක්ෂ මයා.]

වර්ධන ඇමතිතුමා සමග එකට තුරුල් වී සිටීම ගැන අද තමුන්නාන්සේලා ලජ්ජා විය යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතිරි කොටස මම කියවන්නම්. මේක ඉතා මත්ම වැදගත්.

"මෙම ණය මුදල ඉහත කී පරිදි ආපසු ගෙවීම මගෙන් පැහැර හැරෙන විටකදී......"

ඒ කියන්නේ ණය ගෙවා ගැනීමට බැරි වූ අවස්ථාවකදී.

"......171 වැනි අධිකාරය වන ආහාර පාලන පනතේ 6 වැනි වගන්තිය යටතේ පනවා ඇති 1967 සැප්තැම්බර් 2 වැනි දින දරණ රෙගුලාසියෙන් පැහැදිලි කර ඇති පරිදි මගේ පවුලේ සාමාජිකයන්ට සහ මට අයත් පහත දැක්වෙන සහල් සලාක පොත් ඉල්ලූ විටෙක එම සමුපකාර සමිතියට භාර දීමට මම තව දුරටත් පොරොන්දු වෙමි. ඒ සහල් සලාක පොත්වල විස්තර කවරේද යත්......"

ගොවියා ණය ඔප්පුව අත්සන් කරන විට ඔහුට උගසට තබන්නට සූදානම් වන්නේ තමන්ට සහ තමන්ගේ පවුලට අයත් හාල් පොත්. ඒ හාල් පොත්වල විස්තර මේ ලේඛනයේ ලියන්නට ඕනෑ. පළමු වැනි කොටසේ සහල් සලාක පොතේ විස්තර ලියන්නට ඕනෑ. උගස් තබන්නේ කී වැනි වාරයේ හාල් පොතද, කී වැනි වර්ගයේ හාල් පොතද, උගස් තබන පොතේ අංකය කුමක්ද යනාදි විස්තර සඳහන් කරන්නට ඕනෑ. ඊළඟට තමන් අයිති සමුපකාර සමිතියේ නම හා සහල් සලාක පොත් අයිතිකරුවන්ගේ නම් සහ වයස් ලියන්නට ඕනෑ. එතකොට මේ ආකාරයට මේක පිරෙව්වාම මොකද වෙන්නෙ? ගොවියා මේක අත්සන් කරනවා. මේ ණය ඔප්පුවෙන් ගොවියා පොරොන්දු වන්නේ කුමක්ද? තමන් විස්තර කරන වාරයේ අංකය තිබෙන සලාක පොත් ණය වෙනුවට රජයට දීමටයි. ඒ අනුව අපේ රටේ ගොවීන් ගිය කන්නයට ණය ගත් අවස්ථාවේදී උගසට තබා තිබෙන්නේ, රජයට පවරනවාය කියා පොරොන්දු වී තිබෙන්නේ 23 වන වාරයේ සලාක පොතයි. 23 වන වාරයේ සලාක පොත මේ මාසයේ 26 වනදා අවසාන වෙනවා. 26 වනදා සිට අළුත් වාරයේ, එනම් 24 වන වාරයේ සලාක පොත පාවිච්චි කරන්නට ඕනෑ. නමුත් දැන් මේ ආණ්ඩුව කරන්නේ කිසිම නීතියකට එකඟ නොවූ වැඩක්; ඉතාම නරක නීත්‍යානුකූල නොවන වැඩක්. ගොවියා උගසට තබා තිබෙන්නේ 23 වන වාරයේ සලාක පොතයි. නමුත් ණය නොගෙවූ ගොවීන්ගෙන් තමුන්නාන්සේලා ගන්නට උත්සාහ කරන්නේ 24 වන වාරයේ සලාක පොතයි. මේක මංකොල්ලයක්. මේක අසාධාරණයක්. මේක අයුක්තියක්. එම නිසා ගොවි ජනතාවගේ නාමයෙන් අප ඉල්ලීමක් කරනවා. මේ ලංකාවේ එකම එක ගොවියකුගෙන්වත් 24 වන වාරයේ සලාක පොත් ගන්නට එපා. ගොවීන්ගේ 24 වන වාරයේ සලාක පොත් ලබා ගැනීමට තමුන්නාන්සේලාට නීත්‍යනුකූල අයිතිවාසිකමක් නැහැ.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

ඒව ගන්නෙ නැහැ නොවැ ණය ගෙවනවා නම්.

ජෝර්ජ් රාජපක්ෂ මයා.
(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)
(Mr. George Rajapaksa)

මේ ණය ඔප්පුවේ හැටියට ගොවියා තමුන්නාන්සේලාට ඇපයට දී තිබෙන්නේ 23 වන වාරයේ සහල් සලාක පොත පමණයි. නමුත් තමුන්නාන්සේලා ආදායම් පාලක නිලධාරීන්ටත් සමුපකාර සමිතිවලටත් කර තිබෙන නියෝගය කුමක්ද? ගොවි ණය බේරන තුරු 24 වන වාරයේ සලාක පොත් නිකුත් කරන්නට එපාය කියා නියෝග කර තිබෙනවා. නමුත් මේ පොරොන්දු පත්‍රය උඩ ගොවියා එවැනි පොරොන්දුවක් වී නැහැ. ඇයි තමුන්නාන්සේලා මේ විධියට ගොවියා පූරා කන්නෙ? තමුන්නාන්සේලාට බලයක් නැහැ මෙවැනි ක්‍රියාවක් කරන්නට. එම නිසා ගොවි ජනතාවගේ නාමයෙන් මේ නින්දිත ක්‍රියාව වහාම නවත්වන මෙන් අප තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා. ගොවියාගේ හා ඔහුගේ පවුලේ 24 වන වාරයේ එක් සලාක පොතක්වත් ඇල්ලීමට කටයුතු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නොකරන මෙන් විරුද්ධ පක්ෂය මේ ආණ්ඩුවෙන් ඒකමතිකව ඉල්ලීමක් කරනවා.

මෙවැනි නීතිවිරෝධී වැඩ කරමින් තමුන්නාන්සේලා ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. එම නිසා අවසාන වශයෙන් මේ ව්‍යාජ පැරකුම්බා යුගයක් උදා කරවන්නට බලාපොරොත්තු වන හත් හවුල් ආණ්ඩුව, දූෂිත පාලනයෙන් ගඳ ගසන මේ ආණ්ඩුව, මේ රටෙන් පිටුවහල් කරන මෙන් ගොවි ජනතාවගෙන් මා ඉල්ලා සිටිනවා. මට සවන් දුන් තමුන්නාන්සේලාට ස්තුති කරමින් මගේ කථාව මෙයින් අවසාන කරනවා.

වී. අන්ණාමලෙයි (පත්කරන ලද මන්ත්‍රී)

(திரு. வி. அண்ணாமலை—நியமன அங்கத்தவர்)

(Mr. V. Annamalay—Appointed Member)

உபசபாநாயகர் அவர்களே, எனக்கு முன்பு கௌரவ முல்கிரிகல அங்கத்தவர் (திரு. ஜோர்ஜ் ராஜபக்ஷ) அவர்கள் மிகவும் ஆவேசத்துடனும் ஆத்திரத்துடனும் பேசினார். அவரது பேச்சைக் கவனித்தபோது எனக்குத் தெரியவந்த உண்மை ஒன்று என்னவென்றால் இந்த நாட்டில் இன்றைக்கு நெல் உற்பத்தி பெருகி இருக்கிறது என்பதுதான். இந்த உண்மைதான் அவரது மனதை வேதனையோடு பேச வைத்தது. அவரது பேச்சில் இருந்து இதைத்தான் என்னால் புரிய முடிந்தது. அவர் எவ்வளவுதான் கத்தை கத்தையாகக் கடதாசிகளை வைத்துக் கொண்டு இந்தச் சபையையும் நாட்டு மக்களையும் ஏமாற்ற நினைத்தாலும்கூட ஒரு உண்மையை மட்டும் மறைக்க அவரால் முடியாது.

விவசாய மக்களிடையே இன்று எளிதாகத் தெரிவது என்ன? இன்று இந்த நாட்டில் நெல் உற்பத்தி பெருகி இருக்கிறது. விவசாயிகள் முன்பிருந்ததைவிட அதிக நேரத்தைத் தங்கள் வயல்களில் செலவிடுகிறார்கள். விவசாயிகளிடையே இன்று நெல் உற்பத்தி விடயமாக அதிக அக்கறை காணப்படுகின்றது. இன்று நல்ல ஆராய்ச்சி முறைகளைக் கையாண்டு தங்கள் வயல்களைப் பக்குவப்படுத்தி உற்பத்தியைப் பெருக்க விவசாயிகள் முயன்று கொண்டிருக்கிறார்கள். அந்தக் காலங்களில் எல்லாம் வயல்களுக்கு இரசாயன உரம் போடுவதைப்பற்றி நாம் கேள்விப்பட்டதும் கிடையாது, பார்த்ததும் கிடையாது. இன்று நவீன இரசாயன உர வகைகளைப் பாவிப்பதில் விவசாயிகள் அதிக அக்கறை காட்டுகிறார்கள். விவசாயிகள் இன்று ரசாயன உரத்தையும் இயற்கையான உரத்தையும் வண்டில் வண்டிலாக வயல்களுக்குப் போட்டு உற்பத்தியைப் பெருக்கிக் கொண்டு வருகிறார்கள். அதுமட்டுமல்ல, மண்ணுக்கு ஏற்றவாறு நல்ல வித்துக்களையும் எடுத்துப் பயிர் செய்து வருவதால் நல்ல அறுவடை கிடைக்கக் கூடியதாக இருக்கின்றது. இதனால் விவசாயிகளுக்கும் உற்சாகம். இதே நேரத்தில் தேசிய அரசாங்கம் விவசாயிகளுக்கு உற்சாகமூட்டக் கூடிய முறையிலே நெல்லின் விலையைப் புசல் ஒன்றுக்கு பன்னிரண்டு ரூபாயிலிருந்து பதினான்கு ரூபாயாக உயர்த்தி இருக்கிறது. விவசாயிகள் தங்கள் நெல்லை இதற்கு அதிகமான விலையில்கூட தனியார்களுக்கு விற்கக்கூடிய நிலையும் இன்று ஏற்பட்டிருக்கின்றது. சில காலங்களில் பதினாறு ரூபாவிலிருந்து பதினெட்டு ரூபாவரைகூட ஒரு புசல் நெல் விற்கப்படுகின்றது. இந்தக் காரணத்தினால்தான் கோடையில் தரிசாகக் கிடக்கும் நிலங்களில் கூடச் செழிப்பான பயிர்களைப் பார்க்க முடிகின்றது. வயல்களைப் பார்க்கப் பெரிய கண் காட்சியாக இருக்கின்றது. இந்த முன்னேற்றமெல்லாம் எதிர்க் கட்சி நண்பர்கள் ஆவேசமாகப் பேசுவதால் மட்டும் நின்றுவிடப் போவதில்லை.

நமது பொருளாதாரம், உழைப்பு அன்னிய நாட்டிற்குப் போகக்கூடாது என்று இன்று நாட்டு மக்கள் உணர்ந்து விட்டார்கள். நமது நாடு செழிப்புற வேண்டுமென்றால் நமது நாட்டுப் பொருள்வளம் நமது நாட்டு ஏழை மக்களிடையே பங்கிடு செய்யப்படவேண்டும் என்பதையும் மக்கள் இன்று அறிந்துள்ளார்கள். இதை உணர்ந்த இன்றைய படித்த வாலிபர்களும் பெண்களும் அச்சமில்லாமல் வயல்களில் இறங்கித் தமது பெற்றோர்களுக்கு உறுதுணையாக நிற்கிறார்கள். அவர்கள் நாட்டினுடைய நலமே தமது நலம் என்றுணர்ந்து இன்று வேலை செய்கிறார்கள். இதனால் நாட்டிற்கே பெரும் கீர்த்தி என்றுதான் சொல்ல வேண்டும். கௌரவ முல்கிரிகலைப் பிரதிநிதி பேசுகின்ற பொழுது பொருட்களின் விலைகள் மிகவும் அதிகரித்துவிட்டன என்று கூறினார். ஆம், அதில் உண்மை இருக்கலாம்; இரசாயன

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වී. ආණමලෙයි මයා.]

உரத்தின் விலைகள் அதிகமாகி இருக்கலாம். பயிர்களுக்கு பாவிக்கக்கூடிய மருந்துகளின் விலைகள் அதிகமாக இருக்கலாம். 1963 ஆம் ஆண்டிலேயிருந்த விலை 1968 ஆம் ஆண்டிலே கூடுதலாகப் போயிருக்கிறது. இதற்கு இந்த நாடோ அல்லது இந்த நாட்டு அரசாங்கமோ காரணமாக இருக்க முடியாது. வெளிநாட்டிலேயிருந்து பொருட்களை இறக்குமதி செய்கின்ற பத்தாம் பசலித்தனமான கொள்கையை நாம் விடாமல் கடைப்பிடித்துக்கொண்டிருக்கும்வரை இதே நிலைதான் இருக்குமென்று நான் எனது எதிர்க்கட்சி நண்பர்களுக்குக் கூறிக்கொள்ள விரும்புகிறேன். எமது நாடு வளரவேண்டும், எமது நாடு செழிப்பாக இருக்கவேண்டும், நாம் மற்ற எந்த ஒரு நாட்டுக்கும் இரண்டாம்தர நாடாக இருக்கக் கூடாது. உண்மையிலே நாம் எண்ணுவது போல அவர்களும் எண்ணுவார்களானால், நிச்சயமாக இன்று இருக்கின்ற நிலையிலிருந்து நல்ல நிலைக்கு நம் நாட்டு ஏழை மக்கள் வரக் கூடிய நாள் வெகு தொலையிலில்லையென்பதை நான் உங்கள் மத்தியிலே சொல்லிவைக்க ஆசைப்படுகின்றேன்.

இன்று நாம் நமது தேவைக்கு இறக்குமதி செய்யக்கூடிய பொருட்களின் விலைகள் எல்லாம் அக விலையாகத்தான் இருக்கிறது. நம்முடைய ஏற்றுமதிப் பொருட்களைக் குறைந்த விலைகொடுத்தே பிறநாட்டவர்கள் வாங்குகின்ருர்கள். அதுவும் நமக்கு நன்கு தெரிந்ததே. ஆனுல், தேசிய அரசாங்கம் இவற்றைப் பார்த்துவிட்டுச் சும்மா இருந்துவிடவில்லை. இதற்காக என்ன என்ன செய்யவேண்டுமோ அவற்றையெல்லாம் செய்துகொண்டுதான் வருகின்றது. எங்களுடைய உற்பத்திப் பொருட்களுக்கு நல்ல விலை கிடைக்கக்கூடிய எல்லா விதமான முயற்சிகளையும் தேசிய அரசாங்கம் எடுத்துக்கொண்டுவருவதை நாம் கண்கூடாகப் பார்க்கின்ரேம். அதே நேரத்தில் இறக்குமதியை எவ்வளவு தூரத்திற்கு நாம் குறைக்கலாமென்பதைப்பற்றியும் அவர்கள் பிரயாசையானமுறையில் நடவடிக்கைகள் எடுத்துக் கொண்டுதான் வருகின்ருர்கள். உதாரணமாக, ஒரு கொத்து அரிசியின் விலையைக் குறைத்தபொழுது இந்நாட்டிலே பெரும் பீதியும் கூச்சலும் ஏற்பட்டது நமக்குத் தெரியும். நான்கூட அந்தவிதமாகத்தான் கருதினேன். ஆனுல் இன்று பார்க்கும்பொழுது அது ஒரு நல்ல காரியமாகத்தான் தெரிகிறது. இன்று நம்முடைய பொருளாதாரத்தாக்கம் பாதிக்குப் பாதி குறைக்கப்பட்டிருக்கிறதென்பதைப் பார்க்கும்போது அந்தப் பணம் பூராவும் எமது நாட்டிலேதான் தங்கியிருக்கிறது.

உதாரணமாக, அரிசி விலையை நாம் எடுத்துக்கொண்டால், வெளிநாடுகளிலே 2 அல்லது 3 வருடங்களுக்கு முன்பு இருந்த விலையையும் தற்போது இருக்கின்ற விலையையும் ஒப்பிட்டுப் பார்க்கையில் அன்றிருந்த விலையிலும் பார்க்க நூற்றுக்கு 25 அல்லது 30 சதவீதம் அதிகரித்துத்தான் இருக்கிறது. அதுபற்றிப் பத்திரிகைகளிலே வெளியாகியிருந்ததை எல்லோரும் அறிவார். அன்று 40 ஸ்ரேளிங் பவுண்களாக விருந்த அரிசியின் விலை இன்று 70 ஸ்ரேலிங் பவுண்களாக கூடியிருக்கும் நிலை ஏற்பட்டிருக்கிறது. அன்று பர்மா நமக்குத் தேவையான அரிசியைக் கொடுத்து உதவி செய்தது நமக்குத் தெரியும். இப்பொழுது அவர்கள்கூடப் பாதிக்குப் பாதி கொடுக்க முடியாத நிலையிலிருப்பதாக அறிவித்ததை நாம் அறிவோம். இப்படியான சூழ்நிலை ஏற்பட்டிருக்கின்ற நேரத்தில், நாம் எடுத்துக்கொண்ட முயற்சி நெல் உற்பத்தியை அதிகரிப்பதேயாகும். தேசிய அரசாங்கம் இன்று எடுத்துக்கொண்ட இந்த முயற்சி நாட்டு மக்கள் எல்லோரும் கட்சிப் பாகுபாடில்லாமல் பாராட்டப்படக் கூடிய ஒரு பெரும் முயற்சி என்றே சொல்ல வேண்டும். நாம் இன்னும் பர்மா, தாய்லாந்து, சீனு ஆகிய நாடுகளை அரிசிக்காக எதிர்பார்த்துக் கொண்டிருப்போமே யானுல், நிச்சயமாக இங்கு பசி, பட்டினிப் பட்டாளமே கிளம்பி எந்த அரசாங்கம் ஆட்சியிலிருந்தாலும் அந்த அரசாங்கத்தை உதைத்து எறியத் தயங்க மாட்டா என்பதை உங்களுக்கு ஞாபகப் படுத்த விரும்புகிறேன். ஆகவே தேசிய அரசாங்கம் எடுத்துக்கொண்ட உணவு உற்பத்தி முயற்சியைப்பற்றி எல்லாக் கட்சியைச் சேர்ந்தவர்களும் பெருமைப்பட வேண்டும். நாம் எமது ஏழை விவசாயிகளுக்குக் கூடுதலாக உதவி செய்யவேண்டும். அவ்வாறு உதவி செய்ய வேண்டுமென்று நான் சொல்லும் பொழுது இந்த இரசாயன உரத்தின் இறக்குமதித் தீர்வையை வாபஸ் பெற வேண்டுமென்று கௌரவ நிதி அமைச்சரவர்களை நான் கேட்டுக்கொள்ளுகின்றேன். இரசாயன உரத்தின் இறக்குமதித் தீர்வையை வாபஸ் பெற்றுக்கொண்டால், விவசாயிகளுக்கு இலகுவான முறையிலே உரம் கிடைக்கக்கூடிய வாய்ப்புக்கள் ஏற்படும்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

நெல் உற்பத்தியைப் பற்றி பொய்க்கணக்குக் காட்டப்பட்டிருப்பதாக எனக்கு முன்பு பேசிய கௌரவ அங்கத்தவர் பேசக் கேட்டேன். புள்ளிவிபரங்களையெல்லாம் அதிகாரிகள் பொய்யான முறையிலே தயாரித்திருக்கிறூர்கள் என்று அவர் கூறினூர். இவ்வாறுக அதிகாரிகளுக்குப் பூச்சாண்டி காட்டுவதில் பிரயோசனமில்லை. அவர்கள் எல்லோரும் அரசாங்க உத்தியோகத்தர்கள். மற்றவர்கள் சொல்வதற்காக அவர்கள் பொய்க்கணக்குத் தரப்போவதில்லை. இது இங்கே இருந்துகொண்டு சரிக்கட்டும் கணக்கு அல்ல. இதற்காக எத்தனையோ இலாகாக்கள் இருக்கின்றன. அங்கே பெரிய பெரிய ஆபீசர்களை வைத்து நிறையச் சம்பளம் கொடுத்து மாகாண ரீதியிலும் மாவட்ட ரீதியிலும் புள்ளி விவரங்களைத் தயாரித்து மத்திய அரசாங்கத்துக்கு அனுப்பி, அதன் பின்தான் இந்தக் கணக்குகள் எல்லாம் ஒழுங்குபடுத்தப்படுகின்றன. இவ்விதம் செய்யும்போது, அதைப் பொய் என்று சொன்னுல், இந்த நாட்டிலே இருக்கும் அரசாங்க உத்தியோகத்தர்கள் எல்லாரும் பொய் சொல்பவர்களா, அவர்களுக்குச் சம்பளம் கொடுப்பது பொய்க் கணக்கு எழுதுவதற்காகவா என்று நான் கௌரவ முல்கிரிகலைப் பாராளுமன்ற அங்கத்தவர் (திரு. ஜோஜ் ராஜபக்ஷ) அவர்களைப் பணிவாகக் கேட்க விரும்புகிறேன். அப்படிப் பயந்து நடக்கும் அரசாங்க உத்தியோகத்தர்கள் இந்த நாட்டிலே இல்லை என்பதைப் பெருமையாகக் கூறுகிறேன். அவர்களுக்கு ஆபத்து வந்தாலும்கூட, யாராவது அவர்கள் சொல்லும்படி கணக்கு எழுதச் சொன்னுலும்கூட அவர்கள் ஒரு நாளும் அப்படிச் செய்யமாட்டார்கள். இந்த அரசாங்கம் போய் மற்ற அரசாங்கம் வந்தால் தாங்கள் காரணம் சொல்ல வேண்டும் என்பது அவர்களுக்கு நன்ருகத் தெரியும்.

மாவை எடுத்துக் கொள்வோம். முன்பு நாம் உட்கொண்ட மாவையும் இப்பொழுது நாம் உட்கொள்ளும் மாவையும் பார்த்தால் அளவு குறைந்திருக்கின்றது. காரணம் என்னவென்ருல், இந்த நாட்டிலே அரிசி உற்பத்தி பெருகி இருக்கின்றது. மக்கள் அதிகம் அரிசி உணவை உட்கொள்வதால் மா உட்கொள்ளும் அளவு குறைந்திருக்கின்றது. அரசாங்கம் மா இறக்குமதியைக் குறைக்கவில்லை. ஆனுல், மா செலவழிப்பு மாதாமாதம் படிப்படியாகக் குறைந்துகொண்டே வருகின்றது. நான் இந்த விஷயத்தில் அவ்வளவு கூடுதலாகச் சொல்வதற்கில்லை. எனக்கு முன் பேசிய கௌரவ அங்கத்தவர் ஆவேசமாகப் பேசி இந்தச் சபையையும் மக்களையும் தூண்டிவிட நினைத்தார். ஆனுல், இந்தச் சபையையோ, நாட்டு மக்களையோ ஏமாற்ற முடியாது என்பதை அவருக்குச் சொல்லிவைக்க விரும்புகிறேன். விவசாயிகளுக்கு அவர்கள் எடுக்கும் முயற்சிக்காக எனது அன்பையும் நன்றியையும் தெரிவிக்க ஆசைப்படுகிறேன்.

நானும் கிராமங்களுக்கூடாகப் போய்வரும் ஒருவன்தான். பட்டணத்திலிருந்துகொண்டோ, படமாளிகையிலிருந்துகொண்டோ கஷ்டங்களைப் பற்றிப் பேசக்கூடியவன் அல்ல. இன்று விவசாயிகளுக்கு இருக்கக்கூடிய ஆர்வமும் அவர்கள் முயற்சியும் பெருகிக்கொண்டே வருகின்றன. அவர்கள் அக்கறையோடு பரிசு வாங்கக்கூடிய எண்ணத்துடனே அரை ஏக்கர், ஒரு ஏக்கர் பூமியிலிருந்து ஏன் 100, 150 புசல் நெல்லை உற்பத்தி செய்ய முடியாதென்று போட்டி மனப்பான்மையுடன் பாடுபட்டு வருகிறூர்கள்.

கொஞ்ச நேரத்துக்கு முன்னர் இன ஒற்றுமையைப் பற்றிப் பேசினூர்கள். கௌரவ கைத்தொழில், கடற்றெழில் அமைச்சர் அவர்களும் அவருக்குப் பதில் கூறிய கௌரவ முல்கிரிகலைப் அங்கத்தவரும் அதுபற்றிப் பேசினூர்கள். ஆம், இன்று இன ஒற்றுமையைப் பற்றிப் பேசுகிறோம். இன்று நேற்று மாத்திரமல்ல. பல வருடங்களாகப் பேசிவருகிறோம். ஆனுல், காரியபூர்வமாக நடந்ததொன்றும் இல்லை. ஏன்? நமக்குள் ஐக்கியம் இல்லை. முதலாவதாக, சிங்களச் சகோதரர்களுக்கிடையில் ஐக்கியம் இல்லை. அவர்களுக்குள் அரசாங்கக் கட்சி, எதிர்க்கட்சி என்று இரண்டு. தமிழர்களுக்கிடையிலும் ஐக்கியம் இல்லை. தமிழ்க் காங்கிரஸ் ஒன்று; 'பெடரல்' கட்சி ஒன்று. இலங்கைத் தொழிலாளர் காங்கிரஸ் என்று ஒன்று; அத்துடன் இன்னும் ஒரு காங்கிரஸ் என்று ஒன்று இப்படிப் பற்பல கட்சிகளாக இருந்து கொண்டு தங்கள் கொள்கையைப் பேசுவதாலே நாட்டிலே இருக்கக்கூடிய பிரச்சினைகள் எல்லாம் சீர்கெட்டு துவேஷம் வளர்ந்துகொண்டே வருகின்றது. உலகத்திலே பிரச்சினைகள் எழுகின்றன. அவற்றை வட்டமேசை மகாநாடுகளைக்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වී. අන්නාමලෛයි මයා.]

கூட்டி, பேசிப் பேசி முடிக்கக்கூடிய பழக்கத்துக்கு இன்று உலகம் வந்திருக்கின்றது. அப்படியில்லாமல், ஒருவரை மற்றவர் மேல் ஏவி விட்டு, ஒருவர் கையை இன்னொருவர் பிடித்துத் தோளில் ஏற்றி முன்னேறும் பழக்கம் இன்று இல்லை.

இன்று இந்த நாட்டிலே பெரும்பான்மைச் சமூகத்தின், சிங்கள சகோதரர்களின் அரசாங்கமே இருந்துகொண்டு வருகின்றது. ஆளும் கட்சி அவர்கள் தான். எதிர்க்கட்சியும் அவர்கள் தான். இதே மாதிரி எதிர்க்கட்சியினரும் அவர்கள்தான். சிறுபான்மையினராகிய நாங்கள் இந்தப் பக்கத்தில் சிலர், அந்தப் பக்கத்தில் சிலர் என்றுதான் இருக்கிறோம். இதுதான் உண்மை நிலை. இரண்டு பக்கத்திலும் யார் எப்படிப் பேசினாலும் சிறுபான்மையினரைப் பொறுத்த வரையில் கொஞ்சமும் நம்பிக்கையில்லை. அவர்கள் இருக்கக் கூடிய பிரச்சினைகளைச் சுமுகமாக முடிக்கப் போவதும் இல்லை. இதுதான் அவர்களுடைய திட்டம். சிந்தனை, எண்ணம் என்பதை இந்தக் கௌரவ சபையிலே சொல்ல ஆசைப்படுகிறேன்.

இப்பொழுது ஏற்பட்டிருக்கும் பிரச்சினைகள் மிகவும் இலேசானவை. எல்லாச் சமூகத்தினரும் சேர்ந்து பேசினால் நிச்சயமாக ஒரு முடிவு காணலாம். சிறுபான்மையினரும் சில விஷயங்களில் விட்டுக் கொடுக்கத்தான் வேண்டும். பெரும்பான்மையினரும் விட்டுக் கொடுக்கத்தான் வேண்டும். அதுதான் மனித தர்மம். பௌத்த தர்மம் என்று சொல்கிறோம்; பெருமைப்படுகிறோம். இந்த விதமான மிகப் புனிதமான நாட்டிலே—பௌத்தர்கள் நாட்டிலே—நாம் வாழ்கிறோம். ஆனால் நடப்பது என்ன? ஒருவர்க்கொருவர் துவேஷத்தை ஏவி விட்டு, ஒருவரையொருவர் கொன்று கொண்டு. ஒருவரையொருவர் வெட்டிக்கொண்டு, ஒருவருடைய பகுதிக்கு இன்னொருவர் போக முடியாமல், தெற்கே இருப்பவர்கள் வடக்கே போக முடியாமல், வடக்கே இருப்பவர்கள் தெற்கே போக முடியாமல், நல்லதுக்கும் போக முடியாமல், கெட்டதுக்கும் போக முடியாமல் இருக்கக் கூடிய ஒரு சூழ்நிலையை நீடித்திருக்க விட்டுக்கொண்டு வந்தால் ஒரு சமூகத்துக்கோ அல்லது ஒரு நாட்டுக்கோ ஒருபோதும் அது உகந்ததாக இருக்க முடியாது. இந்த விதமான பிரச்சினைகள் எப்பொழுதும் இருக்கவே செய்யும். இதனைப் படிப்படியாகப் பேசி, அன்போடு, சிநேகிதத்தோடு எண்ணங்களைப் பரிமாறி இன்றோ நாளையோ முடிக்காவிட்டாலும் இன்னும் சில வருடங்கள் சென்றாவது முடிக்கக் கூடிய ஒரு பாதையையாவது ஒழுங்காக அமைத்துக் கொண்டு போவதுதான் நல்ல முறை என்று நான் நினைக்கிறேன்.

என்னைப் பொறுத்த வரையில் சிறுபான்மைச் சகோதரர்களுக்கு ஒரு சில முக்கியமான குறைபாடுகள் இருந்து கொண்டே இருக்கின்றன. பெரும்பான்மை சகோதரர்கள் பெரு மனது வைத்து அவற்றை அகற்றிக் கொடுக்க வேண்டும். அதை அவர்கள்தான் செய்து கொடுக்க வேண்டும். சிறுபான்மையினரால் பெரும்பான்மையினரோடு சண்டை போட முடியுமா? அடித்து வாங்க முடியுமா? அதட்டிக் கேட்க முடியுமா? இது உலக சரித்திரம். இலங்கைக்கு மாத்திரம் வேறாக எதுவும் இருக்க முடியாது. இன்று உலகம் பூராவையும் எடுத்துப்பார்த்தால் எந்தச் சிறுபான்மைச் சமூகமும் பெரும்பான்மைச் சமூகத்தோடு நன்மையோடு, நேசத்தோடு, அன்போடு, ஆசையோடு நன்றாக நெருங்கிப் பழகித் தான் பிரச்சினைகளைத் தீர்க்க முடியுமே தவிர எதிர்த்து, சண்டையிட்டு வாங்கப் போவது ஒருநாளும் இலகுவாக இருக்கக் கூடிய விஷயம் அல்ல என்பதை அறிய முடியும் என்பதைத் தெரிவித்துக் கொள்கிறேன்.

ටී. බී. තෙන්නකෝන් මයා. (දඹුල්ල)
(திரு. ரீ. பி. தென்னகோன்—தம்புளை)
(Mr. T. B. Tennekoon—Dambulla)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සභාවේ ගණපූරණයක් නැති බව පෙන්වා දෙන්නට ඕනෑ.

මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණ පූර්ණයක් නොතිබියෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.

පසුව ගණපූර්ණයක් තුබුයෙන්—

சபை எண்ணப்பட்டு நிறைவெண் இல்லாததால் பிரிவு மணி அடிக்கப்பட வேண்டுமென ஆணையிடப்பட்டது.

பிறகு நிறைவெண் இருந்ததனால்—

House counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.

Later, a Quorum being present—

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අන්නාමලෙයි මයා.
(திரு. அண்ணமலை)
(Mr. Annamalay)

உப சபாநாயகரவர்களே, சிறுபான்மையினருடைய குறைபாடுகளைத் தீர்ப்பது பெரும்பான்மையினருடைய கடமை. ஆகவே, அவர்களுக்கிடையில் கட்சி பேதம் இருந்தாலும் கூட அதை ஒதுக்கி வைத்து விட்டு, சிறுபான்மைச் சமூகமாக இருக்கக் கூடியவர்களுக்கு நீதியும் நியாயமும் வழங்கக்கூடிய மிகப் பெரிய பொறுப்பு அவர்கள் கையில் இருப்பதால் அவர்கள் கூடுமானவரை இது விஷயத்தில் முயற்சியெடுத்து இந்தக் குறைபாடுகளை சிக்கிரமாகத் தீர்த்து வைக்கக் கூடிய நல்ல வழிவகைகளைக் கடைப்பிடிக்க வேண்டும். இந்த நாட்டின் பொருளாதார நிலையிலே இருக்கக் கூடிய குறையை மாற்றியமைத்து நாடு சுபிட்சமாக நல்ல முறையிலே நல்ல அந்தஸ்துடன் முன்னேறுவதற்காக, அந்நிய நாட்டிலே போய் கையேந்தி பிச்சை கேட்கிற கேவலமான நிலையை மாற்றித் தொலைப்பதற்காக அவர்கள் ஒன்று சேர வேண்டும். அவர்கள் பெரு மனது வைக்க வேண்டும். இந்த மாதிரிச் செய்தால் நம்மிடம் இருக்கக் கூடிய பூசல்கள் எல்லாம் ஒரு நொடிப் பொழுதில் மாறிவிடும்.

இப்பொழுது இஸ்ரேலிலிருந்து ஒரு தூது கோஷ்டியினராக நண்பர்கள் சிலர் வந்திருக்கிறார்கள். நான் அவர்களைச் சந்தித்துப் பேசிய பொழுது ஒருவர் சொன்னது எனக்கு அதிசயமாக இருந்தது. அவர்களுடைய நாடு ஒரு வனாந்திரம் என்பது எங்களுக்குத் தெரியும். அங்கே வருடத்துக்கு ஒரு அங்குல மழைதான் பெய்கிறதாம். அப்படியிருந்தும் அங்கே நல்ல பயிர்களை உண்டாக்கி விவசாயத்தைப் பெருக்கி அவர்கள் வெளிநாடுகளுக்கும் கூடத் தங்கள் பொருட்களை ஏற்றுமதி செய்கிறார்கள் என்று அறிய முடிகிறது.

நமது நாட்டில் கால்நடை வளர்ப்பைப் பற்றி அவர்கள் என்ன சொல்கிறார்கள். பொல்லநறுவையில் அதன் சுவாத்தியத்துக்கு ஏற்ப அங்கு சிந்தி இனப் பசுக்கள்தான் வளர்க்க முடியும். இதேமாதிரியாக போப்பத்தலாவையில் ஐஷயர் இனம்தான் வளர்க்க முடியுமென்று அவர்கள் சொல்லுகிறார்கள். அவர்களுடைய அபிப்பிராயத்தையும் இங்கு சொல்லப்படும் அபிப்பிராயத்தையும் பார்க்கும்பொழுது நாம் மிக ஏமாந்தவர்களாகத்தான் இருப்பதாகத் தெரிகிறது. எமது நாடு செழிப்பான நாடு. நமது நாட்டைப் பார்க்கும் உலகத்தவர்கள் எல்லோரும் நமது நாட்டு வளங்களைக் கண்டு வியக்கிறார்கள். இந்த மாதிரியான ஒரு சொர்க்க பூமியை வைத்துக் கொண்டு நாம் ஏன் உணவுக்கும் இதர பொருட்களுக்கும் பிறநாடுகளிடம் கை கட்டிக் கொண்டு நிற்கிறோம் என்று அவர்கள் கேட்கிறார்கள். அதற்கு நாம் பதில் சொல்ல முடியாமல் இருக்கிறது. எமது ஆற்று நீர் வளத்தைப் பார்க்கும் பிற நாட்டு மக்களுக்கு ஒரு பக்கம் ஆச்சரியமாகவும் ஒரு பக்கம் பொறாமையாகவும் இருக்கிறது. ஆண்டவன் அருளால் இலங்கை வனப்பு மிகுந்த நாடாகவும் நீர் வளம், நிலவளம் மிகுந்த நாடாகவும் எமது நாடு இருந்துகொண்டு ஏன் உணவுப் பொருட்களுக்கு பிறநாடுகளை எதிர்பார்க்க வேண்டும். இந்த நிலையைக் கண்டு பிற நாட்டவர்களுக்கு அதிர்ச்சியாக இருக்கிறது. கண்ணிருந்தும் குருடர் காதிருந்தும் செவிடர் என்ற பழமொழிதான் உண்மையிலேயே எமது நாட்டிற்குப் பொருந்துமோ என்ற சந்தேகம் எனக்கு ஏற்பட்டிருக்கிறது.

நமது நாட்டின் சுபிட்சத்திற்கு எமக்குப் பல நல்ல வழிகள் இருக்கின்றன. நம் நாட்டின் சுபிட்சத்திற்காக நாம் அரும்பாடு பட வேண்டும். கஷ்டப்பட வேண்டும். பங்கீட்டு அரிசியில் ஒரு கொத்தை வெட்டி விட்டார்கள் என்று அழுவதில் புண்ணியம் இல்லை. நாம் உண்மையில் அரிசியைக் கூடுதலாக உண்பவர்கள்தான். ஒவ்வொருவரும் தினசரி நாலு கோப்பை சோறுகூடச் சாப்பிடுவோம். ஆகவேதான் எமக்கு அரிசியைப் பற்றிக் கவலை அதிகம். நாம் நாலு கோப்பை சோற்றுக்குப் பதிலாக இரண்டு கோப்பை சோறு சாப்பிட்டால் சாக மாட்டோம். உண்மையில் உயிருடன்தான் இருப்போம். நான் யப்பான் தேசத்திற்குச் சென்றபொழுது அங்கு சோற்றைக் குறைத்து மாக்கறியைத்தான் அதிகமாக எனக்குக் கொடுத்தார்கள் அந்த நாட்டு மக்கள். நான் நல்ல ஆரோக்கியத்துடன்தான் திரும்பி வந்தேன். எதுவித கெடுதலும் எனக்கு நேரவில்லை. எனவே அரிசியைக் குறித்து மட்டும் நாம் ஏன் அழ வேண்டும். இந்த நாட்டில் மர வள்ளி, வத்தாளை, சக்கரை வள்ளிக் கிழங்கு வகைகள் ஏராளம். அரிசியை விட அதிக சத்து இந்தக் கிழங்கு வகைகளில் ஜாஸ்தியாக இருக்கிறது. ஆண்டவன் அருளால் இந்த நாட்டில் வேறு எந்த நாட்டிலும்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අන්නාමලෙයි මයා.]

இல்லாத முறையில் பலாக்காய் இருக்கிறது. இதே போல சோலை சோலையாகத் தென்னைகளும் எமது நாட்டில் ஏராளம். இயற்கையாக நமக்குச் செல்வம் இருக்கிறது. நமது நாடு வளத்தில் எந்த விதத்திலும் சோடையாக இல்லை. ஆனால் நாம்தான் சோம்பேறிகளாக இருக்கிறோம். ஒரு பலாக்கொட்டையை வீசினால் அது நமது நாட்டில் இயற்கையாகவே வளரும். எவரும் அதற்குத் தண்ணீர் ஊற்றுவதோ களை பிடுங்குவதோ இல்லை. தெங்கும் அப்படித்தான். வருணபகவான் தினமும் மழைபொழிவதால் ஒருவித செலவுமின்றி பல வித உணவுப் பொருட்களையும் பெறும் வாய்ப்பு எமக்கு நிறைய இருக்கிறது. இவைகளை நாம் சீர்தூக்கிப் பார்க்க வேண்டும்.

அண்மையில் நான் காணி அமைச்சர் அவர்களுடன் பேசிக் கொண்டிருந்தபொழுது கரும்புப் பயிர்ச் செய்கை பற்றி ஆராய அவர் கோயம்புத்தூருக்குப் போவதுபற்றிக் குறிப்பிட்டார். அப்பொழுது நான் அவருக்கு கூறினேன், நீங்களும் அங்கு போங்கள் உங்களுடன் பத்துக் கிராமவாசிகளையும் அழைத்துக் கொண்டு போங்கள் என்று. கோயம்புத்தூர் ஏதோ வெகு தூரத்தில் இல்லை. எமது நாட்டிலிருந்து சுமார் ஐநூறு மைல்களுக்குள்ளாகத்தான் இருக்கிறது. அதற்காகப் பெரிய செலவு வந்துவிடப் போவதில்லை. பெரிய பெரிய அதிகாரிகளையெல்லாம் கூட்டிக் கொண்டு போகாதீர்கள். கிராமங்களிலேயிருக்கின்ற விவசாயிகளில் பத்து அல்லது பன்னிரண்டு பேரைக் கூட்டிக்கொண்டுபோய் இந்தக் கரும்புச் செய்கையைப் பார்த்துவிட்டு வாருங்கள் என்று சொன்னேன். அங்கு முன்பு வயல்களாக இருந்த இடங்களெல்லாம், நெல் விளைந்த இடங்களெல்லாம் இன்று கரும்பு விளைகின்ற தோப்புக்களாக இருக்கின்றன. இன்று சீனி அதிகமாக ஏற்றுமதிசெய்யக்கூடிய நாடு இந்தியா என்று சொல்லுகிறார்கள். நான் கேள்விப்பட்டதைத்தான் சொல்லுகின்றேன். அது சரியோ பிழையோ எனக்குத் தெரியாது. அப்படியெல்லாம் நிலைமை மாறிக் கொண்டிருக்கிறது.

நாம் என்ன செய்கின்றோமென்றால் சீனியை வெளிநாட்டிலிருந்து இறக்குமதி செய்து கொண்டிருக்கிறோம். வரியை வேறு போடுகிறோம். இப்படியெல்லாம் செய்துவிட்டு ஏழை மக்களின் வாழ்க்கைச் செலவு அதிகரித்துவிட்டது என்று கத்துவதில் என்ன பிரயோசனம். வாங்கித்தின்கின்ற அந்தப் புத்திதான் நமக்கு வருகின்றதேயொழிய ஏன் நாங்கள் கரும்பை உற்பத்திசெய்யக் கூடாது? நன்றாகச் செய்யலாம். இன்று கந்தளாயில் 50,000 ஏக்கர் கரும்பு பயிரிட்டிருக்கிறோம் என்று சொல்லுகிறார்கள். இந்த மாதிரியாக அரசாங்கம் பெரிய திட்டங்களையெல்லாம் போட்டுக்கொண்டு போகக்கூடாது. சாதாரண கிராம வாசிகளுக்கும் சந்தர்ப்பத்தைக் கொடுக்க வேண்டும். நாலு ஏக்கர் அல்லது ஐந்து ஏக்கர் கரும்பை விளைவித்து அவர்களே அதை உற்பத்திசெய்கின்ற நேரத்தில், அரசாங்கம் பச்சைக் கொழுந்தாகத் தேயிலையை வாங்குவது போலவும் ரப்பரை வாங்குவது போலவும் அந்தக் கரும்பை வாங்கி கந்தளாய்த் தொழிற்சாலையிலே கொண்டுபோய் அரைத்து என்ன வேண்டுமானாலும் செய்யலாம். அவர்கள் சீனியைக் காய்ச்சட்டும், அல்லது சாராயத்தைக் காய்ச்சட்டும், அல்லது ஜின்னைக் காய்ச்சட்டும். எதை வேண்டுமென்றாலும் செய்யட்டும். ஏழை விவசாயிகளுக்கு—அந்தப் பகுதிகளிலே—இருக்கக்கூடிய கிராமவாசிகளுக்குச் சந்தர்ப்பத்தைக் கொடுக்க வேண்டும். இன்று நாம் அறிந்த அளவிலே ஒரு ஏக்கர் கரும்பு நடுவதன்மூலம் 5,000 ரூபாய் வரை ஆதாயம் வருகின்றதாம். அப்படியாக 5,000 ரூபா ஒரு கிராமவாசிக்குப் போகக்கூடிய வாய்ப்பை நாம் இலங்கையிலே செய்து கொடுப்போமானால், அவர்கள் நிச்சயமாக எந்த அரசாங்கம் ஆட்சிக்கு வந்தாலும் அவ்வுதவியைச் செய்கின்ற அரசாங்கத்துக்கு, பரம்பரையாகத் தங்கள் உதவியைக் கொடுக்க மறக்கமாட்டார்கள் என்பது எனக்குத் தெரியும். நம்முடைய எதிர்காலத்திட்டங்களைப் பற்றி நாம் விரிவாக யோசிக்க வேண்டும். பெரிய திட்டங்களை நடாத்துவதற்கு யோசிக்காமல் சிறிய திட்டங்களைச் செய்ய யோசிக்க வேண்டும். சிறிய திட்டங்களின் மூலம் பெருந்திரளான மக்களுக்கு வேலைவாய்ப்பைக் கொடுக்க வேண்டும்.

இன்று நாட்டிலே வேலைவாய்ப்புக்கள் மிகவும் அதிக அளவில் குறைந்துகொண்டே போகின்றது. படித்த வாலிபர்களுக்கு வேலை வாய்ப்புக்கள் அளிக்க முடியாமல் இருக்கிறது. சுமார் 36,000 பேருக்கு ஒரு வருடத்திலே வேலைகொடுத்து விட்டோமென்று

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

சொன்னால் அதைப்பற்றி எந்த அரசாங்கமும் பெருமைப்படுத்திப் பேசுவதால் கொஞ்சங்கூட அர்த்தமில்லையென்றுதான் நான் சொல்லுவேன். இன்று பள்ளிக்கூடங்களிலே பல இலட்சம் மாணவ, மாணவிகள் படித்து வெளியேறிக்கொண்டிருக்கிறார்கள். அவர்கள் படித்து வெளியே வருகின்ற நேரத்திலே அவர்களுக்கு உத்தியோகம் இல்லாமலிருக்கப்போகின்றதேயென்று தெரிந்துகொண்டால், உப சபாநாயகரவர்களே, ஏன் அவர்கள் படிக்க வேண்டும்? ஏன் பள்ளிக்கூடங்களுக்குப் போய் அவர்கள் கஷ்டப்பட வேண்டும் என்று தான் யோசிக்க வேண்டியிருக்கிறது. ஆகவே, எந்த அரசாங்கமாகவிருந்தாலும் சரி—படித்துப் பள்ளிக்கூடங்களிலிருந்து வெளியேறிவருகின்ற பிள்ளைகளுக்கு, சாதாரண படிப்புப் படித்து வந்தாலும் சரி அல்லது பட்டதாரித் தேர்ச்சிபெற்று வந்தாலும் சரி—உரிய வழி வகுக்க வேண்டியது அந்த அந்த அரசாங்கத்தின் தலையாய கடமையாகும். அது மிக முக்கியமான ஒரு பிரச்சினையாக இன்று இருக்கின்றது. ஜனப் பெருக்கத்தை உற்பத்திசெய்கின்ற மாதிரி பட்டதாரிகளைக் கூடுதலாக உற்பத்தி செய்து கொண்டுபோனால், எந்த அரசாங்கத்திற்கென்றாலும் அவர்கள் தங்களுடைய அன்பை, ஆதரவை அவர்கள் தெரிவிக்க மாட்டார்கள்.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

உங்களுக்கு இன்னும் மூன்று நிமிடங்கள் தான் இருக்கின்றன.

අන්නාමලෙයි මයා.
(திரு. அண்ணாமலை)
(Mr. Annamalay)

மிகவும் நன்றி உப சபாநாயகரவர்களே. நான் அதிக நேரம் எடுக்கவில்லை. இன்னுமொரு முக்கிய விடயத்தைப் பற்றிக் குறிப்பிட்டு எனது பேச்சை முடிக்கின்றேன். அதாவது பிறப்புப் பதிவு விடயம்.

அதாவது தமிழர்கள் குறிப்பாக இந்திய வம்சாவழியினர், அவர்கள் இந்நாட்டுப்பிரசைகளாக வந்தபின்னரும் கூட அவர்களுடைய பிள்ளைகளின் பெயர்களைப் பதிவு செய்யப் போனால், அங்கே "இந்தியா வாசி" என்று போடுகிறார்கள். ஆங்கிலத்திலே "Race" என்று ஒரு கலம் இருக்கிறது. அந்தக் கலத்திலே "இந்தியா வாசி" என்று போடுகிறார்கள். அந்த "Race" என்ற வார்த்தையை எடுத்துவிட்டு "Nationality" என்ற வார்த்தையை இட்டால் மிக நன்றாக இருக்கும் என்று நான் நினைக்கின்றேன். அந்தக் காலத்திலே கொலோனியல் ஆட்சியிலேயிருந்த முறைதான் அது. அந்த அரசாங்கம் நடாத்தப்படுகின்ற வேளையிலே அவ்வாறு நமக்குத் தேவையில்லாத ஒன்றை அவர்கள் வைத்திருக்கின்றார்கள். அந்த நிலையை இன்றைக்கு நாம் வைத்துக் கட்டியடித்துக்கொண்டிருக்க வேண்டியிருக்கிறது. ஆகவே அவர்களுடன் அது தொலைந்து போகட்டும் என்று நாம் நினைத்து இதை மாற்றி அமைக்க வேண்டும். இன்றைக்கு பிரசைகளாக இருக்கின்றவர்கள்—அவர்கள் வம்சாவளியினராகவோ அல்லது பதிவுப் பிரசைகளாகவோ இருக்கலாம்—இந்நாட்டு பிரசைகளாக இருக்கின்றவர்கள் தமது குழந்தைகளைப் பதியச் செல்கின்ற நேரத்திலே இந்தியர் என்று குறிப்பிட விரும்பமாட்டார்கள். இந்த நாட்டு பிரஜைகள் என்ற விசுவாசத்தோடு, இந்த நாட்டு விஷயங்களில் பங்கெடுத்து, இந்த நாட்டுக்காக உழைத்து, இந்த நாட்டு மண்ணிலேயே மடியும் அவர்களுக்கு ஏன் இப்படி எழுத வேண்டுமென்பது எனக்குத் தெரியவில்லை. உப சபாநாயகர் அவர்களே, இதை உங்கள் ஞாபகத்துக்குக் கொண்டு வருகிறேன். இந்தப் பாகுபாட்டை நீக்கி, கூடிய சீக்கிரத்தில் இந்த நாட்டுப் பிரஜைகளுக்கெல்லாம் இந்த நாட்டுப் பிரஜைகள் என்று குறிக்கக்கூடிய முறை பதிவுப் புத்தகங்களிலே இடம் பெற வேண்டுமென்று கேட்டுக் கொண்டு, எனக்குப் பேசச் சந்தர்ப்பம் கொடுத்தற்காக நன்றியைத் தெரிவித்து எனது பேச்சை நிறுத்திக் கொள்கிறேன்.

* * * * *

[ඉතිරි වැඩ කටයුතු 1968 අගෝස්තු 11 වන ඉරිදා නිල වාර්තාවෙන් බලාගත යුතුයි.]

(நிகழ்ச்சித் தொடர்ச்சியை 1968 ஓகஸ்ட் 11 ம் ஞாயிற்றுக்கிழமை அதிகார அறிக்கையின் பார்க்க.)

[For continuation of Proceedings, see OFFICIAL REPORT *for Sunday, 11th August 1968.]*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org